# ප්‍රවාද

3 වන කලාපය

1992 දෙසැම්බර්

මිල රුපියල් දහයයි.

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කරන ලදී.

ද්වි මාසික සඟරාව

## විපක්ෂය විපක්ෂ කාටද? පිටුව 03

## පක්ෂ දේශපාලනයේ නව ප්‍රවණතා
නිව්ටන් ගුණසිංහ ____ පිටුව 06

## දේශපාලනය හා භූතියම්
ජයදේව උයන්ගොඩ ____ පිටුව 11

## නැගෙණහිර ජර්මනියේ නැගීම හා වැටීම
හාන්ස් ජ් බායර් ____ පිටුව 12

## පශ්චාත් යටත් විජිත සාහිත්‍යය
රංජිත් පෙරේරා ____ පිටුව 17

## කලාව අදහන අයට
දිප්ති කුමාර ගුණරත්න ගෙන් ____ පිටුව 23

## අර්ජුන පරාක්‍රම ගෙන් සුචරිත ගම්ලත්ට පිළිතුරක් පිටුව 25

## වසන්ත ගේ වම ගැන විශ්ලේෂණය
නිර්මාල් රංජිත් ____ පිටුව 26

# ප්‍රවාද

ද්වි මාසික සඟරාව

පුවත් පතක් ලෙස ලියාපදිංචි කරන ලදී.
1 වන වෙළුම 3 වන කලාපය 1992 දෙසැම්බර්
වාර්ෂික දායකත්වය රුපියල් 55.00 යි.
මිල රුපියල් 10.00 යි.

සංස්කරණය :
චාල්ස් අබේසේකර
ආචාර්ය ජයදේව උයන්ගොඩ
නිර්මාල් රංජිත් දේවසිරි

ප්‍රකාශනය :
ප්‍රවාද ප්‍රකාශන
129/6 ඒ, හැවලොක් පාර,
කොළඹ 05.
දුරකථනය : 01-501339

## සංස්කාරක සටහන

ලංකාවේ වර්තමාන දේශපාලන ක්‍රියාවලියේ දැඩි ව්‍යාකූලත්වයක් දක්නට ලැබේ. අසූවේ දශකයේදී පැනනැගී ප්‍රචණ්ඩත්වය, සිවිල් යුද්ධ සහ දේශපාලන අර්බුදයන් විසින්, මෙරට සාම්ප්‍රදායික දේශපාලන ආයතන තල්ලු කරනු ලැබ තිබෙන්නේ ද පෙර නොවූ විරූ අර්බුදයකට ය. දේශපාලන පක්ෂ සෑම එකක්ම පාහේ මේ අර්බුදයේ ගොදුරු මෙන්ම ප්‍රකාශනයන් ද බවට පත්ව ඇත.

මෙම ප්‍රවාද කලාපයෙන් විශේෂ විමසුමකට ලක් කරන්නේ ලංකාවේ පක්ෂ ක්‍රමය පොදුවේත් සහ විරුද්ධ පක්ෂ විශේෂයෙනුත් ය. විරුද්ධ පක්ෂ දේශපාලනය අපේ විශේෂ අවධානයට ලක්වන්නේත්, විවේචනයට භාජනය වන්නේත්, එක් ප්‍රධාන මූලධාර්මික හේතුවක් නිසා ය. විරුද්ධ පක්ෂවල දේශපාලනය සමග එකඟවීම හෝ නොවීම යන ප්‍රශ්නය තිබියේදී පවා අප මතු කරන කරුණ නම් ප්‍රජාතන්ත්‍රවාදී සහ ශක්තිමත් විපක්ෂයක් තිබීම, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලිය නොනැසී පැවැතීමේ අත්‍යවශ්‍ය සාධකයක් ය යන්නයි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ආයතන සහ භාවිතයන්ට, නිෂේධාත්මක බලපෑම් ඇතිකෙරෙන්නේ ආණ්ඩුබලය හිමි පක්ෂ වලින් පමණක් නොවේ. දේශපාලන වශයෙන් ස්වයං--පරිහාණිය කරා එළඹ සිටින විරුද්ධ පක්ෂ වලින්ද කෙරෙන්නේ එම නිෂේධාත්මක ක්‍රියාවලීන්ට එකතු කිරීමය. මෙරට ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියේ පරිහානිලක්ෂණ ද මේ සමගම විද්‍යමාන වේ. ලිපි කිහිපයක් මගින් මේ ක්‍රියාදාමයන්ගේ සමහර පැති පරීක්ෂා කෙරේ.

සමාජවාදී කඳවුරේ බිඳවැටීම පිළිබඳව අප ඇරඹූ සාකච්ඡා මාලාව මෙම කලාපයේ තවදුරටත් සිදුවේ. මෙවර විමසුමට ලක් වන්නේ නැගෙනහිර ජර්මනියේ බිඳවැටීමයි.

කලාව, සාහිත්‍යය හා සංස්කෘතිය පිළිබඳව, සංකල්පමය ප්‍රවේශයන්ගෙන් කෙරෙන සංවාදය, මෙම **ප්‍රවාද** කලාපය තවත් ඉදිරියට ගෙන යයි.

සංස්කාරකවරු

නොවැලැක්විය හැකි අපහසුතා හේතුවෙන් මෙම කලාපය නිකුත් වීම ප්‍රමාද වීම පිළිබඳව අපගේ පාඨකයින්ට සණුගාටුව ප්‍රකාශ කරමු.

සටහන්

# විපක්ෂය විපක්ෂ කාටද?

**විරුද්ධ පක්ෂවල දේශපාලන අර්බුදය ගැන අපේ අදහස් දක්වන්නේ කිසිදු දේශපාලන පක්ෂයකට ආවැඩීමට හෝ පහර ගැසීමට අපට ඇති වුවමනාවක් නිසා නොවේ. විරුද්ධ පක්ෂ අර්බුදය විසින් ජනිත කරවනු ලබන ප්‍රතිශේධාත්මක දේශපාලන ප්‍රතිඵල ගැන අප සැලකිලිමත් වන**

ලංකාවේ විරුද්ධ පක්ෂය බරපතල අර්බුදයක පවතින්නේය යන්න අද ඉතා පැහැදිලි සත්‍යයක් වී තිබේ. ශ්‍රී. ල. නි. පය ප්‍රධාන විරුද්ධ පක්ෂ වලට හිතවත් පුවත්පත් වලින් පවා දැනට ඉදිරිපත් වන මතයක් නම්, නුදුරු අනාගතයේදී පැවැත්විය හැකි මැතිවරණ වලදී ප්‍රේමදාස ආණ්ඩුව පරාජය කිරීමට විරුද්ධ පක්ෂවලට ශක්තියක් නැත යන්නයි. සංවිධානාත්මක වශයෙන් දුර්වල, ශක්තිමත් නායකත්වයක් නැති සහ සමගියක් නැති විරුද්ධ පාර්ශවයක් පැවතීම, ඕනෑම ආණ්ඩු පක්ෂයක් සතු විය හැකි ඉතා වටිනා සම්පතක් වෙයි. මේ අතින් බලනවිට, ප්‍රේමදාස මහතා නායකත්වය දෙන එ.ජා.ප.ය වාසනාවන්ත ආණ්ඩු පක්ෂයකි. ඊළඟ මැතිවරණ වලින් එ.ජා.පය ජයග්‍රහණය කරනු ඇත්තේ එ.ජා.ප යේ විශේෂ ජනප්‍රියභාවයක් නිසාම නොවේ. විරුද්ධ පක්ෂවල දුර්වල කම් හේතු කොට ගෙනයි.

ලංකාවේ විරුද්ධ පක්ෂවල දේශපාලන අර්බුදය ගැන අපේ අදහස් දක්වන්නේ, කිසිදු දේශපාලන පක්ෂයකට ආ වැඩීමට හෝ පහර ගැසීමට අපට ඇති උවමනාවක් නිසා නොවේ. විරුද්ධ පක්ෂ අර්බුදය විසින් ජනිත කරවනු ලබන ප්‍රතිශේධාත්මක දේශපාලන ප්‍රතිඵල ගැන අප සැලකිලිමත් වන නිසාය. ලංකාවේ රාජ්‍යය ප්‍රජාතන්ත්‍රවාදී කිරීමේ ක්‍රියාවලියක් තුළ මෙන්ම, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ දැනට පවතින භාවිතයන් හා ව්‍යුහයන් ආරක්ෂාකර පවත්වා ගැනීමේ ක්‍රියාවලියක් තුළද, විරුද්ධ පක්ෂ දේශපාලනය විසින් ඉටුකරනු ලැබිය යුත්තේ තීරණාත්මක වැඩ කොටසකි. අප රටේ විරුද්ධ පක්ෂ දේශපාලනය බංකොලොත්වීම, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සමස්ත ගැටළුවම වඩාත් සංකීර්ණත්වයට පත්වීමට දැනටමත් හේතු වී තිබේ. අපට මෙහිදී වැදගත් වන්නේ, කවර පක්ෂයක් හෝ පක්ෂ සමූහයක්, විරුද්ධ පක්ෂයේ සිටින්නේද යන්න නොවේ, "විරුද්ධ පක්ෂය" නම් වූ ප්‍රජාතාන්ත්‍රික ආයතනයයි.

විරුද්ධ පක්ෂයේ දේශපාලන අධඃපතනවීම, සැහෙන දුරකට, ප්‍රධාන විරුද්ධ පක්ෂය වන ශ්‍රී. ල. නි. පයේ අභ්‍යන්තර අර්බුදයේම ව්‍යාප්තියකි. මතුපිටින් ප්‍රකාශවන පරිදි ශ්‍රී. ල. නි. පයේ අභ්‍යන්තර ආරාවුල, බණ්ඩාරනායක පවුලේ මව-පුතා-දුව යන ත්‍රිකෝණය තුළ ඇති වන්නකි. බණ්ඩාරනායක මහත්මියගෙන් පසු පක්ෂ නායකත්වය හිමි විය යුතු වන්නේ ඇගේ පුතාටද, දුවටද යන්න තීරණය කිරීමට නොහැකි වීම බැලූ බැල්මට හාස්‍යෝත්පාදක කරුණකි. එමෙන්ම එය ශ්‍රී. ල. නි. පයට විරුද්ධව ඉදිරිපත් වන ස්වයං-චෝදනා පත්‍රයක්ද වෙයි. නූතන දේශපාලන ආයතනයක් හැටියට ශ්‍රී. ල. නි. පය කොතරම් පරිහාණියට පත්වී ඇත්දයත්, පක්ෂ නායකත්වය එක පවුලක හිරවී තිබෙනවා පමණක් නොවේ. එම පවුලෙන් පිට නායකත්වයක් සොයා ගැනීමට පක්ෂයට හැකියාවක්ද නැත. මෙය ඉන්දියාවේ කොංග්‍රස් පක්ෂයේ පරිහාණියට ඉතා සමාන වූවකි. ඇත්තටම කොංග්‍රසයේ නායකත්වය නේරු-ගාන්ධි පවුලෙන් පිටතට ගියේ, එම පවුලේ වැඩිහිටි සියලු දෙනාම මියයාමෙන් පසුවය. ලංකාවේ නම් බොහෝ විට සිදුවීමට ඉඩකඩ ඇත්තේ බණ්ඩාරනායක පවුලේ වැඩිහිටි සාමාජිකයින් ජීවත්ව සිටියදීම, එම පක්ෂය දේශපාලන අභාවය කරා වේගයෙන් ඇදීයාමයි.

ශ්‍රී. ල. නි. පයේ අද පවතින අර්බුදය 1977 මහා පරාජයෙන් පසුව ඇති වූවකැයි බොහෝ දෙනා දරණ මතයකි. ඇත්තටම ශ්‍රී. ල. නි. පයේ පරිහාණි ක්‍රියාදාමය පටන් ගත්තේ එම පරාජය සමඟ නොව, 1970 මහා ජයග්‍රහණයද සමඟය. ප්‍රධාන වාමාංශික පක්ෂ දෙකේද සහයෝගය ඇතිව, "සමාජවාදය" යනුවෙන් ශ්‍රී. ල. නි. පය දියත් කළ වැඩ පිළිවෙල, ඒ වනවිට එම පක්ෂයට තිබුණු ධනපතිපන්ති හා ජනතා පදනම් දෙදරායෑමට හේතුවිය. "සමාජවාදය" යන ඉතා ලිහිල් පදයෙන් හැඳින්වුණු රාජ්‍යවාදී ධනවාදය (Statist capitalism) නිසා ශ්‍රී. ල. නි. පයට සිදුවූයේ එහි ධනේශ්වර පන්ති පදනම් සහ සහයෝගය සැහෙන දුරකට අහිමිවීමයි. ලංකාවේ ධනවාදය 1977 න් පසු සැහෙන ව්‍යුහාත්මක වෙනස්වීමකට භාජනය වී ඇති නමුත්, පැරණි ජනතාවාදී "සමාජවාදය" තුළ තවමත් හිරවී සිටින ශ්‍රී. ල. නි. පයේ "ප්‍රගතිශීලී" යැයි හැඳින්වෙන පාර්ශ්වය දෙස ධනපති පන්තිය බලන්නේ බලවත් සැකයෙනි. ඇත්තටම ශ්‍රී. ල. නි. පයේ ධනවාදය ගැළපෙන්නේ 1975 ට පෙර පැවති ලාංකික ධනපති පන්ති කොටස් වලට විනා වර්තමාන ධනපති ස්ථරයන්ට නම් නොවේ. මේ අනුව ශ්‍රී. ල. නි. පය යනු පන්තිමය වශයෙන් නවීකරණය නොවූ, ලංකාවේ ධනවාදයේ අතීතය නියෝජනය කරන, ආචීර්ණ කල්පික ධනවාදී පක්ෂයකි.

1970 දක්වා ශ්‍රී. ල. නි. පයේ මැතිවරණ හා දේශපාලන ශක්තියේ එක් වැදගත් පදනමක් වූයේ ඒ වෙත තිබූ තරුණ සහයෝගය යි. පණස් ගණන් සහ හැට ගණන්වලදී තරුණ සමාජය දේශපාලන වශයෙන් ඇදීගියේ ශ්‍රී. ල. නි. පයට සහ වමේ පක්ෂ වලටයි. එහෙත් 1971 කැරැල්ල වෙතින් මේ ප්‍රවණතාවය තීරණාත්මක ලෙස වෙනස් කරනු ලැබිණ. තරුණ සමාජය වෙතින් කිසිදු ශ්‍රී.ල.නි.ප වාදී දේශපාලන රැල්ලක් 1971 න් පසු

මතු නොවූවාක් මෙන්ම තරුණ සමාජයට ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී. ල. නි. පයට කිසිදු හැකියාවක් ඉන් පසුව ලැබුණේ ද නැත. තරුණ සමාජයට ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී. ල. නි. පයට ඇත්තේ "බණ්ඩාරනායක දර්ශනය" නමැති අවිනිශ්චිත මතවාදය පමණි. ලංකාවේ අද සිටින ඡන්දදායකයින්ගෙන් බහුතරය 1960 න් පසු ඉපදුණු "බණ්ඩාරනායක දර්ශනය" වෙත කිසිදු ආකර්ෂණයක් නොදක්වන පරම්පරා දෙකකින් සමන්විත වන බව සැළකිල්ලට ගත් විට පෙනෙන කරුණක් නම් ශ්‍රී. ල. නි. පයේ පවතින මතවාදී ආවිර්ණකල්පිත බව හා නවීකරණය නොවීමට දක්වන දැඩි අකැමැත්තයි. මේ අතර 1970-77 වකවානුව තුළ බලයේ සිටියදී ශ්‍රී. ල. නි. ප. ය තරුණ සමාජයෙන් තීරණාත්මක ලෙස ඈත් වූයේ ජනතා විමුක්ති පෙරමුණේ දෙවැනි නැගීමද සමගය. 1977 මැතිවරණයේදී තරුණ පරපුරෙන් විශාල කොටසක් එ. ජා. පයට ගිය බවද, 1977 න් පසු එම කොටස් ජ. වි. පෙ. වෙත ඇදීගිය බවද මෙහිදී සටහන් කළ යුතුය.

1970-77 කාලයේදී ශ්‍රී. ල. නි. පයේ පිරිහීමේ තවත් වැදගත් සාධකයක් වූයේ, දේශපාලන පක්ෂයක් හැටියට එය ගරා වැටීමට පටන් ගැනීමයි. බණ්ඩාරනායක මහත්මිය අගමැතිව සිටියදී, ඇගේ කිට්ටු ඥාතීහු පක්ෂය තුළ ද ප්‍රධාන බල කේන්ද්‍රය බවට පත්වූහ. 1952 දී බණ්ඩාරනායක මහතා ශ්‍රී. ල. නි. ප ය පිහිටු වූයේ, එහි නායකත්වය තුළ උඩරට-පහතරට මෙන්ම විවිධ කුල වලට ද අයත් දේශපාලන නායකයින් පක්ෂ ධුරාවලියට සම්බන්ධ කර ගනිමිනි. එහෙත් බණ්ඩාරනායක මහත්මිය යටතේ පක්ෂයේ නායකත්ව ධුරාවලිය තුළ තිබුණු එම සමාජමය වශයෙන් වූ නියෝජනාත්මක ප්‍රජාතන්ත්‍රවාදය බිඳීගියේය. "ශ්‍රී. ල. නි. ප රදළ වලව් පක්ෂයකැ"යි ප්‍රේමදාස සහ ඔසී අබේගුණසේකර යන මහත්වරුන් කරන විවේචනයට පදනම් වන්නේද ශ්‍රී. ල. නි. පයේ ඇති මේ ලක්ෂණය යි. ශ්‍රී. ල. නි. පය සමාජමය වශයෙන් එසේ පිරිහෙද්දී, සාම්ප්‍රදායිකව සිංහල සමාජයේ ප්‍රභූතන්ත්‍රයේ ඒකාධිකාරයට හසුව තිබූ එ. ජා. ප. නායකත්වයේ සමාජමය සංයුතිය 1970 ගණන්වලට පටන් වෙනස්වීම් ද අපේ සැළකිල්ලට හසුවිය යුතු කරුණකි. තමන් "පොදු ජන පක්ෂයක්ය" යන ශ්‍රී. ල. නි. පයේ මතවාදීමය ප්‍රතිරූපයත්, එහි කුලීන-ප්‍රභූ නායකත්වයත් අතර ඇති ප්‍රතිවිරෝධය සුළුපටු එකක් නොවේ. ඇත්තටම, ශ්‍රී. ල. නි. ප යේ අද ඇති ප්‍රධාන ප්‍රශ්නයක් නම් ලංකාවේ සමාජ ව්‍යුහයේ පසුගිය අවුරුදු විස්සක පමණ කාලය තුළ ඇතිවූ විපර්යාසයන්ට බෙහෙවින් පිටුපසින් එම පක්ෂයත්, එහි නායකත්වයත් තවමත් ඇදී ඒමයි.

ජයග්‍රහණයේ සිටි කාලය තුළදී ශ්‍රී. ල. නි. පයේ පරිහාණියට තුඩුදුන් අනෙක් සාධකය නම් එහි අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුණේ නම් එයද ගිලිහී යාමයි. බණ්ඩාරනායක මහත්මිය අගමැතිව සිටිය දී, ජයවර්ධන සහ ප්‍රේමදාස මහතා

> **ජයග්‍රහණයේ සිටි කාලය තුළ ශ්‍රී.ල.නි.පයේ පරිහානියට තුඩුදුන් අනෙක් සාධකය නම් එහි අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුනේ නම් එය ගිලිහී යැමයි.....**
>
> **ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් සුබුදු කිරීමට ශ්‍රී.එ.ජා.පෙ මුලදී සමත් වූවද ඔවුන් සෙකලේ ඉතා කෙටි කලකින්ම ජනයා දේශපාලන අපේක්ෂා භංගත්වයට ඇද දැමීමයි.**

බලයේ සිටින කාලයේදී සිදුවූවාක් මෙන්ම, පක්ෂ නායකත්වය නිරවශේෂයෙන්ම අධිකාරවාදී තත්වයට පත්විය. සාමාන්‍යයෙන් ආණ්ඩුබලය ලබාගන්නා පක්ෂ මෙම ඉරණමට පත්වීම, බලය පිළිබඳ දේශපාලන සංස්කෘතියේ ඇති පොදු ලක්ෂණයකි. එහෙත් ශ්‍රී. ල. නි. පය සහ එ. ජා. පය අතර මෙහිදී වැදගත් වෙනසක් දැකිය හැකිය. එ. ජා. පය මැතිවරණ පරාජයන්ගෙන් පසු පක්ෂය ප්‍රතිසංවිධානය කරන නමුත් (1956 හා 1970 පරාජයන්ගෙන් පසු සිදු කළේ එයයි) ශ්‍රී. ල. නි. පය එවැනි ප්‍රවණතාවයක් දක්වා නැත. 1977, 82-83 හා 88-89 යන මැතිවරණ වලින් පරාජය වූ ශ්‍රී. ල. නි. පය, අභ්‍යන්තර ප්‍රතිසංවිධානයක් සඳහා කිසිදු සූදානමක් දැක්වූයේ දැක්වූයේ නැත. ඒ සඳහා පක්ෂය තල්ලු කිරීමට සමත් දෙවෙනි හා තුන්වැනි පෙළේ නායකත්වයක්ද ශ්‍රී.ල.නි.පයට නැත. නායකත්වයේ අධිකාරවාදය ඒ තරමට බල සම්පන්නය. පසුගිය අවුරුදු පහළොව තුළ ශ්‍රී. ල. නි. පය අතහැර ගිය බොහෝ දක්ෂ තරුණ නායකයින් - විජය කුමාරතුංග හා ආරිය බුලේගොඩ මේ සඳහා ප්‍රධාන උදාහරණයන්ය - රඳවා ගැනීමට නායකත්වයට නොහැකි වීම, එම පක්ෂයේ පරිහාණියට හේතුවක් නොව හුදෙක් පරිහාණියේම ප්‍රතිඵලයක්ය.

මෙහිදී ඉන්දිරා සහ රජිව් ගාන්ධිලාගේ නායකත්වයෙන් සිටු ඉන්දියානු කොංග්‍රසයත්, බණ්ඩාරනායක මහත්මියගේ නායකත්වයෙන් යුතු ශ්‍රී. ල. නි. පයත් අතර තිබෙනා සාම්‍යතාවය දැකිය හැකිය. ඉන්දියාවේ නූතන දේශපාලනය ගැන විග්‍රහ කර ඇති බොහෝ ධනේශ්වර දේශපාලන විද්‍යාඥයින් නිරීක්ෂණය කර ඇති වැදගත් කරුණක් නම්, ඉන්දිරාගේ සහ රජිව්ගේ අධිකාරවාදී සහ රාජවංශික (dynastic) නායකත්වය යටතේ පක්ෂයේ දෙවෙන පෙළේ නායකත්වය උවමනාවෙන්ම විනාශකරන ලද බවයි. තමන්ට පුද්ගලික වශයෙන් පුවච සහ කීකරු නොවන, ස්වාධීන දේශපාලන පදනම් සහිත දෙවැනි පෙළේ ජ්‍යෙෂ්ඨ නායකයින් බැහැර කිරීමට ඔවුහු නිතරම වගබලා ගත්හ. එවැන්නන් තමන්ගේ රාජවංශික ආධිපත්‍යයට තර්ජනයක් වෙතැයි ඔවුහු නිතර සිතූහ. (ඉන්දිරාගේ මරණයෙන් දෙසතියකට පසු, කොංග්‍රසයේ (ඉන්දිරා) ජ්‍යෙෂ්ඨතම නායකයා වූ බටහිර බෙංගාලයේ ප්‍රණාබ් මුඛර්ජී රජිව් විසින් ඉවත් කරනු ලැබීම මීට ඇති හොඳම මෑතකාලීන උදාහරණයකි. ජ්‍යෙෂ්ඨත්ව සම්ප්‍රදාය අනුව අගමැති ධූරය යායුතු වූයේ මුඛර්ජීටය. රජිව් අතින් මුඛර්ජී "කැපීම" පිළිබඳව ඇති සිත්කාවදින කරුණ නම්, ඔහු ජ්‍යෙෂ්ඨත්වයට පැමිණියේ ඉන්දිරා විසින් කොංග්‍රස් පක්ෂයේ අනෙක් ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් "කපනු" ලැබීම නිසා ය. ඔහු ප්‍රසිද්ධව සිටියේ ඉන්දිරාගේ "හෙංචයියකු" ලෙසය) මේ පිළිවෙත අනුව පක්ෂ නායකත්වය සහ එහි දෙවැනි පෙළ අතර විශාල පරතරයක් තිබේ ඒ අතර දෙවැනි

පෙළේ රැදිය හැක්කේ දක්‍ෂයින්ට නොව හොංචයියන් සහ වාවුකාරයන් ලෙස හැඳින්විය හැකි කොටස් වලටයි. එහි ප්‍රතිඵලය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් වශයෙන් පක්‍ෂය අඩපණ වීමයි. එ. ජා. ප. යට පවා මේ ඉරණම අත්වීම වැළැක්විය නොහැකි බව පෙනේ.

ප්‍රේමදාස මහතාගෙන් කැඩී ආ ලලිත්-ගාමිණී-ප්‍රේමචන්ද්‍ර මහත්වරුන් විසින් පිහිටුවන ලද ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ විරුද්ධ පක්‍ෂයක් හැටියට ඉටුකරන (වඩාත් නිවැරදිව කියනවා නම් නොකරන) කාර්යයද ලංකාවේ විපක්‍ෂයේ කණගාටුදායක ඉරණම ගැන කථාකිරීමේදී සාකච්ඡා කළ යුත්තකි. ප්‍ර. එ. ජා. පෙරමුණට පාර්ලිමේන්තු නියෝජනයක් නැතත්, එය ශ්‍රී. ල. නි. පය ළඟට ඇති ප්‍රධාන විරුද්ධ පක්‍ෂයයි. එහෙත් අද එම පක්‍ෂය මුහුණ දී ඇති ප්‍රධානතම ප්‍රශ්නයක් තිබේ. එනම් පක්‍ෂයක් වශයෙන් තමන් පවතින්නේ කුමක් අරභයාද? යන ගැටළුවට පැහැදිලි පිළිතුරක් නැතිවීමයි.

ප්‍ර එ ජා පෙ ය බිහිවූයේ ප්‍රේමදාස මහතා ජනාධිපති ධූරයෙන් ඉවත් කිරීමට ගනු ලැබූ දෝෂාභියෝග ප්‍රයත්නය අසාර්ථක වීම නිසාය. එම අවස්ථාවේදී එ. ජා. පය දෙදරීමත්, එහි ප්‍රධාන පෙළේ සාමාජිකයින් ආණ්ඩුවෙන් කැඩී වෙන්වීමත් නිසා මෑත කාලයේ ලංකාවේ නොවූ තරම් දේශපාලන උනන්දුවක් මහජනයා තුළ ඇතිවිය. ප්‍රජාතන්ත්‍රවාදය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන යන මාතෘකා දෙක, ලංකාවේ සමාන්‍ය මහජනතාවගේ උද්‍යෝගිමත් සාකච්ඡාවට විෂයය වූ පළමුවැනි අවස්ථාවද උදා වූයේ අසාර්ථක වූ දෝෂාභියෝග ප්‍රයත්නයත් සමගය. ලලිත්-ගාමිණී-ප්‍රේමචන්ද්‍ර ඇතුළු පිරිස් කැඳවූ මුල් වටයේ රැස්වීම්වලට පැමිණි දසදහස් සංඛ්‍යාත ජනයාගෙන් ප්‍රකාශ වූයේ එ. ජා. පයෙන්, සහ ශ්‍රී. ල. නි. පයෙන් පිටස්තර අලුත් ප්‍රජාතන්ත්‍රවාදී පක්‍ෂයක් හා නායකත්වයක් වෙනුවෙන් මහජනයා වෙත තිබූ කැමැත්ත හා අභිලාෂයයි.

ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් සුබුදුකිරීමට ප්‍ර. එ. ජා. පෙරමුණේ නායකයින් මුළදී සමත්වූවද, ඉතා කෙටි කලකින්ම ඔවුන් කෙළේ ජනතාව දේශපාලන අපේක්‍ෂා භංගත්වයකට ඇද දැමීමයි. තමන්වෙත තිබූ 'ප්‍රේමදාස වෛරය' තුළ එම නායකයෝ සිරකරුවන් වූහ. මහජනයා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සකස් කිරීමට ඔවුනට තවමත් නොහැකිය. පරිහානිය ජාතගත වී තිබෙන්නේ එක් මූලික දේශපාලන ගැටළුවක් තුළය. එම ගැටළුව කෙටියෙන් විස්තර කළහොත් එය මෙසේය.

1990 දශකය ආරම්භවනවිට මේවී සිදුවූ ලංකාවේ දේශපාලන අර්බුදය තුළින් ප්‍රකාශයට පත්වූ දේශපාලන න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතම අංගයක් වූයේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යාපාරයක අවශ්‍යතාවය යි. ශ්‍රී. ල. නි. පය හා එ. ජා. පය යන සාම්ප්‍රදායික ධනේශ්වර දේශපාලන පක්‍ෂ දෙකම, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී පක්‍ෂ හැටියට පිරිහී තිබුණි. ශ්‍රී ල. නි. පය මතවාදී දරිද්‍රතාවයෙනුත්, අභ්‍යන්තර ආරවුල්වලිනුත් අඩපණ වී තිබෙද්දී, පාලක එ. ජා. පය ජයවර්ධන මහතා යටතේ දක්‍ෂිණාංශික අධිකාරවාදයටත්, ප්‍රේමදාස මහතා යටතේ ජනතාවාදී අධිකාරවාදයටත්, පාත්‍රවී තිබුණි. ලංකාවේ රාජ්‍යය ප්‍රජාතන්ත්‍රවාදී කිරීම, ජනවාර්ගික ප්‍රශ්නය දේශපාලන වශයෙන් විසඳීම, රාජ්‍ය බලය විමධ්‍යගත කිරීම මානව අයිතිවාසිකම් පිළිබඳ ගැටළු විසඳීම, දූෂණයෙන් සහ හිතුවක්කාර භාවයෙන් තොර සමාජයට වගකියන පාලන තන්ත්‍රයක් ගොඩ නැඟීම යන කරුණු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය පත්‍රයේ ඉදිරියටම පැමිණි කර්තව්‍යයන් විය. 1991 මැද වන විට අවකාශ පෑදී තිබුණේ මෙම කර්තව්‍යයන් සිය ක්‍රියාමාර්ගය බවට පත් කරගත්, ප්‍රජාතන්ත්‍රවාදී නව සමාජ ගිවිසුමක් (democratic social contract) ඇති කිරීම අරමුණු කොටගත් දේශපාලන බලවේගයක් වෙනුවෙනි. එහෙත් ජයවර්ධන මහතාගේ දක්‍ෂිණාංශික අධිකාරවාදය තුළ දේශපාලන පුහුණුව ලැබූවාවූද, ප්‍රේමදාස මහතා වෙත තිබූ සමාජමය පිළිකුල සහ දේශපාලන වෛරය වෙතින් ක්‍රියාවට මෙහෙයවනු ලැබූවාවූද, ප්‍ර. එ. ජා. පෙරමුණේ නායකයින්ට ඒ සඳහා කිසිදු දේශපාලන හා බුද්ධිමය හැකියාවක් නොතිබුණි. දෝෂාභියෝග යෝජනාව ලෙස හැඳින්වෙමින් මහජනයා අතට පත් වූ ලියවිල්ලත්, මහත් ආන්දෝලනයක් සහිතව පටන් ගත් 'රජාලියා' ප්‍රචාරයේ මුල් කලාප කිහිපයත්, ප්‍රේමදාස මහතාට විරුද්ධව පැතිරෙන කැලෑපත්තරත් සාක්ෂි දරණ එක් මූලික දෙයක් නම්, ප්‍ර. එ. ජා. පෙරමුණේ නායකත්වයට, වර්තමාන ලංකාවේ ධනේශ්වර-ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ පිළිබඳ න්‍යාය පත්‍රය ගැන කිසිදු අදහසක් නැත යන්නයි.

ශ්‍රී. ල. නි. පය සහ ප්‍ර. එ. ජා. පෙරමුණ පිළිබඳ අප ඉහත දැක්වූ විවේචනය ඉදිරිපත් කරන්නේ එක් මූලික කරුණක් පෙන්වා දීමටයි. එනම් මුළු විපක්‍ෂයම දේශපාලන දරිද්‍රතාවයකින් පෙළෙන බව කීමටයි. විපක්‍ෂයේ ඇති සියළුම ප්‍රශ්න මේ දේශපාලන දරිද්‍රතාවයේ ප්‍රකාශනයන්ය. විපක්‍ෂයේ අද දේශපාලනය ආණ්ඩුවේ විවිධ ක්‍රියාවන්ට කරන ප්‍රතික්‍රියාවන්ගේ දේශපාලනයක් (Reactive Politics) විනා ඉන් එහාට යන්නක් නොවේ.

මහජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පරිකල්පනය පුබුදුවාලීම අසමත් වන කිසිදු විපක්‍ෂ බලවේගයකට තමන්ටම මිස ආණ්ඩුවට සාර්ථක ලෙස විපක්‍ෂවීමට හැකියාවක් නැත. මෙවැනි තත්ත්වයක් තුළ ලංකාව තනි පක්‍ෂ අධිකාරවාදී පාලනයක් (one-party anthoritarian rule) කරා ඇද වැටෙන්නේ නම්, ඊට ප්‍රධාන වශයෙන් දායකත්වය සපයනු ඇත්තේ විපක්‍ෂය ද වෙතිනි.

# ස්වාධීන සාහිත්‍ය උළෙල

1992 ඔක්. 9 - 10 දෙදින තුළ කොළඹ මහජන පුස්තකාලයේදී පැවැති ස්වාධීන සාහිත්‍ය උළෙල, අන් සියළුම කාරණා පසෙක තිබියදී කරුණු දෙකක් නිසා වැදගත්ය. පළමු කරුණ වන්නේ එය රාජ්‍යයට පිටතින් රාජ්‍ය බලයේ අධිකාරයට හසු නොවූ සාහිත්‍යවේදීන්ගේ, විචාරකයන්ගේ හා රසිකයන්ගේ උළෙලක් වූ බැවිනි. මෙම කාරණය උළෙලේ සංවිධායකයින් මුල පටන්ම අවධාරණය කරන්නට යෙදුණු කරුණක් බැවින් එය පිළිබඳව වැඩිදුර කථා කළ යුතුයැයි අපි නොසිතමු.

දෙවැනි කරුණ සාහිත්‍ය උළෙලේ සංවිධායකයින් ප්‍රකාශිතව ඉදිරිපත් නොකළද එය එහි පැවති සම්මන්ත්‍රණ වල කථා කළ සෑම දේශකයෙකු විසින්ම අවධාරණය කරන්නට යෙදුණු කරුණකි. එම කරුණ නම් අපේ සාහිත්‍ය තුළ මෙන්ම අන් බොහෝ ක්‍ෂෙත්‍ර වලද, මුල් බැසගෙන පවත්නාවූ ජාතික කේන්ද්‍රීය ඉදිරි දර්ශනය ඉතා තදබල ලෙස ප්‍රශ්න කිරීමයි. ඒ තුළ ඉතා වැදගත් ජාත්‍යන්තරවාදී, මානවවාදී ඉදිරිදර්ශනයක් මතුවීම ඉතාම ජනතාත්මික ප්‍රවණතාවයක් බව අපි මෙහිලා සටහන් කොට තබමු.

එවැනි ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනයක් අනිවාර්යයෙන්ම අවශ්‍යව තිබෙන්නේ සාහිත්‍යයද ඇතුලත් අප භුක්ති විඳින සංස්කෘතිය වනාහි කිසිදු ජාතියක වර්ගය තුලයක ජයග්‍රහණ නොවන බැවිනි. එම ජයග්‍රහණ කිනම් ජනකොටසක් විසින් කුමන කාලයක කුමන ප්‍රදේශයකදී අත්පත් කරගත්තද ඒවා පොදුවේ මනුෂ්‍ය වර්ගයේ ජයග්‍රහණයෝ වෙති. එබැවින් එම ජයග්‍රහණ භුක්ති විඳීමේ අයිතිය ලෝක ගෝලයේ කුමන අස්සක මුල්ලක සිටියද සෑම මිනිසෙකුටම තිබේ.

නමුත් එම ජයග්‍රහණයන් භුක්ති විඳීමට ඇති අනේක විධ බාධක අතුරින් එක්

31 වෙනි පිටුවට

# පක්ෂ දේශපාලනයේ නව ප්‍රවනතා

- ආචාර්ය නිව්ටන් ගුණසිංහ

**ආචාර්ය නිව්ටන් ගුණසිංහ විසින් ලියන ලදුව 1987 විමසුම සඟරාවේ පළ වූ මේ ලිපිය අප නැවත පළකරන්නේ ඔහුගේ මරණයෙන් සිව්වැනි සංවත්සරයේදී ඔහුට කරන උපහාරයක් වශයෙනි. කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුව සිටි ඔහු මිය යන විට සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ ලේකම්වරයාද, කම්කරු ගොවි ආයතනයේ සභාපතිවරයාද, ලංකා පොදු සේවා සංගමයේ සභාපතිවරයාද විය. තරුණ වියේ සිටම වාමාංශික ක්‍රියාකාරිකයකුව සිටි ඔහු මාක්ස්වාදී න්‍යායයක් සමාජ විද්‍යා හා මානව විද්‍යාත්මක ශික්ෂණයනුත් බද්ධ කිරීම අතින්. ලංකාවේ සමාජය, ආර්ථිකය, දේශපාලන, සංස්කෘතික හා ජනවාර්ගික ප්‍රශ්නය ගැන කළ අධ්‍යයනයන් සහ විග්‍රහයන්. ලංකාවේ සමාජවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී ඉදිරි ගමන වෙනුවෙන් ඉබුනෙරුණු පුරෝගාමී බුද්ධිමය ප්‍රයත්නයක් විය.**

ලංකාවේ මෑත කාලීන දේශපාලන වර්ධනයන් ගැන සලකා බලන විට නව දේශපාලන පක්ෂ බිහිවෙමින් තිබෙන බව පෙනෙන්නට තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් වූ පිරිසක් විසින් ශ්‍රී ලංකා මහජන පක්ෂය පිහිටුවා ගෙන තිබෙන අතර එක්සත් ජාතික පක්ෂයට කිට්ටු සම්බන්ධතාවයක් තිබූ පිරිසක් විසින් එක්සත් ලංකා ජනතා පක්ෂය පිහිටුවාගෙන තිබෙනවා. මේ අතර ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් නමින් මුස්ලිම් ජනයා නියෝජනය වන පරිදි යැයි සැලකිය හැකි මුස්ලිම් ජනතාව අතරින්ද නව පක්ෂ බිහි වී තිබෙනවා. මෙම පක්ෂයන් එකම සමයක බිහිවී තිබෙන මුත් මෙම බිහිවීමට බලපා ඇති හේතූන් එකම හේතූන් හෝ සමාන ඒවා යැයි කීමට නොහැකිය. ඒනිසා ලංකාවේ සමාජ ආර්ථික ව්‍යුහයට අනුව මෙම පක්ෂ තුනම එකට සම්බන්ධ කොට කථාකල නොහැකි වන අතර වඩාත් නිවැරදි එළඹුම වන්නේ මෙම පක්ෂ සම්බන්ධ වන්නාවූ පංති හා සමාජ ස්ථරයන් පිළිබඳව වෙන් වෙන් වශයෙන් ගෙන විමසීමයි.

ප්‍රථමයෙන්ම එක්සත් ලංකා ජනතා පක්ෂය ගැන කථා කරන්නේ නම් සැලකිලිමත් විය යුතු වැදගත් කරුණ වන්නේ එක්සත් ජාතික පක්ෂය පසුගිය දශක හතර තුළදී දේශපාලන පරිනාමයකට ලක්වූ පක්ෂයක් බවයි.1956 දී පරාජය වූ එක්සත් ජාතික පක්ෂය නොවේ 1965 දී යලි බලයට පත්වූයේ. 1956 ට පෙර එක්සත් ජාතික පක්ෂය යනු ප්‍රභූ පවුල් කිහිපයකින් නායකත්වය සැපයුණු සම්ප්‍රදායික ආකාරයේ ගතානුගතික පක්ෂයක් 1956 ට පෙර එ.ජා.පයේ සංවිධාන ව්‍යුහය 'ඉහලින් පහලට' සංවිධානය වී තිබුනු එකකි. මෙම පක්ෂය ප්‍රාදේශීය වශයෙන්ද ගත්කල ක්‍රියාත්මක වී තිබුණේ එම ආකාරයෙනුයි. නමුත් 1965 දී බලයට පැමිණි එ.ජා.පය මීට වඩා තරමක් වෙනස් ආකාරයක් ගත් පක්ෂයක්.

එමෙන්ම 1977 දී බලයට පත් වූ එක්සත් ජාතික පක්ෂය මීටත් වඩා වෙනස් බව කිව යුතුයි. එ.ජා.පය. මේ වන විට බහුජන පදනමකින් යුක්ත වීම, එනම් බොහෝ දුරට ජනතා කණ්ඩායම් වලට සම්බන්ධ වූ පක්ෂයක් වී තිබීම පැරණි එක්සත් ජාතික පක්ෂයෙන් වෙනස් වීමට හේතු වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මෙම නව ස්වරූපය නවීන දේශපාලන පක්ෂයක ලක්ෂණයක්.

මෙසේ එක්සත් ජාතික පක්ෂයේ බහුජන පදනම පුළුල් වන විට එහෙත් එහි නායකත්වය හෙබ වූ ප්‍රභූ කොටස් පක්ෂයෙන් කොන් වූ අතර එසේ කොන් වූ ප්‍රභූ පවුල් වල කොටස් විසින් ගොඩනගා ගන්නා ලද පක්ෂයක් වශයෙන් එක්සත් ලංකා ජනතා පක්ෂය හැඳින්විය හැකිය. එනම් එක්සත් ලංකා ජනතා පක්ෂය, ආරම්භක එක්සත් ජාතික පක්ෂය වැනි පක්ෂයකි. මෙම පක්ෂයේ නායක රුක්මන් සේනානායක කියන පරිදි පෙනී යන්නේ එක්සත් ලංකා ජනතා පක්ෂයේ අරමුණ වන්නේ ඩී. එස්. සේනානායක විසින් ගොඩනැගූ ආකාරයේ පක්ෂයක් ගොඩ නැගීම බවයි. නමුත් ඩී. එස්. සේනානායක ගේ නායකත්වය ලැබූ එක්සත් ජාතික පක්ෂය ආකාරයේ පක්ෂයක් ගොඩනැගීමට වර්තමානයේ පුළුවන් කමක් නැත. මෙහිදී අපගේ අවධානයට ලක්විය යුතු කාරණය වන්නේ ඩී. එස්. සේනානායක නායකත්වය දුන් එ.ජා.පක්ෂය වනාහි ඔහුගේ සමයේ පක්ෂයක් බවයි. එද සිට අද දක්වා ලංකාවේ සමාජ ව්‍යුහය විශාල ලෙස වෙනස් වී තිබීමත් ප්‍රභූ පවුල් වලට තිබූ දේශපාලන අධිකාරය වර්තමානයේදී බිඳවැටී තිබීමත් නිසා පැරණි ආකාරයේ එක්සත් ජාතික පක්ෂයක් අද ගොඩ නැගීමට පුළුවන් කමක් නැත. මෙම හේතුව නිසා එක්සත් ලංකා ජනතා පක්ෂයේ උත්සාහය වනාහි සාර්ථක කර ගත නොහැකි එමෙන්ම ඉතිහාසයේ ආපස්සට යාමට දරණ උත්සාහයක් වශයෙන් හැඳින්විය හැකියි.

## මුස්ලිම් නියෝජනය

ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය වශයෙන් හැඳින්වෙන මුස්ලිම් පක්ෂය විශේෂ ස්වරූපයක් ගන්නවා. මෙම මුස්ලිම් ලීගය අපගේ විමසුමට ලක්වීමට පෙර අප මතක තබා ගත යුතු වැදගත් කාරණයක් වන්නේ වාමාංශික පක්ෂ හැරුනු විට ලංකාවේ දේශපාලන පක්ෂ කාලයක සිට

සංවිධානය වී ඇත්තේ ජනවාර්ගික ආකාරයකට බවයි. එක්සත් ජාතික පක්ෂයේ නාමයෙහි 'එක්සත් ජාතික' යන්න අඩංගු වුවද එක්සත් ජාතික පක්ෂය සිංහල පක්ෂයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද සිංහල පක්ෂයක් බව රහසක් නොවන අතර ෆෙඩරල් පක්ෂය හෝ ටැමිල් කොන්ග්‍රසය හෝ වත්මන් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ හෝ යන මේ සියල්ලම ජනවාර්ගික පක්ෂ බව අප තේරුම් ගත යුතුයි. නමුත් මේ ආකාරයේ ජනවාර්ගික පක්ෂයක් මුස්ලිම් වරුනට මෙතෙක් තිබුණේ නැහැ. ජනවාර්ගික විඥානය මේ තරම් වර්ධනය වී ඇති සමයෙක මුස්ලිම් ජනවර්ගය අතරින් ජනවාර්ගික පක්ෂයක් බිහිවූයේ මන්ද යන්න නොව ප්‍රශ්නය වන්නේ ඇත්තෙන්ම එවැනි පක්ෂයක් බිහිවීමට මෙතරම් ප්‍රමාද වූයේ ඇයිද යන්නයි.

මේ අලුත් මුස්ලිම් පක්ෂය පැන නැග තිබෙන්නේ නැගෙනහිර පලාතේ වන අතර වැඩි වශයෙන්ම එම පක්ෂයේ බලය තිබෙන්නේද, නැගෙනහිර පලාතේ බව පැහැදිලි කාරණයක්. ජනවර්ගයක් ලෙස සලකන කල්හි ලංකාවේ මුස්ලිම්වරු විසිරුණු ජනවර්ගයක්. මෙහිදී ප්‍රධාන වශයෙන්ම මුස්ලිම් රාශිභූතයන් තුනක් ගැන අපට කතා කළ හැකිය. මින් එකක් බටහිර පලාතේ සහ මුහුදු බඩ මුස්ලිම් රාශි භූතයන් වන අතර අකුරණ හා ගම්පොල ආදිවූ ප්‍රදේශ වල වෙසෙන උඩරට මුස්ලිම් ප්‍රජාව තවත් මුස්ලිම් රාශිභූතයක් වශයෙන් හඳුනා ගත හැකිය. ඊළඟට ගත හැක්කේ නැගෙනහිර පලාතේ මුස්ලිම් රාශිභූතයන්ය.

අපගේ විමසුමට ලක්වී තිබෙන නව මුස්ලිම් පක්ෂය නැගෙනහිර ප්ලාතෙන් බිහිවූවක් වන අතර මුහුදුබඩ හා උඩරට ප්‍රදේශයන්හි මුස්ලිම් ජන කොටස් වලින් පුළුල් මට්ටමේ සහයෝගයක් ඊට ලැබේ යැයි සිතන්නට බැහැ. නමුත් ඔවුන්ට නැගෙනහිර පළාතේ පුළුල් පදනමක් දිනාගත හැකි සාධක විමසිය හැකිය.

(1) ජනවර්ගයක් වශයෙන් ගත් කල්හි මුස්ලිම් ජනවර්ගය ඉතාම පසුගාමී කණ්ඩායමක් වන අතර, එයිනුත් නැගෙනහිර පලාතේ මුස්ලිම් ජනතාව විශේෂයෙන්ම පසුගාමී කොටස බව පෙනී යන දෙයක්. අධ්‍යාපනය හා සෞඛ්‍ය මට්ටම් බලන විට මොවුහු ලංකාවේ අනෙකුත් කොටස් වලට වඩා පසුපසින් සිටිති.

(2) ගෙවී ගිය විසිවසර තුළ ලංකාවේ ඉඩම් අයිතිය හා ඉඩම් භුක්තිය යම් යම් වැදගත් වෙනස් වීම් ගණනාවකට ලක්විය. මේ ක්‍රියාවලිය සැකවින් මෙසේ දැක්වීමට හැකිය. 1950 ගණන් වලදී නැගෙනහිර පලාතේ ඉඩම් හිමියන් වශයෙන් සිටියේ දෙමළ පිරිස් වන අතර මුස්ලිම් ජනතාව බොහෝ සෙයින්ම අඳ ගොවීන් වශයෙනුයි සිටියේ. නමුත් 1950 ගණන් වලදී ඉඩම් භුක්තිය වෙනස් වීම් වලට ලක්වූ බැවින් ඉඩම් අයිතිය අඳ ගොවීන් අතට පත්වී තිබෙනවා.

**මෙම හේතූන් නිසා ඉස්ලාම් මූලධර්මවාදය මුස්ලිම් ජන වර්ගය අතර පැතිරෙමින් තිබේ. ඉස්ලාම් මූලධර්ම වාදය ඉහත කී ගුණාංගයන්ගෙන් යුතුව නැග එන මුස්ලිම් ප්‍රවණතාවයකට ආකර්ශනීය වන්නක්**

1960 ගණන් වල අගභාගයේ සිට පැරණි අඳ ගොවීන් අතරින් මැද ගොවි ස්ථරයක් නිර්මාණය වෙමින් තිබිනි.

නැගෙමින් සිටින මෙම මුස්ලිම් ආගමික මැද ගොවි කොටස් අතරින් යම් අධ්‍යාපනයක් ඇති තරුණ පිරිසක් මතුවී සිටිනවා. එහෙයින් තත්ත්වය පෙරට වඩා වෙනස් බව තේරුම් ගත යුතුයි. ඇත්තෙන්ම මොවුන් යම් අධ්‍යාපනයක් ලබා තිබෙන්නේ වී නමුත් ග්‍රාමීය සහ ලෝක දැනුම යම් ආකාරයක සීමා සහිත වූ ප්‍රදේශයකින් ඉදිරියට ඇදෙන පිරිසක්. මේ ආකාරයේ ප්‍රවනතාවයකින් යුතු වූ අය ඉස්ලාම් මූලධර්ම වාදී ආගමික නැඹුරුවකට යොමු වීමට ඉඩ ඇති බව පෙනෙනවා. උදාහරණයක් වශයෙන් ගතහොත් පේරාදෙණිය සරසවියේ මෑත කාලයේ දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසුන්ගෙන් වැඩි පිරිසක් නැගෙනහිර වෙරළේ සිට පැමිණෙන මුස්ලිම් සිසුන් බව පැහැදිලි කාරණයක්. මෙය මීට වසර 10 කට පෙර තිබූ තත්ත්වයක් නොවේ. මීට දස වසරකට පෙර මැද ගොවි ස්ථරයක් නැගෙනහිර මුස්ලිම් ජනතාව අතර නොතිබුණු හෙයින් අධ්‍යාපනයේ පැතිරීමක් ද නොතිබුණි.

(3) එමෙන්ම ඉස්ලාම් දේවස්ථාන ගොඩ නැගීම සඳහා නැගෙනහිර වෙරළට අරාබි රට වලින් ආධාර ලැබී තිබෙන අතර ඉස්ලාම් දේව ධර්මය උගැනීම සඳහා පතිස්ථානය වැනි ඉස්ලාම් රටවලින් මුස්ලිම් සිසුන් හට ශිෂ්‍යත්වයන් ප්‍රදානය කෙරෙමින් පවතී. මෙම හේතූන් නිසා ඉස්ලාම් මූලධර්ම වාදය මුස්ලිම් ජන වර්ගය අතර පැතිරෙමින් තිබේ. ඉස්ලාම් මූලධර්ම වාදය ඉහත කියන ලද ගුණයෙන් ගෙන් යුතුවූ නැග එන මුස්ලිම් ප්‍රවනතාවයකට ආකර්ශණීය වන්නක්.

නමුත් මුහුදුබඩ හෝ උඩරට මුස්ලිම් ජනකොටස් වලට මෙම ඉස්ලාම් මූලධර්ම වාදය ඒ අයුරින්ම ආකර්ෂණීය වන්නේ නැහැ. ඊට හේතු තියෙනවා. මේ වන විට පොදුවේ මුස්ලිම් ජනතාවට නායකත්වයක් ලබාදෙන නාගරික වශයෙන් වෙසෙන මුස්ලිම් දේශපාලන නායකත්වයට නැගෙනහිර වෙරළෙන් එල්ලවන චෝදනා තුළ මෙම හේතු ගම්‍ය වෙනවා. උඩරට හා මුහුදුබඩ වෙසෙන මුස්ලිම් ජන කොටස් වලට බලපාන සමාජ - ආර්ථික ගැටළු හා නැගෙනහිර වෙරළේ මුස්ලිම් ජන කොටස් වලට බලපාන සමාජ - ආර්ථික ගැටළු එක සමාන නොවේ.

නැගෙනහිර උඩරට හා මුහුදුබඩ යන මෙම මුස්ලිම් ජනවර්ග කොටස් තුනම ආගමික වශයෙන් ගත්කල සමජාතීය වන්නේ වී නමුත් නැගෙනහිර වෙරළේ මුස්ලිම් ජනතාව මූලික වශයෙන් ගොවි ජනතාව වන අතර ඔවුන් ග්‍රාමීය ආර්ථිකයකට බද්ධ වී සිටිති. උඩරට සහ මුහුදු බඩ මුස්ලිම් ජනතාව මූලික වශයෙන් වෙළඳාමට සම්බන්ධ වී සිටින හෙයින් ඔවුන් බද්ධ වී සිටින්නේ නාගරික ආර්ථිකයකටයි. මේ නිසා මොවුන්ට සමාජයීය වශයෙන් සැලකිය හැකි පොදු ගැටළු තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. මේ අනුව මුස්ලිම්වරුන්ගේ ප්‍රශ්නය යනුවෙන් කථා කළ හැකි පොදු ප්‍රශ්ණ අඩු බව මෙහිදී කිව යුතුය. නැගෙනහිර වෙරළේ මුස්ලිම් ජනතාවට ඇත්තේ සාමාන්‍ය ගොවි ජනතාවට ඇති ප්‍රශ්ණයන්ය. අනෙක් කොටස් දෙකට ඇත්තේ වෙළෙන්දන්ට ඇති ප්‍රශ්නයන්ය.

කෙසේ වුවද ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයට නැගෙනහිර වෙරළේ පැවැත්මක් තිබීමට ඉඩ ඇති අතර නැගෙමින් තිබෙන ඉස්ලාම් මූලධර්ම වාදය ලංකාවේ අනාගත දේශපාලනයේ වැදගත් තැනක් ලබාගනු ඇත.

### ශ්‍රී. ල. ම. ප.

ශ්‍රී ලංකා මහජන පක්ෂය සම්බන්ධයෙන් ගත්කල එහි තත්ත්වය ඉඳුරාම මීට වෙනස් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ සිටි රැඩිකල් පිරිසක් ඉන් ඉවත්වී පිහිටුවා ගන්නා ලද පක්ෂයක් වශයෙන් ශ්‍රී ලංකා

මහජන පක්ෂය හැඳින්විය හැකිය. එය මෙසේ විස්තර කළ හැක. ආරම්භක එක්සත් ජාතික පක්ෂයේ වැනි ප්‍රසිද්ධ ලක්ෂණයන් පමණක් වන්මින් ශ්‍රී ල. නි. පයේ තිබෙන මුත් ආරම්භක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එවැන්නක් නොවේ. 1952 දී බණ්ඩාරනායක මහතා විසින් ශ්‍රී. ල. නි. පය සංවිධානය කරනු ලැබූ යුගයේදී ඊට පොදු පදනමක් තිබිණ. ඒ අවදියේ දී ප්‍රබල නායකත්වයක් තිබුණේ එක්සත් ජාතික පක්ෂයටයි. ඉහලම ප්‍රබල චරිතයක් වශයෙන් බණ්ඩාරනායක මහතා හැඳින්විය හැකි නමුත් ශ්‍රී. ල. නි. ප. වශයෙන් ගත්කල ඊට තිබුණේ ප්‍රබල නායකත්වයක් යයි කිව නොහැකිය. 1956 දී පමණ ශ්‍රී. ල. නි. පයේ නායකත්වය තුල නියෝජනය වූයේ විවිධ සමාජ ස්තරවලින් පැමිණි කොටස් බව පෙනී යනවා. උදාහරණ වශයෙන් දක්වතහොත් ධනේශ්වර පංති වලින් පැමිණි ස්ටැන්ලි සොයිසා වැන්නවුන් සහ වෘත්තීය සමිති නායකයකු වූ ටී. බී. ඉලංගරත්න වැන්නවුන් ද ග්‍රාමීය ප්‍රභූ කොටස් වලින් පැමිණි රාජපක්ෂ වැනි අයද පෙන්වා දිය හැක.

> බණ්ඩාරනායක සිය පවුලේ කිට්ටුවරයින් දේශපාලනයට කැඳවාගෙන පැමිණියේ නැති අතර ඔවුන් ඈත් කොට තිබූ බව පැහැදිලි කාරණයකි.

1956 මැතිවරණයේදී ශ්‍රී. ල. නි. පය විසින් ඉදිරිපත් කරනු ලැබූ සටන් පාඨවල ප්‍රධාන වශයෙන් සුළු ධනේශ්වර සහ වැඩ කරන ජනකොටස් වල ඉල්ලීම් අඩංගු වී තිබීමත් කල්පනා කළ යුත්තේ මීට සම්බන්ධවයි. නමුත් ශ්‍රී. ල. නි. පයේ නායකත්වයට සිරිමා බණ්ඩාරනායක මහත්මිය පත්වීමෙන් පසු මෙම තත්ත්වය වෙනස් වූ බව මෙහිදී අවධාරණය කළ යුතු කාරණයක්. 'පවුල් ආධිපත්‍ය' යනුවෙන් මැතිවරණ දේශපාලනයේදී ජනප්‍රිය වී තිබෙන පදය පැමිණියේ ඉන්පසුවය.

බණ්ඩාරනායක සිය පවුලේ කිට්ටුවරයින් දේශපාලනයට කැඳවාගෙන පැමිණියේ නැති අතර ඔවුන් ඈත්කොට තිබූ බව පැහැදිලි කාරණයකි. කිට්ටුවර ඥාතියෙකු වශයෙන් හැඳින්විය හැකිව තිබුණේ එස්. ඩී. බණ්ඩාරනායක පමණයි. නමුත් ඔහු පැමිණියේ ගම්පහ ප්‍රදේශයේ ඔහුට තිබූ පදනම නිසාවෙනි. ඔහුගේ පැමිණීම බණ්ඩාරනායකට නොවැලැක්විය හැකිව තිබූ දෙයක්. නමුත් බණ්ඩාරනායක මහතාගේ මරණින් පසු ඔහුගේ ඥාතීන් පක්ෂයේ මධ්‍යයට පැමිණියා. බණ්ඩාරනායක ගේ මරණින් පසු සිදුවූ අත්තනගල්ල ආසනයට තරඟ වැදීම සඳහා දේශපාලන පරිචයකින් තොර සෙල්ලක්කාර වංශවතෙකු වූ ජේ. පී. ඔබේසේකර ඉදිරිපත්වීමෙන් ඒ බව සනාථ වෙයි. එමෙන්ම පිලික්ස් ඩයස් බණ්ඩාරනායක වැන්නන් පක්ෂයේ මධ්‍යයට ගෙන ඔහුට වයස අවුරුදු 29 දී තරම් ලාබාල වියේදීම වගකිවයුතු ඇමතිකම් පැවරීම මගිනුත් මේ බව තවදුරටත් පැහැදිලි කර ගත හැකි වෙයි. ශ්‍රී. ල. නි. යේ පවුල් ආධිපත්‍යය සකසුරු වන්නේ ඒ ආකාරයෙනුයි. මීට හේතුව නම් කොතරම් පැටලිලි සහිත වූවද යම්කිසි දේශපාලන මතවාදයක් බණ්ඩාරනායක මහතාට තිබීමය. ඔහුට තිබුණාවූ මතවාදයට අනුව විවිධ බලවේග එකතුකර ගැනීමට බණ්ඩාරනායකට හැකියාව තිබූ අතර කිසිම මතවාදයක් නොවූ සිරිමා බන්ඩාරනායක එකතු කර ගනු ලැබුවේ තමන්ට විශ්වාස තමන්ගේ ඥාතීන්ය. 1970 - 77 දක්වා වන කාලයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුල මෙම පවුල් ආධිපත්‍යය තදින්ම වර්ධනය වී තිබුණි.

එක් අතකින් ගත්කල මෙය පක්ෂය තුල ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ප්‍රශ්නයක් වෙනවා. පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් වශයෙන් සැලකිය හැකි බණ්ඩාරනායක පවුලට සම්බන්ධකම් නොමැති මෛත්‍රීපාල සේනානායක, ටී. බී. ඉලංගරත්න වැන්නන් විවිධ අවස්ථාවලදී ශ්‍රී. ල. නි. පය හැරයාමට සැරසුනේ මෙහෙයින්ය. ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ජනිත වීම මෙම ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය.

වර්තමාන ශ්‍රී ල. නි. පක්ෂයත් ආරම්භක ශ්‍රී. ල. නි. පක්ෂයත් අතර ප්‍රධාන වෙනස්කම් ගණනාවක් දක්නට ඇත. 1956 වනවිට එ. ජා. පක්ෂය විසින් නියෝජනය කළේ වතු අයිතිකාර ධනේශ්වර පංතියේ හා ග්‍රාමීය ඉඩම් හිමි ප්‍රභූ පංතියේ අවශ්‍යතාවයන්ය. නමුත් ඊට ප්‍රතිවිරුද්ධව නැගෙමින් සිටි ග්‍රාමීය හා නාගරික වාණිජ සුළු ධනේශ්වර පංතියේ අවශ්‍යතාවයන් නියෝජනය වූයේ 1956 ශ්‍රී. ල. නි. පයෙනුයි. එසේ වුවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයේ සිටින පක්ෂයක් වශයෙන් ධනේශ්වර පන්තියේ අවශ්‍යතාවයන් ද ඉටු කිරීමට ඊට සිදු වෙනවා. මෙහිදී ශ්‍රී. ල. නි. පක්ෂය විසින් කලින් නියෝජනය කළ සමාජ පන්තීන් වූ ග්‍රාමීය වාණිජ සුළු ධනේශ්වර හා ධනේශ්වර පංතිය සඳහා ශ්‍රී. ල. නි. පක්ෂය අනුගමනය කරනු ලැබූ ප්‍රතිපත්තිය අතර ගැටුමක් ඇතිවුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් අතකට යාමට සුළු ධනේශ්වරය උනන්දු කැර වීමක් පසුකාලීනව සිදුවුනි. ශ්‍රී. ල. නි. පක්ෂය තුල සිටි සුළු ධනේශ්වර කොටස් වලින් බහුතරය විසින් 1977 දී එ. ජා. පක්ෂයට සහය දෙනු ලැබුවේ එහෙයිනි. ලංකාවේ දේශපාලන විකාශනයන් හා වර්ධනයන් ගැන සාකච්ඡා කිරීමේදී වාමාංශික පක්ෂ වර්තමානයේ මුහුණ දී සිටින දේශපාලන අර්බුදය පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුවන්නේ හත් පසින්ම ඉහත දක්වනලද හේතූන්ට වෙනස් වූ පදනමකින්ය. වමේ පක්ෂ නිසියාකාරයෙන් ස්ථාපිතව පැවතුනේ නාගරික කම්කරු පංතිය අතර ඊට පදනමක් තිබුනාවූ අවදියේයි. කම්කරු පංතිය සංවිධානය කිරීමට මේ කාලයේ එ. ජා. පය උනන්දු වී තිබුනේ නැත. තමන් වෙනම පිරිසක් යනුවෙන් ඔවුන් සිතුවා විය හැක. 1956 දී ධනේශ්වර පංතියට අයත් පක්ෂ විසිනුත් කම්කරු පංතිය සංවිධානය කිරීමට පටන් ගනු ලැබිය.

වාමාංශික කඳවුරේ අර්බුදය පිළිබඳ කතා කිරීමේදී ඒ ගැන උනන්දු කරවන සංසිද්ධියක් වන්නේ 1956 දී බණ්ඩාරනායකගේ ජයග්‍රහණ මෙන්ම කොළඹ නගර සභාවෙන් ඇන්. ඇම්. පෙරේරා පරාජය වීමත්ය. 1956 දී තමන් ලැබූ පරාජය තාවකාලික එකක් යැයි ඇතැම් විට වාමාංශිකයන් සිතුවා විය හැක. නමුත් වසර 30 පසුව අද අප එම අතීතය දෙස ආපසු හැරී බලන කල්හි පෙනී යන්නේ වාමාංශික ව්‍යාපාරයේ අර්බුදය සනිටුහන් වී ඇත්තේ 1956 සිට බවයි. සිඳ වැටීමේ ආරම්භය එය බවයි. ධනේශ්වර පංතිය විසින් කම්කරු සමිති ආරම්භ කිරීම සිදුවන්නේ ශ්‍රී ල. නි. පය. මගිනි. 1956 න් පසු බලයේ සිටින පක්ෂය වශයෙන් ශ්‍රී. ල. නි. පයේ සමිති ශක්තිමත් වීමා බවට පත්වුනා.

'අප සිටිය යුත්තේ බලයේ සිටින පක්ෂයට අයත් වෘත්තීය සමිති වලය'. යන මතය පසුකාලීනව කම්කරු පන්තිය අතර ජනප්‍රිය වුනා. මේ සම්බන්ධයෙන් අප උනන්දු කරවන කාරණයක් වන්නේ 1970 - 77 දක්වා එක්සත්පෙරමුණු කාලයේදී සංස්ථා හා දෙපාර්තමේන්තු වල එනම් රාජ්‍ය අංශයේ ආයතන වලට අයත් වෘත්තීය සමිති බොහෝ සෙයින්ම ශ්‍රී. ල. නි.

පයට අයත් වීවා නමුත් 1977 මහ මැතිවරණයෙන් ශ්‍රී. ල. නි. පය පරාජය වීමත් සමගම එකම එක රැයකින් එම සමිති වලින් බහුතරය එ. ජා. පය විසින් හිමිකර ගැනීමයි. ශ්‍රී. ල. නි. පය වෙතින් එ. ජා. පය කරා මෙම වෘත්තීය සමිති වල නායකත්වය මාරුවන නමුත් කම්කරුවන් අතර ජනප්‍රිය ව තිබූ මතය වෙනස් නොවූ බව මෙහිදී වැදගත්වේ. 'කෙසේ වුවද අපි ඉන්නේ බලය ඇති පක්ෂය සමඟය' යන ප්‍රතිපත්තිය රාජ්‍ය අංශයට මිස පුද්ගලික අංශයට යොදෙන්නක් නොවේ. පුද්ගලික අංශයේ වෘත්තීය සමිති වල තවදුරටත් වාමාංශික පක්ෂ වලට සම්බන්ධ වූ වෘත්තීය සමිති වලට බලය ඇත්තේ එබැවිනි.

**"අප සිටිය යුත්තේ බලය ඇති පක්ෂය සමඟය" යන මතය කම්කරු පංතිය අතර ප්‍රචලිත වීමට මූලික වශයෙන්ම හේතු වූයේ සහාය දේශපාලනයයි.**

'අප සිටිය යුත්තේ බලය ඇති පක්ෂය සමඟය' යන මතය කම්කරු පංතිය අතර ප්‍රචලිත වීමට මූලික වශයෙන්ම හේතු වූයේ සහාය දේශපාලනය යි. ඒ මගින් ඇතිකළ 'සමාජ සාමය' පිළිබඳ සංකල්පය යි. අපගේ 'ඉල්ලීම් දිනාගනු වස් සටන් කළ යුතු නැත. අසවල් ඇමැති සහෝදරයා මගින් අපේ ඉල්ලීම් ලබාගත හැක' යනුවෙන් කියමට කම්කරු පංතිය පොළඹවනු ලැබූයේ සහාය දේශපාලනය යි. මේ අනුව අපගේ ඉල්ලීම් දිනාගත හැකි වන්නේ ආණ්ඩුව සමග සටන් වැදීමෙන් නොව ආණ්ඩුවට සහයෝගය දීමෙන්ය යන අදහස කෙමෙන් කම්කරු පංතිය අතර තහවුරු විය. මෙම තත්ත්වය ඉතාම සංකීර්ණ වූවකි. කම්කරු පංතියේ පන්ති විඥානය සමගද මෙය සම්බන්ධ වෙයි. කම්කරු පංති විඥානය එක එල්ලේ සරල රේඛීයව වර්ධනය වන ප්‍රපංචයක් නොවේ.

තමන්ගේ සමාජයේ ආර්ථික ක්‍රියාවලිය තමන් විසින්ම කොතෙක් දුරට තේරුම් ගන්නවාද යන්න මත අවසාන විග්‍රහයේදී ඕනෑම කම්කරු පන්තියක පංති විඥානය කොපමණද යන්න තීරණය වෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් නම් යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් ලෙස 1850 ගණන් වලදී ලංකාව තුළ යටත් විජිත ආර්ථිකය වර්ධනයවූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් කම්කරු පන්තියක් බිහිවුනා. අරගල ගණනාවකින් පසු 1930 ගණන් වන විට මෙම කම්කරු පන්තිය විසින් එම ආර්ථික ක්‍රියාවලිය තේරුම් ගෙන තිබුණා. එම තේරුම් ගැනීම නිසායි වාමාංශික ව්‍යාපාරය කම්කරු පංතිය අතර ශක්තිමත්ව තහවුරු වූයේ. 1956 න් පසු නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියද බොහෝ දුරට ඉවත් කොට රාජ්‍ය අංශය ශක්තිමත් කරන ලදී. එනම් එතෙක් පැවති ආර්ථිකය වෙනස් වීමකට ලක්විය. මීට සාපේක්ෂකව කම්කරු පන්තියේ පංති විඥානය පහළ වැටුනි. ලංකාවේ කම්කරු පංතියේ පංති විඥානය ඉහළම අවස්ථාව හැටියට හැඳින්විය හැක්කේ 1940 හා 1950 මුල් භාගයයි. ඉන්පසු රාජ්‍ය අංශයේ කර්මාන්ත පුළුල් වීමත් සග එම පන්ති විඥානය පහළ බැසීමක් සිදුවිය.

මෙයට හේතු ගණනාවක් තිබෙනවා. රාජ්‍ය අංශයේ කර්මාන්ත තමන්ගේ යැයි කම්කරු පන්තිය කල්පනා කළ අතර මෙම නව ආර්ථික ස්වරූපය 'සමාජවාදය' යනුවෙන් පටලැවිල්ලක්ද ඇති කරගනු ලැබුවා. කෙසේ වුවද මේ වනාහි අප විසින් දිනාගත්තා ලද ජයග්‍රහණයක් යැයි කම්කරු පන්තිය සිතන විට එහි සත්‍යයක් නො වූයේද නැත. උදාහරණයක් වශයෙන් ගතහොත් බස් ජනසතු කිරීමට පෙර බස් සමාගම්වල තිබූ වාමාංශික වෘත්තීය සමිති වල ප්‍රධාන සටන් පාඨයක් වූයේ 'බස් සමාගම් ජනසතු කළ යුතුය' යන්නයි. මෙවැනි සංකීර්ණ තත්ත්වයක් තිබූ හෙයින් ධනේශ්වර ආණ්ඩුව විසින් රාජ්‍ය අංශය පුළුල් කරන විට කම්කරු පංතිය අතර මිථ්‍යා මත ප්‍රචලිත වීම අනපේක්ෂිත දෙයක් නොවේ. අනෙක් අතට රාජ්‍ය අංශය පුළුල් කරන විට කම්කරු පංතියද ප්‍රමාණාත්මකව පුළුල් කරන විට කම්කරු පංතියද ප්‍රමාණාත්මකව පුළුල් වන අතර එසේ පුළුල් වීම ග්‍රාමීය පෙදෙස් වලින් විශාල ලෙස ඇදුනු ග්‍රාමීය පිරිස් වලින් සම්පූර්ණ විය. මෙම නව කම්කරු පිරිස් කම්කරු නොවන ග්‍රාමීය මිශ්‍රණයකුත් සහිතව කම්කරු පංතියට එකතුවූ කොටස් වශයෙන් හැඳින්විය හැකියි. පංති විඥානය පහත බැසීමට මෙයද එක් ප්‍රධාන කාරණයක් වෙයි.

සාමාන්‍යයෙන් ඌන සංවර්ධිත රටක් වන ලංකාවේ පරිපූර්ණ වශයෙන්ම නිර්ධන පංතික නොවූ පිරිසක් සිටින බව අප තේරුම් ගත යුතුයි. සුළු දේපළක් හිමි පිරිසක් වන මොවුන් අතර ග්‍රාමීය සුළු දේපළ හිමි ස්තරයන්ට අයත් චින්තනයක් පවතිනවා. අනෙක් අතට ලංකාවේ මාර්ග පහසුකම් ඉහළවන අතර ගමන් ගාස්තු ඉතා පහළ බැවින් නගරයෙන් බැහැර සැතපුම් 30 - 40 ක තරම් දුරක ග්‍රාමීය පෙදෙස්වල සිට නගරයේ කම්හල් වල සේවයේ යෙදීම සඳහා ගැමි පෙදෙස් වල කම්කරුවනට පැමිණීමේ හැකියාව ඇත. මෙසේ එන කම්කරුවෝ එකම දවසේ අර්ථ ක්‍රම දෙකක ජීවත් වෙති. දිවා කාලයේ නාගරික නවීන ආර්ථිකයකත් එදිනම රාත්‍රියේ ග්‍රාමීය පසුගාමී ආර්ථිකයක ජීවත් වෙති. මේ ආකාර ලක්ෂණයන් ගෙන් යුක්ත වන කම්කරු පිරිසක් කම්කරු පංතිය අතරට පිවිසීමද පංති විඥානය පහළ වැටීමට හේතුවුනු කරුණකි.

ලංකාව වැනි ඌන සංවර්ධිත රට වල පංති ව්‍යුහය ඉතාමත් සංකීර්ණයි. ඇත්තෙන්ම ධනේශ්වර සංවර්ධනය ඉහළ මට්ටමකට සංවර්ධනය වූ රටවල් වල පංති සම්බන්ධතාවන් මේ තරම් සංකීර්ණ නැත. උදාහරණයක් වශයෙන් ග්‍රාමීයකරය ගතහොත් පන්ති සම්බන්ධතා ඇත්තේ ඉතාමත් සංකීර්ණ ආකාරයෙනුයි. එවැනි සමාජයක ඉහළ හා පහළ පන්ති අතර නොයෙකුත් පුරුක් සම්බන්ධතාවයන් පවතිනවා. මේ පුරුක් සම්බන්ධතාවන් දේශපාලනයේදී ඉතාමත් වැදගත් වෙයි. ගොවිජනතාව සහ ගැමි ප්‍රභූ පිරිස අතර ඇති සම්බන්ධතාවයන්ද මෙවැන්නකි.

1970 ගණන්වල මැද භාගය වන විට රාජ්‍ය අංශයේ කර්මාන්ත තමන්ගේ නොවන බව නැවතත් කම්කරු පංතිය තේරුම්ගෙන තිබුන අතර එම කාලය තුල සිදුවූ වැඩ වර්ජන ගණනකින් මේ බව සනාථ වෙයි. මෙයින් පෙනී යන්නේ නැවතත් කම්කරු පන්තියේ පංති විඥානය යලි නැගීමක් සිදු වූ බවයි. එහෙත් 1977 න් පසු එ. ජා. ප. ආණ්ඩුව විසින් හඳුන්වා දුන් විවෘත ආර්ථිකයෙන් පසු නැවතත් පන්ති විඥානය පහත වැටුනා. මෙයින් පෙනෙන්නේ පංති විඥානය සරල රේඛීයව වර්ධනය නොවන බවයි.

කෙසේ වුවද පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති වල බලයේ ඇති පංතිය වශයෙන් ගත් කල්හි එ. ජා. පයේ හෝ ශ්‍රී. ල. නි. පයේ බලය ස්ථාපිත වී නැත. ඇත්තෙන්ම ඔවුන්ගේ බලය පවත්වා ගන්නට තරම් සාර්ථක කම්කරු සමිතියක් හෝ පෞද්ගලික අංශය තුළ ඔවුනට නැත.

### නිදහස් ආර්ථිකය

තතු මෙසේ නම් රාජ්‍ය අංශයට අයත් සංස්ථා දෙපාර්තමේන්තු ආදිය ආණ්ඩුව විසින් පෞද්ගලික අංශයට පවරනු ලබනවාට එරෙහිව වාමාංශික පක්ෂ විසින් උද්ඝෝෂණය කරන කල්හි නැවත වතාවක් පැරණි මායා මිතය එහි උද්ඝෝෂණ තුළ අඩංගු නොවන්නේද? යන ප්‍රශ්නය මෙහිදී මතුවේ. ඇත්තෙන්ම

මෙහිදී යම් මායාමතයක් අඩංගුවන බව කිව යුතුයි. යම් ධනේශ්වර රජයක් යටතේ පවතින රාජ්‍ය අංශය වනාහී එම ධනේශ්වර ආන්ඩුවේ අංශයක් විනා අතරමැදි අංශයක් නොවේ. එය රාජ්‍ය ධනවාදය වශයෙන් හැඳින්වීමට හැකිය. නමුත් ඕනෑම රටක ධනේශ්වර ආණ්ඩුවක් විසින් පවත්වාගෙන යෑමට බැඳී සිටින ඇතැම් සේවාවන් තිබෙනවා. දුම්රිය බස්වැනි ප්‍රවාහන සේවාවන්ද අධ්‍යාපන - සෞඛ්‍ය හා පණිවුඩ හුවමාරු වැනි සේවාවන්ද මීට උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

මෙම සේවාවන් ලාබ ලැබීමේ පරමාර්ථයෙන්ම පවත්වාගෙන යන ඒවා නොවේ. බොහෝ රටවල දුම්රිය සේවාවන් පවත්වාගෙන යනු ලබන්නේ පාඩු ලබමින්ය. මෙවැනි සේවාවන් පෞද්ගලික අංශයට පැවරීමට උත්සාහ දරණ විට ඊට එරෙහිව කරණ උද්ඝෝෂණයන් අත්‍යාවශ්‍ය උද්ඝෝෂණයන් වෙයි. නමුත් ලංකාවේ රාජ්‍ය අංශය වශයෙන් ගත්කල ප්‍රධාන කාර්මික නිෂ්පාදන අංශද ඊට අයත්ය. වානේ, පිගන්, ටයර්, කඩදාසි, සිමෙන්ති කර්මාන්ත ආදිය මීට උදාහරණ වශයෙන් පෙන්වා දියහැකිය. ඉහත දැක්වූ ආකාරයේ උද්ඝෝෂණ මගින් "මේ අපගේ දේපලය අපගේ ජයග්‍රහණයන්ය" යන මිතය කම්කරු පන්තිය වෙත යලි ගමින් ගන්නා මුත් දැනට කම්කරු පන්තිය අතර එවැනි මතවාදයක් නැත. 1956 - 1970 දක්වා කාලය තුලයි එම මතවාදය කම්කරු පන්ති අතර තිබුණේ.

නමුත් අපගේ සැලකිල්ලට ලක්විය යුතු මෙම ප්‍රශ්නයේ තවත් පැත්තක් තිබෙනවා. 1956 න් පසු කාලය තුල ආන්ඩුව මැදිහත් වී කාර්මික ආයෝජන නොකලේනම් එවැනි කාර්මික අංශයක් අප රටේ ඇතිවීම ලංකාවේ ධනේශ්වර පංතිය අතින් ඉටු වන්නක්ද නොවීමයි. ඊට හේතු වන්නේ එවැනි කාර්මික ආයෝජනයන් කිරීමෙහි සමත් ප්‍රාග්ධන සංචයන් සහිත ධනේශ්වර පන්තියක් ලංකාවේ නොසිටීමය. අපට වානේ කර්මාන්තයක් හෝ සිමෙන්ති හෝ වෙනත් එවැනි කර්මාන්තයක් අවශ්‍ය වූයේ නම් එය ඉටුකරගත හැකි එකම මාර්ගය වූයේ ආණ්ඩුව මැදිහත් වී කරනු ලබන ආයෝජනය පමණි. සංස්ථා සම්බන්ධයෙන් බලන විට පෙනී යන තවත් විශේෂ අංශයක් වන්නේ එම ආයෝජනයන් හට යම්කිසි සමාජවාදී රටක්ද සම්බන්ධ බවයි.

### සංවර්ධන ආකෘතියක්

මෙය එක්තරා සංවර්ධන ආකෘතියක් වශයෙන් හඳුන්වන්න පුළුවන්. මෙම සංවර්ධන ආකෘතියේ ලක්ෂණ මෙසේ හැඳින්විය හැකිය.

* රාජ්‍ය අංශය ආර්ථිකයේ ප්‍රමුඛතාවය ගැනීම.
* ආයාත ආදේශන ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, එනම් හැකිතරම් ආයාතයන් නවත්වා රට අභ්‍යන්තර වෙළඳ පල සඳහා භාණ්ඩ නිපදවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
* මෙම සියල්ලම සමාජවාදී රටවල් වලින් ලැබෙන ආධාර වලට සම්බන්ධ වීම.

මෙය එක්තරා ආර්ථික ආකෘතියක් ලෙසද හැඳින්විය හැකිය. මෙම ආකාරයේ ආර්ථික ප්‍රතිපත්තියක් 1956 න් පසු ලංකාවේ තිබූ අතර ඊට සමාජවාදී රටවලින් අනුකූල භාවයක් තිබුනි. ධනේශ්වර නොවන සංවර්ධන මාවත ලෙස ජනප්‍රිය වූ පදය ජනිත වූයේ මෙම ආර්ථික හා සංවර්ධන ප්‍රතිපත්තිය හැඳින්වීමටය. රාජ්‍ය අංශය නැති නොකරණු ! යනුවෙන් වාමාංශික පක්ෂ හඬ නගන විට එහි සම්බන්ධතාවය සභාග ආණ්ඩු දක්වා ඈතට දිවෙයි. එනමුත් ධනේශ්වර නොවන සංවර්ධන මාවත තවදුරටත් වාමාංශික පක්ෂ විසින් පිළිගනු ලබන බවක් පෙනෙන්නට නැත.

කෙසේ වුවද ශ්‍රී. ල. නි. පය හා සභාග ආන්ඩුවක් ඇතිවීමට ඉඩක් නැත. එවන් සභාග ආණ්ඩු ඇති වීම සඳහා වූ ඓතිහාසික වටපිටාව සදහටම අවසාන වී ගොස් ඇති බව මෙහිදී කිව යුතුය.

යම් හෙයකින් පක්ෂ තුළේ කවුරු අතරින් මේ "සටන් පාඨය" මතු වීමට ඇතැම් විටක ඉඩ තිබුණද, සංවර්ධන ආකෘතියක් වශයෙන් ගත්කල එය තවදුරටත් ක්‍රියාත්මක කළ හැකි එකක් නොවේ. පක්ෂ තුළේ කවුල විසින් මේ වනතුරු එවැනි ආර්ථික සංවර්ධන ආකෘතියක් ඉදිරිපත් කර නොතිබීමෙන් පැහැදිලි වන්නේ ධනේශ්වර නොවන සංවර්ධන මාවත වශයෙන් හැඳින්වූ සංවර්ධන ආකෘතිය යලි ප්‍රතිස්ථාපනය කල නොහැකි එකක් බව ඇතැම්විට ඔවුන් තේරුම් ගෙන සිටින නිසා විය යුතුය. අනෙක් අතට ආයාත ආදේශ ආර්ථිකයක් ක්‍රියාත්මක කළ හැකිවන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව ආදියෙන් යම් ස්වාධීනත්වයක් ඇති ආර්ථිකයකට පමණයි. නමුත් වත්මන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ජාත්‍යන්තර ආයතන මත ලංකා ආර්ථිකයේ රඳාපැවැත්ම අතිශයින්ම වැඩි වී ඇත. එයින් මිදී නැවතත් පැරණි ආර්ථිකයට යාම ක්‍රියාත්මක කිරීමට හැකි වැයමක් නොවේ. ධනේශ්වර ක්‍රමයෙන්ම කැඩීම යන්න එකක්. එහෙත් ධනේශ්වර ක්‍රමය තුලම සිටිමින්, ධනේශ්වර නිෂ්පාදන හා ආර්ථික විධි තබාගනිමින් ඒ මත නැවතත් විවෘත ආර්ථිකයක් ආයාත ආදේශ ආර්ථිකයක් ක්‍රියාත්මක කිරීම කල නොහැක්කකි.

**කෙසේ වුවද ශ්‍රී.ල.නි.ප.ය හා සභාග ආණ්ඩුවක් ඇතිවීමට ඉඩක් නැත. එවන් සභාග ආණ්ඩුවක් ඇතිවීම සඳහා වූ ඓතිහාසික වටපිටාව සදහටම අවසාන් වී ගොස් ඇති බව මෙහිදී කිව යුතුය.**

### විඥාණය ඉහල නැංවීම

වර්තමාන තත්ත්වයන් ගැන සලකා බලන කල්හි මේ වන විට පහල බැස ඇති කම්කරු පන්තියේ පන්ති විඥාණය යලි ඉහළ නැංවීමට ඇති ඉඩකඩ වැඩි බව පෙනෙන්නට තියෙනවා. උද්ධමනය සමග සාපේක්ෂව බලන විට කම්කරු පන්තියේ නියත වැටුප් මට්ටම් එනම් මූර්ත වැටුප් මට්ටම් ඇත්තේ ඉතාම පහළ මට්ටමකයි. ඒ වගේම සේවා කොන්දේසි ද ඇත්තේ ඉතා අසතුටුදායක තත්ත්වයකයි. "අපගේ අයිතීන් දිනාගත හැක්කේ රජයට සහයෝගය දීමෙන් නොව රජය සමග සටන් වැදීමෙන්ය." යන අදහස කම්කරු පන්තිය අතරින් යලි මතු වී ආ යුතුයි. තමන්ගේ වැටුප් මට්ටම් ඉතාම පහල බවත් තවදුරටත් පහල යමින් ඇති බවත් කම්කරු පන්තියට අවබෝධ විය යුතුයි. තව මෙසේ හෙයින් කම්කරු පංතිය අතරින් සටන්කාමී එලඹීමක් මතු විය යුතුය. එවන් තත්ත්වයක් යටතේ දැනට වඩා මහා පරිමාණයෙන් කම්කරු පන්තිය දිනා ගැනීම සඳහා වාතාවරණයක් දේශපාලන කොණ්ඩු තුල වාමාංශික පක්ෂ වලට ලැබෙනු ඇතැයි විශ්වාස කල හැකියි.

### වමත් දකුණත් හා මැදත්

දැනට ලංකාවේ දේශපාලන වාතාවරණය තුල මැද බලවේග වල ඇති දේශපාලන අවකාශය ක්‍රම ක්‍රමයෙන් අඩුවීගෙන යන බව පෙනෙන්නට ඇති වැදගත් ලක්ෂණයකි. පසුගිය කාලයේදී පාර්ලිමේන්තු මැතිවරණ දේශපාලනය ආශ්‍රයෙන් වමත් - දකුණත් හා මැද

31 වැනි පිටුවට

# දේශපාලනය හා හූනියම්

**... මෙම අභිචාරයන් දේශපාලන වංචනිකත්වයේ මෙන්ම වංචනික දේශපාලන චර්යාවේද අංගයක් හා ප්‍රකාශනයක් බවට පත්ව තිබේ.**

**ආචාර්ය ජයදේව උයන්ගොඩ විසිනි**

ලංකාවේ දේශපාලන සංස්කෘතියට දැන් අලුත් අංගයක් එකතු වී ඇත. එනම් හූනියම් කිරීමයි. පාර්ලිමේන්තු දේශපාලනයත්, දේශපාලන හූනියමුත් එකිනෙකට සමාන්තරව මෙන්ම සහජීවනයේද යෙදෙන අවධියකට අපේ දේශපාලන පක්ෂ බොහොමයක්ම දැන් සම්ප්‍රාප්ත වී තිබේ. පාලක එක්සත් ජාතික පක්ෂය මෙන්ම විරුද්ධ පක්ෂද පසුගිය මාස කිහිපය තුළ දේශපාලන අරගලයේ යෙදුණේ කොඩිවින, පලි ගැහීම්, යාතිකා, දේව කන්නලව්, යනාදිය කරමිනි. ඒවායේ ප්‍රධාන අරමුණ වූයේ දේශපාලන එදිරිවාදීන් හා සතුරන්ට විපත් පැතීමයි. ඇතැම් දේශපාලන නායකයෝ තම ආත්මාරක්ෂාව වෙනුවෙන්ද එවැනි යාගහෝම වල යෙදුණහ.

මෙය බැලූ බැල්මටම හාස්‍යය දනවන කරුණක් විය හැකිය. එය එසේ නොවේ. දේශපාලනය ගැන උනන්දුව දක්වන්නන්ගේ බැරෑරුම් අවධානයට යොමු කළ යුතු ප්‍රපංචයකි.

ජනාධිපති ප්‍රේමදාස මහතා ඉවත් කිරීමට ඉදිරිපත් වූ දෝෂාභියෝග යෝජනා සමයේදී හූනියම්, යාගහෝම, පිදේනි සහ සත්ත්ව පූජා, ආදිය ගැන කට කතා බොහෝ පැතිර තිබිණ. විරුද්ධ පක්ෂ නායිකා බණ්ඩාරනායක මහත්මිය, දෝෂාභියෝග යෝජනාවට අත්සන් තැබුයේද නැකතකට අනුව යයි එකල ප්‍රචාරය විය. ජ්‍යෝතිශාස්ත්‍රය හා දේශපාලන ක්‍රියා මාර්ග අතර කොයිතරම් කිට්ටු සම්බන්ධයක් ලංකාවේ දැනට ගොඩ නැගී ඇත්දැයි අපි තවමත් හරියටම නොදනිමු. එහෙත් රටේ පැවති කට කතා විශ්වාස කරන්නේ නම් (ලංකාවේ දේශපාලන විග්‍රහයේදී කට කතා නැතුවම බැරි අංගයක් බවට දැන් පත්වී තිබේ). දෝෂාභියෝග යෝජනාව සාර්ථක වේ යැයි සමහර විරුද්ධ පක්ෂ නායකයින් විශ්වාස කිරීමට හේතුවක් වූ බව පෙනෙන්නේ ප්‍රේමදාස මහතාගේ කේන්ද්‍රයට අනුව ඒ මහතාට බරපතළ අපල කාලයක් 1991 සැප්තැම්බර් මාසයේදී පටන් ගන්නේය, යන විශ්වාසයයි. මේ අනාවැකිය මතම පිහිටා ප්‍රේමදාස මහතා ජනාධිපති මැතිවරණ පෙත්සමෙන්ද පරදිනවා ඇත යන විශ්වාසය විරුද්ධ පක්ෂ වල සමහර අය වෙත තිබිණ. සමහර පුවත්පත් වලද වාර්තාකර තිබුණ කරුණක් නම්, දෝෂාභියෝගය පිළිබඳ පාර්ලිමේන්තු විවාදයට සහභාගී වූ ඇතැම් මන්ත්‍රීවරුන්, තම ආසනවල හිඳගන්නට පෙර, කොඩිවිණ බලය නැතිවනු පිණිස, එම ආසනවල උරු තෙල් ආලේප කළ බවයි. Superstition යන ඉංග්‍රීසි වචනයෙන් හඳුන්වන්නේ අධි භෞතික බලවේග පිළිබඳව විශ්වාස කිරීමයි. දෙවියන්, යකුන්, පෙරේතයන් ගස් ගල් පර්වත ආදිය ගැන විශ්වාස කිරීම, ඒවා වන්දනා මාන කිරීම එවැනි බලවේග වලට තම ඉරණම පැවරීම යනාදිය මෙම ප්‍රපංචයට ඇතුළත් වෙයි. මෙය ඕනෑම සමාජයක පවතින සංස්කෘතික හා පුද්ගලික විශ්වාසයන්ය. ඒවා පුද්ගලික හෝ ආගමික මට්ටමෙන් පැවතීම අපි මෙහිදී ප්‍රශ්න නොකරමු. අප ප්‍රශ්න කරන්නේ, ඒවා දේශපාලන ක්‍රියාමාර්ග වලද අංගයක් බවට පත්වීමෙන් ඇතිවන දේශපාලන අන්තරායයි.

එක් පැත්තකින් මෙම අභිචාරයන් දේශපාලන වංචනිකත්වයේ මෙන්ම වංචනික දේශපාලන චර්යාවේද අංගයක් සහ ප්‍රකාශනයක් බවට පත්ව තිබේ. දේශපාලන බෝධිපූජා මෙයට හොඳම උදාහරණයයි. තනි පුද්ගලයකුගේ ආරක්ෂාව සඳහා මිනිසුන්, ගැහැණුන්, සහ ළමා ළපටියන් මෙන්ම දෙවි, දේවතාවුන්ද කැඳවීම මෙහිදී කෙරේ. එසේ වුවද මෑතකාලීන ලංකාවේ රාජ්‍යයේ ඇති වෙමින් පවතින සමහර වෙනස් කම් තේරුම් ගැනීමේදී නම්, මෙම බෝධිපූජා නමැති අභිචාරය (ritual)විග්‍රහ කිරීම වැදගත් වෙයි. ඒ සඳහා දේශපාලන මානව විද්‍යාත්මක ප්‍රවේශයක් අවශ්‍යය. ක්ලිෆර්ඩ් ගියර්ට්ස් (Clifford Geerts) නමැති ඇමෙරිකානු මානව විද්‍යාඥයා 19 වැනි සියවසේ ජාවා දූපතේ පැවැති රාජ්‍යය ගැන එවැනි විග්‍රහයක් කර ඇත. ඒ රාජ්‍යය රඟ මඩලක ස්වරූපයක් ගත් රාජ්‍යයක් වී යැයි ගියර්ට්ස් පෙන්වා දෙයි. විස්තීර්ණ රංග පද්ධතියකට සමාන දේශපාලන - රංගමය ක්‍රියාවලියක් තුළ රජුන් - ඔහුගේ නිලධර කන්ත්‍රයන්, පරිවාර සමාජ කන්ත්‍රයනුත් සංවිධානය වී සිටි හැටිද ඔහු විස්තර කරයි.

බෝධිපූජා ප්‍රපංචය, තවත් ප්‍රධාන දේශපාලන අභිචාරයන් (political rituals) දෙකක් සමඟ සම්බන්ධ වී තිබේ. එයින් පළමුවැන්න වර්ෂාරම්භයේදී පැවැත්වෙන පදවි ප්‍රාප්ත උළෙලයි. දෙවැන්න ගම්උදා සංවත්සරමහෝත්සවයයි. මේ තුනෙම ප්‍රකාශ වන්නේ නූතන ලංකාවේ රාජ්‍ය බලය රංගාවතන වීමේ (theatricalisation of state power) ක්‍රියාවලියකි. එය මට්ටම් කිහිපයකම ක්‍රියාත්මක වේ. 'රාජ්‍ය උත්සව' එයින් එකකි. නිල වශයෙන් රාජ්‍ය උත්සව නොවුවද, රාජ්‍ය පාලකයින් වෙනුවෙන් සංවිධානය කරන සෙත් පැතීම්, බෝධිපූජා, පෙරහැර යනාදිය තවත් එකකි. මේ ක්‍රියාවලියේ ඇති දේශපාලන අර්ථය නම් ආණ්ඩුව වෙනුවෙන් මහජනයා බලමුළු ගැන්වීමයි (mass mobilization) ප්‍රේමදාස මහතාගේ පාලන ශෛලිය සම්බන්ධයෙන් දිනපතාම පාහේ දකින්නට ලැබෙන, එහෙත් බොහෝ දෙනාට නොපෙනෙන ලක්ෂණයක් නම් මීට පෙර පැවති රජයන් මෙන් නොව මෙම රජය ජනයා බලමුළුගන්වා මෙහෙයවීම මත ප්‍රධාන වශයෙන් රඳා පවතින එකක්ය යන්නයි. ආණ්ඩුව වෙනුවෙන් පැවැත්වෙන අභිචාරෝත්සව ස්ථානගත කළ යුත්තේ එම සන්දර්භය තුළය. එක්තරා විධියකට මෙය වැඩවසම් රාජ්‍ය බලයේ උපායයන් පශ්චාත් යටත් විජිත රාජ්‍යය වෙතට යළි ගෙන ඒමකි.

දේශපාලන තරඟය වෙතට අභිචාරවිධි සහ උත්සව සම්බන්ධ කිරීමේ මූලික වශයෙන්ම ඇත්තේ නිර - ප්‍රජාතන්ත්‍රවාදී හරයකි. ආණ්ඩුව පැත්තෙන් මෙන්ම විපක්ෂය පැත්තෙන්ද මෙයට උදාහරණ සැපයේ. මව්වරුන්ගේ සංවිධානය වෙනුවෙන් සමහර විරුද්ධ පක්ෂ වල මෙහෙයවීමෙන් මෑතදී කෙරුණු දේව කන්නලව් සහ ශාප කිරීමේ උත්සව මෙයට ඇති ප්‍රධානතම උදාහරණයකි. 88 - 89 වර්ෂ වල ජවිපෙ සහ රජය අතර ඇතිවූ බිහිසුණු යුද්ධයේදී රජයේ හමුදා වෙතින් අතුරුදන් වූ තරුණ තරුණියන්ගේ මව්වරුන් ලවා ප්‍රසිද්ධියේම කාලි කෝවිල් වලට ගොස් ප්‍රේමදාස ජනාධිපති වරයාට ශාප කරවීම එය

32 පිටුවට

# නැගෙනහිර ජර්මනියේ නැගීම හා වැටීම

**හැන්ස් ඒ බායර් විසිනි**

**හැන්ස් ඒ බායර් (Hans A Baer) ඇමරිකා එක්සත් ජනපදයේ ලිට්ල් රොක්හි ආකන්සාස් (Arkansas) විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අංශයේ සේවය කරයි. මෙම ලිපිය ඇමරිකා එක්සත් ජනපදයේ පළවන Monthly Review නැමැති සමාජවාදී සඟරාවේ 1992 අප්‍රේල් කලාපයේ පළ වූ "The rise and fall of the German Democratic Republic" නමැති ලිපියේ පරිවර්තනයකි.**

නැගෙනහිර යුරෝපයේ ආර්ථික වශයෙන් වඩාත් සංවර්ධනය වූද දේශපාලන වශයෙන් වඩාත් ස්ථාවර වූද රට ලෙස සාමාන්‍යයෙන් සලකනු ලැබූයේ ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවයි. 1988 - 1989 වකවානුව තුළ හටගත් ඛේදජනක සිදුවීම් නොතකා පවා ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට අව්‍යාජ සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදයක් අත්පත් කරගත හැකි වූණි නම් එය අතිමහත් විභවතාවයකට තුඩු දෙන්නට අවකාශ තිබිණ. රුසියාව තුළ සිදුවූ වර්ධනයන් ගැන විශේෂයෙන් වැසියන් තුළ උනන්දුවක් තිබුණිද පාලක එක්සත් සමාජවාදී පක්ෂයේ නායකයෝ එම බලපෑම් යටපත් කිරීමට ක්‍රමානුකූල ප්‍රයත්නයක යෙදුණහ. "අපේ ගොර්බචොව් කොහෙද?" මේ බොහෝ ජර්මානුවන් ඇසූ ප්‍රශ්නයයි. එමෙන්ම මිත්‍ර මානවවාදී මුහුණුවරක් සහිත සමාජවාදයක් උදෙසා වැඩ කරන වඩාත් ප්‍රතිසංස්කරණවාදී තරුණ නායකත්වයක් මතුවන දිනය එනතෙක් බලා සිටියහ. බොහෝ ජර්මානු වැසියන් හුදෙකලා නිහඬතාවයට පසු බැසීම මගින් තම විසම්මුතිය හා විරෝධය පළකළ අතර මට හමුවූ ඇතැම්හු සමාජවාදී සමාජයක් බලාපොරොත්තුවෙන් අරගල කළහ. බර්ලින් තාප්පය කඩා වැටෙනු ඇතැයි බොහෝ දෙනෙකු සිතූ නමුත් අවුරුද්දක් ඇවෑමෙන් ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ෆෙඩරල් ජර්මන් සමූහාණ්ඩුවක් සමග නැවත එකතු වනු ඇතැයි කිසිවකු බලාපොරොත්තු වූයේ නැත.

ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය නිර්වචනය කරනු ලැබ තිබුණේ, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් සහ ඡන්දයෙන් තෝරාපත්කර ගනු ලැබූ ව්‍යවස්ථාදායකයක් සහිත, කම්කරු පන්තියත් එහි පක්ෂයේත් නායකත්වය වටා ගොඩනැගී තිබුණු බලආයතන වලින්ද සමන්විත "වර්ධිත සමාජවාදී රාජ්‍යයක් ලෙසය. එහෙත් ජර්මන් ජනරජයේ නොයෙක් බුද්ධිමත්හු මෙම නිර්වචනය ප්‍රශ්නයට භාජනය කළහ. සමාජවාදී එක්සත් පක්ෂයේ (S. E. D.) හිටපු සාමාජිකයකු හා හුම්බෝල්ට් (Humboldt) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පෙළේ රසායන විද්‍යාඥයකු වන රොබට් හැව්මන් (Robert Havemann) කියා සිටියේ ස්ටැලින්වාදී ආඥාදායකත්වයට දිගටම යටත්ව පැවැතීමේ හේතුව නිසා ප්‍රජාතන්ත්‍රවාදී සහ පාරිසරිකමය වශයෙන් සංවේදී සමාජවාදයක් බිහිවීමට බාධා වූ බවයි. සමාජවාදී එක්සත් පක්ෂයේ තවත් හිටපු සාමාජිකයකු හා ආර්ථික පරිපාලන වේදියකු වන රුඩොල්ෆ් බාරෝ (Rudolf Bahro), බටහිර ජර්මනියේ මුලින්ම පළ කරනු ලැබූ ග්‍රන්ථයක ප්‍රකාශ කර සිටියේ සෝවියට් දේශයේ හා නැගෙනහිර යුරෝපයේ "ඇත්තටම පවත්නා සමාජවාදය", අධිරාජ්‍යවාදී රාජ්‍යයක් මත පදනම් වී ආර්ථිකය මත ආධිපත්‍යය පවත්වාගෙන ගිය ආසියාතික නිෂ්පාදන මාදිලියට සමාන වූ බවය. ප්‍රති කේන්ද්‍රීකරණය කළ පක්ෂයක් හා ස්වභාවික පරිසරයට හා සමාජයීය අවශ්‍යතාවයන් යන දෙකටම සංවේදී වූ ආර්ථික සැලසුම්කරණයක් නැගෙනහිර ජර්මනියේ තිබිය යුතු යයි ඔහු තර්ක කළේය. ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී පක්ෂයේ (P. D. S. - S. E. D. පක්ෂයේ අනුප්‍රාප්තික පක්ෂය) සභාපතිව සිටි ග්‍රිගෝර් ගිසි (Gregor Gysi) ප්‍රමාද වී හෝ මෙසේ ප්‍රකාශ කළේය.

"ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ධනවාදී නොවූ නමුත් එය කිසිවිටෙකත් සමාජවාදයේ ගුණාංගයන් අත්පත්කරගෙන සිටියේ නැත. නිෂ්පාදන මාධ්‍යයන් ඉතා ඉහළ මට්ටමකින් සමාජසන්තක කොට තිබුණේ නැත. මන්ද යත් ජනතා දේපළ ලෙස අර්ථගන්වා තිබූ රාජ්‍ය දේපළ පාලනය කරනු ලැබුවේ සංකේන්ද්‍රගත ලෙස සංවිධානය කර තිබූ රාජ්‍යය විසින් බැවිනි. එහි තේරුම නම්, අවසාන විග්‍රහයේදී පක්ෂයේ නැතිනම් රාජ්‍යයේ නායකයා වූ පුද්ගලයා පමණක් දේපළ වල හිමිකරුවකු ලෙස සිතිය හැකි එකම පුද්ගලයා වීමයි."

ජර්මානු ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ සමාජවාදයේ පරාජයත් හා අවසානයේ එහි බිඳ වැටීම, පහත දක්වන ශීර්ෂ පහක් යටතේ සලකා බැලෙන සංකීර්ණ ඓතිහාසික සාධකයන් වෙතින් දැකිය හැකිය.

## 1. සීතල යුද්ධය

වෝල්ටර් ලැකර් (Walter Laquer) සඳහන් කරන ආකාරයට "පසුමිණු කොමියුනිස්ට් රාජ්‍යයක් සෑදීම පිණිස සෝවියට් දේශය විසින් නැගෙනහිර ජර්මනිය ජර්මනියෙන් කඩාවෙන්කර නිර්මාණය කරනු ලැබුවේය යන්න බොහෝ දෙනා අතර ප්‍රචලිත, එහෙත් වැරදි වටහා ගැනීමකි. මක්නිසාද යත්; ඇත්තවශයෙන් ගත්කළ ජර්මනියේ බෙදීම සිදු වූයේ දෙවන ලෝක යුද්ධයට පසු වර්ෂ වලදී බටහිර බලවතුන් හා සෝවියට් දේශය අතර ක්‍රමිකව වර්ධනය වූ සීතල යුද්ධයේ සන්දර්භය

තුළ නිසාය. වේගයෙන් පසම්තුරු බවට පත්වන බටහිර රාජ්‍යයන් හා සෝවියට් දේශය අතර ආරක්‍ෂක කලාපයක් නිර්මාණය කිරීමට ස්ටාලින්ට අවශ්‍ය විය. නමුත් වර්ධනය වන සෝවියට් කඳවුරට පහසුවෙන් ජර්මනිය ඇඳගත හැකිවේ යැයි ඔහු කිසිසේත් විශ්වාස නොකෙළේය. අවම වශයෙන් 1955 තෙක් හෝ සෝවියට් රුසියාව කෙළේ එක්සත් සහ මධ්‍යස්ථ ජර්මනියක් ගොඩ නැගීම සඳහා සැළසුම් යෝජනා කිරීමයි.

මේ අතර ඇමෙරිකා එක්සත් ජනපදය මුලදී කෙළේ එක්සත් ජනපද බ්‍රිතාන්‍ය, ප්‍රංශ සහ සෝවියට් කලාපය අතර දේශපාලන එක්සත් භාවයක් ඇතිකිරීමට ප්‍රමුඛත්වය දීම නොව ආර්ථික එක්සත් භාවයක් ඇතිකර ගැනීමට සහ නව ජර්මන් රජයට ෆෙඩරල් ක්‍රමයක් ලබාදීමට අනුබල දීමයි. එහෙත් 1948 පෙබරවාරි සිට මාර්තු දක්වා ලන්ඩන් සමුළුව පැවැත්වෙද්දී තමන්ගේ බලය යටතේ පැවැති ප්‍රදේශ එකතුකොට නව රාජ්‍යයක් පිහිටුවීමට, බටහිර මිත්‍ර පක්‍ෂයේ රටවල් එකඟවී තිබුණි.

ලන්ඩන් සම්මේලනයටත්, ඇතිවීමට යන බටහිර කලාප තුනේ මුල්‍ය ප්‍රතිසංස්කරණ වලටත් විරෝධය පාමින් සෝවියට් මාර්ෂල් සොකොලොව්ස්කි (Sokolovsky) මාර්තු වල පැවැති මිත්‍ර බලවතුන්ගේ හමුදා ප්‍රධානීන්ගේ රැස්වීමෙන් නැගිට ගියේය. තමන්ගේ බලය යටතේ පැවැති කලාප සඳහා ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට මිත්‍ර බලවතුන් ජූනි මාසයේදී එකඟ වූ අතරම, ඔවුහු එම කලාප වල පැවැති මුදල් ඒකකය වූ රයිස්ස්මාක් අවලංගු කොට ඒ වෙනුවට ඩොයිෂ්මාක් (Deutchmark) හඳුන්වා දුන්හ. මේ වර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන් සෝවියට් දේශය කෙළේ ජූනි 24 වනදා සිට බටහිර බර්ලින් වෙත ඇති සියළු මහා මාර්ග, දුම්රිය මාර්ග හා උමං මාර්ග වසා දැමීමය. එසේ වුවත්, බටහිර බලවතුන් බර්ලිනය වෙත ගුවන් ගමන් සැපයීම නිසා මෙම සෝවියට් ක්‍රියා මාර්ගය දුර්වල කෙරුණු අතර, බලවතුන් හතර දෙනාගේ එකඟත්වය අනුව මාර්ග වසා දැමීම අවසන් කරනු ලැබිණ. 1949 ඔක්තෝබර් 07 වන දින ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව පිහිටුවනු ලැබුවේ සැප්. 24 දා ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව පිහිටුවීමට

> **ඇමරිකා එක්සත් ජනපදය මුලදී කෙළේ බටහිර කලාපය හා සෝවියට් කලාපය අතර දේශපාලන එක්සත් භාවයක් ඇති කර ගැනීමට ප්‍රමුඛත්වයක් දීම නොව ආර්ථික එක්සත් භාවයක් ඇතිකර ගැනීමට සහ නව ජර්මන් රජයට ෆෙඩරල් ක්‍රමයක් ලබාදීමට අනුබල දීමයි**

ප්‍රතිචාර වශයෙනි. ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව සියළුම ජර්මානු ජාතිකයන්ගේ ජර්මනිය යයි ප්‍රකාශ කරන ලද අතර, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ජෝන් ෆොස්ටර් ඩලස්, ජර්මනිය නැවත සන්නද්ධ කිරීමේ වැඩපිළිවෙල පෙරට දැමුවේය. මිතුරන් නිරීක්‍ෂණය කරන ආකාරයට, 1949 න් පසුව ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ මුළු ඉතිහාසයම ගෙවී ගියේ නැවත එක්සත් කිරීම යන ධජය යටතේ තමන් ගිල ගැනීමේ අභිප්‍රාය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ ජනගහණයෙන් විශාල හා සමෘද්ධිමත් අසල්වැසියාගෙන් එල්ලවූ බලපෑම් වලින් ආරක්‍ෂා වීම වෙනුවෙනි.

## 2. බැහැරින් පැමිණි විප්ලවය

ජ. ප්‍ර. ජනරජය මුල පටන්ම මුහුණ දුන් ප්‍රජාතනාවයේ අර්බුදය ආරම්භවූයේ සෝවියට් යුධ පරිපාලන දිස්ත්‍රික්කය හා සමාජවාදී එක්සත් පක්‍ෂය (S. E. D.) යන දෙගොල්ලන් නැගෙනහිර ජර්මන් වැසියන් මත ස්ටාලින්වාදී තන්ත්‍රයක් පැටවීමත් සමඟමය. 1945 වසන්තයේදී ජර්මනියේ දේශපාලන තත්ත්වය හා එහි අනාගත ඉලක්කයන් සම්බන්ධව සාකච්ඡා කරනු සඳහා රටින් පලා ගිය ප්‍රධාන පෙළේ ජර්මන් කොමියුනිස්ට්වාදීන් 150 ක් පමණ මොස්කව්හිදී රැස්වූහ. ප්‍රතිසංස්ථාපන කටයුතු වලට සහයවීම සඳහා සෝවියට් කලාපය තුළ ෆැසිස්ට් විරෝධී පක්‍ෂ ගොඩ නැගීමේ තම පිළිවෙත සෝවියට් යුද්ධ පරිපාලනය විසින් ජූනි 10 දා ප්‍රකාශයට පත් කරනු ලැබිණ. නැවත පිහිටුවන ලද බටහිර ජර්මනියේ ජර්මානු කොමියුනිස්ට් පක්‍ෂය (K. P. D.) මුලදී ඉලක්ක කෙළේ සමාජවාදය නොව, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ගොඩ නැගීමය. ජර්මන් කොමියුනිස්ට් පක්‍ෂයේ තර්කය වූයේ සුදුසු තත්ත්වයන් මුහුකුරා යෑමට පෙර සමාජවාදය ඇති කිරීම මගින් සිදුවනු ඇත්තේ බටහිර බලවතුන් බියපත් වීමත්, ඒ මගින් ජර්මනියේ කැඩිබිඳී යාමත් බවය. මීට ප්‍රතිවිරුද්ධ ලෙස සෝවියට් කලාපයේ තිබූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්‍ෂය යෝජනා කෙළේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී සමාජයක් ගොඩ නැගීමටය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්‍ෂයේ මෙම රුසියන් ස්ථාවරය 1945 අගභාගයේ පැවැති කම්කරු සභා නිලවරණයන්හිදී ඒය ලද ජයග්‍රහණයට පැහැදිලි ලෙසම දායක විය. ඒ අතරම විවිධ වාමාංශික කණ්ඩායම් "ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී සමූහාණ්ඩුවක් ගොඩනැගිය යුතු යයි කියා සිටියහ.

1946 අප්‍රියෙල් වලදී ජර්මන් කොමියුනිස්ට් පක්‍ෂය හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්‍ෂය ඒකාබද්ධ කර සමාජවාදී එක්සත් පක්‍ෂය (S. E. D.) ගොඩනගනු ලැබිණ. "සමාජවාදය සඳහා වූ ජර්මන් මාවත" සම්බන්ධයෙන් සමාජවාදී එක්සත් පක්‍ෂය සමඟ කළ කෙටි සාකච්ඡාවකින් පසු ස්ටාලින්, වෝල්ටර් උල්බ්‍රිච් (Walter Ulbricht) එම පක්‍ෂයේ ලේකම් ලෙස පත් කෙළේය. සෝවියට් පන්නයේ මාක්ස් - ලෙනින්වාදී පක්‍ෂයක් දක්වා සමාජවාදී එක්සත් පක්‍ෂය පරිණාමය වීමේදී, එහි සිටි, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්‍ෂයේ හිටපු සාමාජිකයෝද සමාජවාදය කරා ප්‍රජාතන්ත්‍රවාදී මාවතක් උදෙසා පෙනී සිට කොමියුනිස්ට්වාදීන් බොහෝ දෙනෙක්ද තෝරපා දමනු ලැබූහ.

නැගෙනහිර ජර්මනිය මත ආරෝපණය කරනු ලැබූ සෝවියට් මාදිලිය විසින් සමාජවාදී එක්සත් පක්‍ෂයේ නායකත්වය වෙත සපයන ලද්දේ දේශපාලන හා ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයට හාත්පසින්ම පරස්පර වූ සමාජය පිළිබඳ ප්‍රභූත්වවාදී (clitist) සංකල්පයකි. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී

**බර්ලින් තාප්පය ගොඩනැගීම පරාජය පිළිගැනීමේ අපකීර්තිමත් පාපොච්චාරණයක් විය. එය නැ. ජර්මනියේ වලංගු භාවය තහවුරු කිරීමට ගෙන ගිය ප්‍රචාරක යුද්ධයේ පරාජයක් විය.**

සමූහාණ්ඩු වැසියන් තුළ තිබූ උසස් අධ්‍යාපන මට්ටම හේතුවෙන්, මෙම පීතෘවාදී අධිපතිවාදය විසින් සමාජයේ ඇතිකරනු ලැබූ සමාජවාදී එක්සත් පක්ෂයේ නායක ප්‍රභූතන්ත්‍රය විසින් ගනු ලැබූ ස්ථාවරයන් පිළිබඳ බලවත් පිළිකුලක් සහ අප්‍රසාදයකි. තම රටේ සමාජවාදයේ පරමාදර්ශයනුත්, යථාර්ථයනුත් අතර බරපතල ප්‍රතිවිරෝධයක් පැවැති බවද ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩු වැසියෝ කල්පනා කළහ. 1980 ගණන්වල අගභාගයේ සෝවියට් සමූහාණ්ඩුවේ ඇතිවූ වෙනස්කම් පිළිබඳ තොරතුරු යටපත් කිරීමට සමාජවාදී එක්සත් පක්ෂයේ නායක තන්ත්‍රය ගත් වෑයම ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ සුජාත භාවය පිළිබඳ අර්බුදයට තුඩු දුන්නේය. මෙම ප්‍රභූන් විසින් ඊට පෙර දශක කීපයක් තිස්සේ සෝවියට් සංගමය සමාජවාදී ලෝකයේ නායකයා ලෙස හඳුන්වාදී තිබීමද මෙයට විශේෂ වශයෙන් හේතුවිය.

## 3. ආර්ථික දුෂ්කරතා 1945 - 1961

ආර්ථිකය පවත්වාගෙන යා හැකි මට්ටමකට ගැනීම පිණිස සෝවියට් බලය යටතේ තිබුණු ජර්මන් අන්තර් ව්‍යූහයන් කලාපයේ බරපතල ලෙස ප්‍රතිසංවිධානය කිරීමටත් නැවත ගොඩනැගීමටත් සිදුවී තිබිණ. ජර්මනියේ කර්මාන්ත හා ස්වාභාවික සම්පත් වලින් වැඩි ප්‍රමාණයක් සතුව තිබුණේ බටහිර ජර්මනිය අසේය. ඊටත් අමතරව, ප්‍රධාන පෙළේ විශේෂඥයින් සැලකිය යුතු ප්‍රමාණයක් සෝවියට් කලාපයෙන් පිටතට ඇදගෙන ඔවුන් තම සේවයට බඳවා ගැනීමට ඇමරිකා එක්සත් ජනපදයට හැකිව තිබිණ.

සෝවියට් දේශය යුද්ධය අවසානයේදී තමන්ට සිදුවූ අලාභහානි අගහිඟකම් නොතකාම ජර්මනියේ සෝවියට් කලාපයට හදිසි ආධාර සැපයීය. යම් සිසිදුරකට ස්වයංපෝෂිත තත්ත්වයක් වර්ධනය කර ගැනීම සඳහා වානේ කම්හල්, අතිරේක රසායනික හා යාන්ත්‍රික කම්හල් යනාදිය ගොඩනැගීමට නැ. ජර්මනියට සිදුවිය.

මේ උත්සාහයන් හේතුකරගෙන බටහිර කලාපයට වඩා වැඩි වර්ධනීය තත්ත්වයක් ඇතිකර ගැනීමට ආරම්භයේදී සෝවියට් කලාපයට හැකිවූ නමුත්, 1948 මැද භාගය වනවිට බටහිර කලාපය නැගෙනහිර කලාපය අභිභවනය කෙළේය. මාර්ෂල් සැලැස්ම හා අනෙකුත් ආධාර ක්‍රම යටතේ බටහිර ජර්මනියට නව යන්ත්‍ර සූත්‍ර, අමුද්‍රව්‍යයන් නොමිලේ ආහාර ද්‍රව්‍ය ලැබුණි. 1948 - 1953 දක්වා කාලය තුළ බටහිර ජර්මනියට ඇමරිකන් ඩොලර් බිලියන 3.3 ක් ඇමරිකා එක්සත් ජනපද ආධාර වශයෙන් ලැබුණි. සමහර විශේෂඥයින් පවසන්නේ ස්ටාලින්, මෙම මාර්ෂල් සැලැස්ම යුරෝපය මත ධනවාදී ආධිපත්‍යය ව්‍යාප්ත කිරීම හා සෝවියට් දේශයට තර්ජනය කිරීම අරමුණු කරගත් එක්සත් ජනපද උපාය මාර්ගයක් ලෙස සැලකූ නිසා නැගෙනහිර ජර්මනිය එම සැලැස්ම යටතේ ආධාර ලබා නොගත් බවයි. නමුත් අනෙක් අය අවධාරණය කරන්නේ ඇමරිකාව කිසිසේත්ම සෝවියට් කලාපයට ආධාර කිරීමට බැරෑරුම් ලෙස සිතාගෙනවත් නොසිටි බවයි.

1945 - 1953 අතර කාලය තුළදී සෝවියට් කලාපයෙන් හා ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයෙන් අයකරගත් යුද වන්දි නිසා සෝවියට් දේශය ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයට ලබාදුන් හදිසි ආධාරවල බලපෑම පවා අහෝසි විය. බටහිර ජර්මනියේ අන්තර් ව්‍යූහාත්මක පහසුකම් වලින් (පාරවල්, කම්හල්, ගොඩනැගිලි ආදියෙන්) නැතිකර දමා තිබුණේ 12% ක් පමණක් වූ නමුත් නැගෙනහිර ජර්මනියේ එම ප්‍රමාණය 26% ක් විය. කර්මාන්ත, දුම්රිය මාර්ග පතල් හා ආකර වල තර තිබූ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ගලවා දැමීමට අමතරව නැ. ජර්මනියේ කම්කරුවන් විශාල ප්‍රමාණයක් සෝවියට් සංගමයේ වැඩපළ වලට මෙහෙයට යවනු ලැබිණි.

එක් මූලාශ්‍රයකට අනුව නැ. ජර්මන් කලාපයට ගෙවන්නට සිදුවූ යුද වන්දිවල වටිනාකම 1947 වර්ෂයේ එම කලාපයේ නිෂ්පාදනයෙන් 33% ක් තරම් විශාල ප්‍රමාණයක් විය. 1953 ජුනිවල නැ. ජර්මනියේ කම්කරු කැරැල්ලක් හට ගැනෙන තුරුම සෝවියට් ආධාර නොග ලැබුණේ නැත.

මේ අතර, බටහිර ජර්මනියේ ආර්ථික ආශ්චර්යයෙන් වශීකෘත වීම, නැ. ජර්මනියේ දුබල ආර්ථික තත්ත්වය, සහ එහි රාජ්‍යයේ මර්දනකාරී ප්‍රතිපත්ති හේතුකොට ගෙන මිලියන තුනක් පමණ ජනකායක්, එනම් දළ වශයෙන් නැ. ජර්මන් ජනගහනයෙන් 1/6 ක් පමණ ප්‍රමාණයක්, 1945 - 1961 අතර කාලය තුළ බටහිර ජර්මනියට සංක්‍රමණය වීමට පෙළඹුණහ. ජෝන් ආර්ඩෝ (John Ardaugh) මේ සිදුවීම ගැන විස්තර කරන්නේ මෙසේය.

'පිටවූවන්ගෙන් අඩක් පමණ අවුරුදු 25 ට අඩු අය වූහ. සංක්‍රමණය වූ වැඩිහිටියන් අය අතර නැ. ජර්මනියට අත්‍යාවශ්‍ය වූ වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් හා වෙනත් විශේෂඥයෝ දහස් ගණනක් සිටියහ. පිටට ඇදී ගියේ රටේ ලේ සාරයයි. 1961 අගෝස්තු මාසයේදී සෝවියට් සහයෝගය මත බර්ලින් තාප්පය ගොඩනැංවීමට සහ බටහිර බර්ලිනය හරහා පලා යාමට තිබූ සහඳම මග ආවරණය කිරීමට උල්බ්‍රිච්ට සිදුවූයේ අන් සියලු කරුණකට වඩා මේ බුද්ධි ගලනයයි. බර්ලින් තාප්පය ගොඩ නැගීම, පරාජය පිළිගැනීමේ අපකීර්තිමත් පාපොච්චාරණයක් විය.'

එය ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවේ වලංගුභාවය ඔප්පු කිරීම සඳහා ගෙනගිය ප්‍රචාරක යුද්ධයේ දැවැන්ත පරාජයක් ලෙස පසුකාලෙක උල්බ්‍රිච්ම පුද්ගලිකව පිළිගෙන ඇතැයි කියැවේ.

## 4. විධානගත ආර්ථිකයේ ප්‍රතිවිරෝධයන් - 1961 - 1989

1961 දී බර්ලින් තාප්පය ගොඩනැගීමෙන් පසුව සහ දේශපාලන ස්ථාවරභාවය ඇති වී අවුරුදු කිහිපයකට පසුව ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව ආකර්ශනීය ආර්ථික වර්ධන කාල පරිච්ඡේදයකට ප්‍රවිෂ්ට වූවාය. මේ කාලයේදී ආර්ථික ප්‍රතිසංස්කරණ මාලාවක් අත්හදා බැලිණි. ඒ අනුව 1963 දී නව ආර්ථික ක්‍රමය (New Economic Sysem) ක්‍රියාත්මක කරන ලද අතර, ඒ මගින් රාජ්‍ය ව්‍යවසායයන්ට තීරණ ගැනීමේ වගකීම යම් දුරකට පැවරිණි. ලාභය මූලික ආර්ථික ලීවරයක් ලෙසද සලකනු ලැබිණි. 1967 දී පැවැත්වුනු හත්වැනි පක්ෂ සම්මේලනයේදී සමාජවාදී ආර්ථික ක්‍රමය නම් වූ පිළිවෙත ඇති විණ. ඒ මගින් නූතන විද්‍යාත්මක විධික්‍රමයන් වූ (Cybernetics, Systems theory) සහ පරිගණක විද්‍යාව ආර්ථික සැලසුම්කරණ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට ප්‍රයත්න දැරිණ. 1971 දී හොනෙකර්ගේ ආණ්ඩුව ප්‍රකාශ කර සිටියේ තමන් ආර්ථිකයේ මූලිකතම කාර්යය එනම් ජනතාවගේ ද්‍රව්‍යමය හා සමාජමය උවමනාවන් ඉටුකිරීමේ කාර්යය වෙත ඇපකැපවී සිටින බවය.

> **හැටේ දශකයේදී නැ.ජර්මනියේ "රතු ආර්ථික ආශ්චර්යයක්" සිදුවූ අතර ලෝක බැංකුවට අනුව එය 1980 දී ප්‍රධාන කාර්මික රටවල් අතර 10වන ස්ථානයට පත්ව තිබිණි.**

1960 දශකයේදී නැගෙනහිර ජර්මනිය තුළ "රතු ආර්ථික ආශ්චර්යයක්" සිදුවූ අතර ඒ කාලය තුළ එම රට නැගෙනහිර යුරෝපීය ආර්ථික හවුලේ (COMECON) සමෘද්ධිමත්ම සාමාජික රට බවට පත්විය. ලෝක බැංකුවේ සංඛ්‍යා ලේඛන වලට අනුව නැගෙනහිර ජර්මනිය 1980 දී ප්‍රධාන කාර්මික රටවල් අතර 10 වන ස්ථානයට පත්ව තිබිණ.බටහිර ජර්මන් "ආර්ථික ආශ්චර්යයේ" පසු බැසීම් කාලය වූ 1960 - 67 වකවානුවතුළ බටහිර ජර්මනියට වඩා ඉහළ ආර්ථික වර්ධන අනුපාතයක් (වාර්ෂිකව 5% පමණ) අත්පත් කර ගැනීමට නැගෙනහිර ජර්මනියට හැකිවිය. 1960 දශකය හා 1980 දශකය අතර කම්කරුවන්ගේ සාමාන්‍ය මාසික ආදායම දෙගුණ විය.

සෝවියට් ආර්ථිකය ප්‍රතිසංස්කරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව හෝඩුවාවක් ලබාගැනීම සඳහා ගොර්බචොව් හා අනෙක් සෝවියට් නිලධාරීන් නිතරම බැලුවේ නැගෙනහිර ජර්මනියේ ආර්ථික ක්‍රමය දෙසය. ගෝල්ඩ්මන් සඳහන් කරන්නේ "නැගෙනහිර ජර්මනියේ සිදුවූ දෙය ජර්මානු කාර්යක්ෂමතාවය හේතු කරගෙන සිදුවූවක්ද එසේත් නැතහොත් නැගෙනහිර ජර්මනිය මධ්‍යම සැලසුම් ක්‍රමයක් සොයාගෙන තිබීම නිසා සිදුවූවක්ද යන්න කීම අපහසු" බවයි.1960 ගණන් වල අග භාගයේදී නැගෙනහිර ජර්මනිය එකිනෙකට සම්බන්ධ ව්‍යවසායන් ඒකාබද්ධ කරන සංගතයන් (Kombnatc groupings) ඇති කිරීමටපටන් ගත්තාය. 1986 වනවිට, සාමාන්‍යයෙන් එකක කම්කරුවන් 25000 ක් පමණ වැඩකළ සංගතයන් (Kombinatc) ජාතික මට්ටමින් 132 ක්ද ප්‍රාදේශීය මට්ටමින් 93 ක්ද පිහිටුවා තිබුණි.

නමුත් නැගෙනහිර ජර්මනියේ ආර්ථික ආශ්චර්යය සිදුවන ගමන්ම විධානගත ආර්ථිකය තුළ පැහැදිලිවම පෙනෙන ප්‍රතිවිරෝධතාවයන් ගණනාවක් තිබුණි. සැපයුම් ඌනතාවයන්, ප්‍රවේශම්කාරී කලමනාකරණ ප්‍රතිපත්ති සහ පැය 8 3/4 ක්වූ දීර්ඝ වැඩ දිනය යන මේවා නිසා කම්කරුවන්ගේ උද්‍යෝගය හීන විය. ශ්‍රම ඵලදායීතාවය බටහිර ජර්මනියේ ප්‍රමාණයෙන් 2/3 ක් පමණ විය. අන්තිම දශක දෙක තුළදී, දියුණු ධනපති රටවලින් විශේෂයෙන්ම බටහිර ජර්මනියෙන් දියුණු තාක්ෂණය වැඩි වැඩියෙන් ආනයනය කිරීමට නැ. ජර්මනියට සිදුවිය. මේ නිසා ඩොලර්, ස්ටර්ලිං, පවුම් වැනි ශක්තිමත් මුල්‍ය සංචිතයන් රැස්කර ගැනීමට බලකෙරුණු අතර, එහි ප්‍රතිඵලය වූයේ ධනවාදී ලෝකය මත ආර්ථික පරායත්තතාවයක් ඇති වීමයි.

1973 දී සිදුවූ තෙල් මිල ඉහළ යාමත් 70 දශකයේ අග භාගයේ ඇතිවූ ලෝක ආර්ථික අවපාතයත් නැගෙනහිර ජර්මන් ආර්ථිකයට ඉතා නරක ලෙස බලපෑවේය. 1970 තරම් ඈත කාලයකදීම නැගෙනහිර ජර්මනිය බටහිරත් සමග වෙළඳ ශේෂ පරතරයක් පෙන්වීමට පටන් ගෙනතිබිණි. 1975 න් පසුව සෝවියට් දේශය සමඟද වෙළඳ පරතරයක් හටගෙන තිබිණි. තම අමුද්‍රව්‍ය ලෝක වෙළඳ පොළ තුළ ඉහළ මිලකටත් ශක්තිමත් විදේශ මුදල්වලටත් අලෙවි කරගත හැකි වූ නිසා සෝවියට් දේශය කෙලේ එම අමුද්‍රව්‍ය නැ. ජර්මනියට විකිණීමට වඩාත් මැලි වීමයි.

දේශීය බලශක්ති ලබාගැනීමටත් බලශක්ති සම්පත් ආනයනය කිරීමටත් ගිය අධික වියදම, බටහිර බැංකු වලට ණය ගෙවීම් වස් විදේශ විනිමය ලබා ගනු සඳහා ඉහළ මට්ටමේ පාරිභෝගික භාණ්ඩ බටහිරට අපනයනය කිරීම සහ නිවාස, ආහාර සහ සමාජ සේවාවන් වෙනුවෙන් රජයට දරන්නට සිදුවූ අධික සහනාධාර පිරිවැය යන මේවායේ ප්‍රතිඵල වූයේ, බොහෝ නැගෙනහිර ජර්මන් වැසියන් තමන්ට අනිවාර්යයෙන්ම හිමිවිය යුතු යයි සිතාගෙන සිටි, ඉහළ ජීවන මට්ටම් ගරා වැටෙන්නට පටන්ගැනීමය.

### (5) පාරිභෝජන සංස්කෘතිය

බොහෝ පශ්චාත් විප්ලවීය සමාජයන් තමන්ගේ මුළු ජීවන කාලය පුරාම කාර්මිකකරණ ක්‍රියාදාමයක යෙදුණේ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ තලයකට නැංවීම සහ ධනවාදී ලෝකයෙන් එල්ල විය හැකි සතුරු උපද්‍රව සඳහා මුහුණ දිය හැකි මිලිටරි බලයක් වර්ධනය කර ගැනීම යන අරමුණු දෙක අරභයාය. විධානගත ආර්ථිකයන්ගේ කොන්දේසි සහිත සාර්ථකත්වය විසින් සෝවියට් සන්ධානය නැටෝ සංවිධානයට සමාන යුදශක්තියක් ගොඩනගනු ලැබුවේ පාරිභෝගික භාණ්ඩවල බරපතල හිඟයක්ද ඇති කරවමිනි.

බටහිර ජර්මනියේ 1950 ගණන් වල ඇති වූ ආර්ථික ආශ්චර්යය නිසා බොහෝ නැ. ජර්මන් වැසියෝ බ. ජර්මනිය වෙතට දිගටම ඇදී ගියහ. 1961 බර්ලින් තාප්පය ඉදිකිරීමෙන් පසු සමාජවාදී එක්සත් පක්ෂය (S.E.D.) කෙලේ "පරිභෝජන සමාජවාදය" (Consumer Socialism) මගින් ජනතාව සැනසීමට උත්සාහ ගැනීමය. එහෙත් බොහෝ නැගෙනහිර ජර්මානුවන් බටහිර ජර්මන් ජනමාධ්‍ය මගින් අතිශයෝක්තියට නංවන ලද සහ බටහිර ජර්මනියේ සිය ඥාතීන්ගෙන් ආරංචි වූ ධනවාදී පාරිභෝජන සංස්කෘතියට ඇදී යාම දිගටම සිදුවිය. අනෙකුත් පශ්චාත් විප්ලවීය රාජ්‍යයන්හි සිදුවූ පරිදිම "බටහිර ලෝකයේ මට්ටමට පත් වීමට" දැරූ උත්සාහයේදී සිදු වූයේ පරිසරයට බරපතළ ලෙස හානි සිදුකරමින් ආර්ථිකයේ අභ්‍යන්තර ව්‍යුහයන් දැරිය නොහැකි බරෙන් වෙහෙස වීමයි. ඒ අතරම රජය උත්සාහ කෙලේ පාරිභෝජන සංස්කෘතිය ප්‍රශ්න කළ සමාජවාදී එක්සත් පක්ෂයේ ප්‍රතිසංස්කරණවාදී සාමාජිකයින් මෙන්ම පරිසරවේදීන්ද මැඩ පැවැත්වීමටයි. මේ අතර වෝල්ස්වෝ මෝටර් රථ හිමි සහ බටහිර පරිභෝජන භාණ්ඩ රසවිඳින සමාජවාදී එක්සත් පක්ෂයේ ඉහළ නිලධර තන්ත්‍රය බටහිර ජීවිතය අනුකරණය කිරීමේ පුරෝගාමීන් වූහ. මෙහිදී බටහිර ජර්මනියට මෙන් නැ. ජර්මනියට, දකුණු යුරෝපයේ සහ තුන්වැනි ලෝකයේ ලාභ සම්පත් සහ ශ්‍රමය ලබා ගැනීමේ අවකාශ තිබුණේ නැත. ඇත්තටම බටහිර ජර්මනියේ

පාරිභෝගික භාණ්ඩ වල මිළ අඩුව පැවතීමට ප්‍රධාන හේතුවක් වූයේ මේ ලාභ සම්පත් සහ ශ්‍රමය ලබා ගැනීමට එයට තිබූ හැකියාවය. පීටර් මාර්කියුස් (Peter Marcuse) මේ ගැන නිවැරදිව කියා ඇති පරිදි, බටහිර ජර්මනිය, ස්විඩනය, සහ එක්සත් ජනපදය යන රටවල කාර්මික නිෂ්පාදනයේ කාර්යක්ෂම භාවයට හේතු වන්නේ ඒ රටවල් ජාත්‍යන්තර ශ්‍රම විභජනයෙන් ප්‍රතිලාභ ලබන නිසාය. ධනවාදී ජීවන තත්ත්වය පරිපූර්ණ පදනමක් මත ගණනය කරන්නේ නම්, එයට ස්විට්සර්ලන්තය මෙන්ම හයිටි දූපතද, එංගලන්තය මෙන්ම ඉතියෝපියාවද අධික වැටුප් ලබන (නිව්යෝර්ක්හි) වෝල් වීදියේ සුළු පිරිස මෙන්ම අඩුවැටුප් ලබන සහ මර්දනයට ලක්ව සිටින කොරියාවේ දශලක්ෂ ගණන් කම්කරුවන්ද ඇතුල් කිරීමට සිදුවනු ඇත.'

### නැගෙනහිර ජර්මනියේ බිඳ වැටීම

නැ: ජර්මනිය ප්‍රජාතන්ත්‍රවාදී කිරීමේ ව්‍යාපාරයේ ප්‍රධාන පුරෝගාමීන් වූයේ බුද්ධිමතුන්, ලේඛකයින්, ආගමික නායකයින්, සාම හා පරිසර ව්‍යාපාර වලට සම්බන්ධ වූවන්ය. බොහෝ දුරට මේ කණ්ඩායම් බලාපොරොත්තු වූයේ මානුෂික මුහුණුවරක් සහිත සමාජවාදයක් (Socialism with a Human Face) ඇති කිරීමටයි. ඊට අමතරව සමාජවාදී එක්සත් පක්ෂයේ පහළ සාමාජිකයන්ද පක්ෂයේ ප්‍රභූන්ගේ ආඥාදායක ප්‍රතිපත්තීන් විවේචනය කිරීමට පටන් ගත්හ. නව ආර්ථික විද්‍යාඥයින් පරිපූර්ණ කියා සිටියේ මධ්‍ය සැලසුම් ක්‍රමය හා වෙළඳ පොළ යාන්ත්‍රණය අතර සංයෝගයක් ඇති කළ යුතු බවය. දේශපාලන වශයෙන් ක්‍රියාකාරීව සිටි විවිධ විරුද්ධ පාර්ශවීය කණ්ඩායම් හා පක්ෂය තුළ සිටි ප්‍රතිසංස්කරණවාදී කොටස් මෙන් නොව සාමාන්‍ය මහජනතාව සිටියේ අපේක්ෂා භංගත්වයෙන් සහ පවුලේ අය, හිත මිතුරන් අතරත්, හුදෙකලා භාවය තුළත් පිළිසරණ සොයමිනි. ඒ අතර තවත් බොහෝ දෙනා සිටියේ පාරිභෝජන සංස්කෘතිය පිළිබඳ වූ නැගෙනහිර ජර්මානු මාදිලිය පිළිගත නිසාම නිකම් පරාජිත ස්වභාවකය.

වයස අවුරුදු විසි තිස් ගණන් වල සිටි නැගෙනහිර ජර්මානු වැසියන් විශාල සංඛ්‍යාවක් හංගේරියාව හරහාත් බුඩාපෙස්ට්, ප්‍රාග්, සහ වෝර්සෝ යන නගර වල බටහිර ජර්මන් තානාපති කාර්යාලයන්හි දේශපාලන රැකවරණ සොයා ගැනීම මගිනුත්, බටහිරට පැන යාමට පහසු මගක් සොයා ගත් පසු ස්ථාවරයයි මතු පිටින් පෙනුණු නැගෙනහිර ජර්මන් ආර්ථිකය කඩා වැටීම ඇරඹිණ. රාජ්‍ය ව්‍යාපාර වල හා කාර්යාලවල කටයුතු තවදුරටත් සාමාන්‍ය පරිදි කරගෙන යා නොහැකි විය. 1989 ඔක්තෝබර් 18 වැනිද ජර්මන්

**බටහිර ලෝකයේ මට්ටමට පත්වීමට දැරූ උත්සාහයේදී සිදු වූයේ බරපතල ලෙස හානි සිදු කරමින් ආර්ථිකයේ අන්තර් ව්‍යුහයක් දැරිය නොහැකි බරෙන් වෙහෙස වීමයි.**

ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව රැකගැනීමේ උත්සාහයක් වශයෙන් දේශපාලන මණ්ඩලය කලක් රෝගී වී සිටි හොනෙකර් වෙනුවට ඔහුගේ අනුප්‍රාප්තිකයා ලෙස පෙනුණු ඉගොර් ක්‍රෙන්ස් (Egor Krenz) පත් කිරීමටයි. මෙම තීරණයට විරෝධය පළකරමින් නොවැම්බර් 7, 8 දිනවල සිදුවූ මහජන උද්ඝෝෂණ හා පෙළපාලි වලට පසුව දේශපාලන මණ්ඩලය ඉල්ලා අස්විය. ඉන්පසු පක්ෂයේ ප්‍රතිසංස්කරණවාදී නායකයෙකු වූ හැන්ස් මොඩ්රෝ (Hans Modrow) ප්‍රධාන ලේකම් ධූරයට පත්වූ අතර ඔහු විසින් අලුතෙන් පනවන ලද සංචාරක හා ආගමන විගමන රෙගුලාසි ද, නිදහස් හා රහස් මැතිවරණ පැවැත්වීමේ පොරොන්දුවද, බටහිර ජර්මනිය සමග 'ප්‍රජා සම්මුතියක්' (Cotractual Community) පිහිටුවන බවටද නිවේදනය කෙරිණ. නොවැම්බර් 9 වනදා බර්ලින් තාප්පය විවෘත කිරීමෙන් පසු එළඹි උද්දාමය තුළ ටික දිනක් යහතුරුම් පෙනුණේ විප්ලවය වෙතින් ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව තුළ අන්තිමේදී සමාජවාදී ප්‍රජාතන්ත්‍රයක් ගොඩනැගෙනු ඇත යන්නවේ. නිදහස් මැතිවරණයකදී ලැබිය හැකි ප්‍රතිඵල බටහිර ජර්මන් සඟරාවක් කළ දළ මහජන අදහස් විමසීමකදී අනාවරණය වූයේ නැ: ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය 20% කුත්, බටහිර ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍ර වාදී පක්ෂය (SPD) 15% කුත් NEW Forum සංවිධානය 14% කුත්, සමාජවාදී එක්සත් පක්ෂය 13% කුත්, බටහිර ජර්මන් CDV පක්ෂය 11% කුත්, නැගෙනහිර ජර්මන් CDV පක්ෂය 2% කුත් ලබා ගැනීමට ඉඩ ඇති බවය. මේ පසුබිම තුළ ගුනර් මිනරප් (Gunner Minnerup) කළ ශුභවාදී නිරීක්ෂණය මෙසේ විය.

'බටහිර ජර්මන් ධනපති පන්තිය විසින් තම රට ඈඳගනු ලැබීම ගැන නැ: ජර්මන් වැසියන් මෙතෙක් කල් වැඩි ආශාවක් දැක්වූයේ නැත. උල්බ්‍රිෂ්ට්ගේ සහ හොනෙකර්ගේ ඝෝර සමාජවාදයට විරුද්ධව ඔවුන් කළ විප්ලවයේ අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ ධනවාදී එක්සත් ජර්මනියක් නොවේ. 'විෂය මූලිකව' පමණක් නොව, දශලක්ෂ ගණන් නැගෙනහිර ජර්මන් වැසියන්ගේ සවිඥානක අභිප්‍රාය තුළ, 'මනෝමූලිකව' පවා ප්‍රකාශ වී තිබෙන කරුණ නම්, ජර්මන් පොළොව මත ගොඩ නගන ප්‍රජාතන්ත්‍රවාදී සහ සෞභාග්‍යමත් ජර්මන්, රාජ්‍යයක් සැබෑ විකල්පයක් වනු ඇත යන්නයි.'

සමාජවාදී එක්සත් පක්ෂයම ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී පක්ෂය යයි අළුත් නමක් ගත් නමුදු, 'අපි ජනතාව වෙමු' යන ජනප්‍රිය උද්ඝෝෂණ පාඨය ඉක්මනින්ම 'අපි එක්සත් ජනතාවක් වෙමු' යන්න බවට පත්විය. නැගෙනහිර ජර්මන් ජනයා පත්ව සිටි මානසික තත්ත්වයෙන් වහාම ප්‍රයෝජන ගැනීමට සිතූ බටහිර ජර්මන් චාන්සලර් කෝල් කෙළේ 'ගිවිසුමක් අනුව ප්‍රජාව' (Contractual Community) නම් මොඩ්රොව්ගේ යෝජනාවට ප්‍රතිපක්ෂව, ජර්මනි දෙක ඒකාබද්ධ කරනු සඳහා කරුණු දහයකින් යුත් වැඩ පිළිවෙලක් ඉදිරිපත් කිරීමයි. සියළුම නැගෙනහිර ජර්මන් ඉතිරිකිරීම් 1.1 අනුපාතයට හුවමාරු කර ගැනීමට අවකාශ ඇති බවට කෝල් දුන් පොරොන්දුව නිසා නැගෙනහිර ජර්මන් වැසියන්ගේ අතිවිශාල පිරිසක්, ජර්මනි දෙක ඒකාබද්ධ කිරීමට කැමැති වූ බව පෙනේ. ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ (CDU - චාන්සලර් කෝල්ගේ පක්ෂය ) නායකත්වය යටතේ ඇති සන්ධානය මගින් යෝජනා කරන ලද ඉක්මන් එක්සත් කිරීම් පිළිවෙත අනුමත කරමින් නැ: ජර්මන් වැසියන්ගේ අති බහුතරය 1990 මාර්තු 18 ද ඡන්දය පළ කළහ. දක්ෂිණාංශය ලැබූ මේ ජයග්‍රහණය කිසියේ වී නමුදු, බොහෝ නැ:ජර්මානුවෝ, තම රට ධනවාදී බටහිර ජර්මනියට මුළුමනින්ම බද්ධ වීමේ හැකියාව ගැන සැක පහළ කළහ. නැගෙනහිර බර්ලින් හි ඡන්ද දායකයෝ 35% ක් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයටද (SPD), 30 % ක් ප්‍රජාතන්ත්‍රීය සමාජවාදය සඳහා වූ පක්ෂයටද (PDS), 6% ක් Brndnis 90 නමින් හැඳින්වුණු New Forum, Democracy Now සහ Peace and Human Rights Initiative නම් සංවිධාන වල සන්ධානයටද ඡන්දය දුන්හ. එහෙත්, ජර්මනියේ දකුණේ ප්‍රාන්ත වල එනම් ඉතා දරුණු ලෙස පරිසර විනාශයට ලක්ව තිබුණු සැක්සනි සහ තුරින්ගියා වැනි කාර්මික ප්‍රදේශ වල, සමාජවාදී පක්ෂ වලට ලැබුණේ තීරණාත්මක පරාජයකි.

මැතිවරණයෙන් පසු ජර්මන් ෆෙඩරල් ජනරජයේ බැංකු කෝල්ගේ පොරොන්දුව කඩමින් කෙළේ තනිපුද්ගල වැඩිහිටි ඉතිරි කිරීම් වල ප්‍රථම Ostmarks 4000 සඳහා හුවමාරුව 1.1 අනුපාතයද හවුල් වන්නම්

31 වෙනි පිටුවට

# පශ්චාත් - යටත්විජිත සාහිත්‍යික පාඨනය පිළිබඳව සම්භාෂණයක්

> මිෂනාරි පාසැලක උගත් මම සතර අතින්ම බ්‍රවුන් සහිබ්ලා විසින් වටකරනු ලැබ උන්ගේ සංස්කෘතික භෝඩිය හදරමින් සිටියෙමි. මගේ මිතුරන් බොහෝ දෙනා බ්‍රවුන් සහිබ්ලාගේ පුතුන්ය. (සමහර පුතාලා අප්පලාටත් වඩා බ්‍රවුන් සහිබ්ලාය.)

**රංජිත් පෙරේරා විසිනි**

මා ඉපදුනේ කොළඹ නගරයේ වුවද මගේ ළමා කාලය සහ කණිෂ්ඨ පාසල් අවදිය ගෙවුනේ ලංකාවේ කඳුරට නිවාඩු නිකේතනය ලෙස හැඳින්වෙන නුවරඑළියෙය. මීට අවුරුදු දශක තුනකට හෝ හතරකට ඉහත නුවරඑළිය අද මෙන් නොවී, සංචාරක බැල්මෙන් දුවා හැළුව නොගොස් අසංවිධිත නවීකරණයේ මුද්‍රාවක් නොවී ස්වකීය හරිත මණ්ඩලය රැගෙන වැජඹෙන්නට එද නුවරඑළිය සමත්ව සිටි බව මා පවසන්නේ එහි අද ඉදිවී තිබෙන කෘත්‍රිම ප්‍රමිපත් සංචාරක පුරය හෙළා දැකීම සඳහා නොව, ඔබ සමග මා පැවැත්වීමට බලාපොරොත්තුවන සම්භාෂණයට මුලපිරීම සඳහාය. කොතෙකුත් ඇස ගැටුනත් මෙතුවක් අත නොගැටුණු නව යව්වනියන්ගේ දෙතන වැනි තණ දෙණි බෑවුම්, ගලන ඇළි දොළ, නොපෙරුණු නැඹිල් පස එදවස කොතෙකුත් එහි තිබිණ. මිතුරන් හා කැටුව පාසැල ඉහළින් පිහිටා තිබෙන ගෝල්ෆ් පිටිය හරහා ගලා ගිය දොළපහරේ ටුඩුව මිදුන් ඇල්ලූ හැටි, යහළු ජොකියන්ගේ අනුග්‍රහය යටතේ එවකට ප්‍රසිද්ධව සිටි අශ්වයන්ගේ පිට නැගී රේස් පිටිය වටේ රවුම් ගිය හැටි, බෝල අල්ලන කොළුවන්ට අල්ලසදී ගෝල්ෆ් පිති හා බෝල ඉල්ලාගෙන ගොල්ෆ් ක්‍රීඩා කළ හැටි, ගිරිගෝරිස් වැලේ බෝට්ටු පැද්ද හැටි සිහිපත්වන විට ආනන්දය නමැති ආස්ථානයේ නැවතී ගිමන් හරින්නට මගේ චින්තනයට අවසර මම ඉඩ නොදෙන්නෙමි. එය චමත්කාරය දක්වා කෙරපා තල්ලු කර හරින්නට යත්න දරන්නෙමි.

මිෂනාරි පාසැලක උගත් මම සතර අතින්ම බ්‍රවුන් සහිබිලා විසින් වටකරනු ලැබ උන්ගේ සංස්කෘතික භෝඩිය හදරමින් සිටියෙමි. මගේ මිතුරන් බොහෝ දෙනා බ්‍රවුන් සහිබිලාගේ පුතුන්ය. (සමහර පුතාලා අප්පලාටත් වඩා බ්‍රවුන් සහිබිලාය.) මවුන් සිංහල, දෙමළ, බර්ගර්, යුරේසියානු, මලයාලි ආදි වශයෙන් වර්ග කළ ජාතික ප්‍රභේද වලට අයත් වූවන්ය. ඇත්තෙනම් අප සියලු දෙනාම පාශ්චාත්‍ය ලෝකය පිළිබඳ තත්ත්වඥණය ලබාගන්නට වැයම් කළේ ඉංග්‍රීසි බස අසාමය ලෙස පිහිටා වූ සිංහලයන් දෙමළයන් පරිවාර කොට ගත් පරිසරයක් ඔස්සේය. අපගේ භාෂා ඥණය හොබ්සන් - ජොබ්සන් පද, කුප්පහි සිංහල හා අන්වර දෙමළ වලින් මොනවට සැදී තිබිණ. සංස්කෘතිකමය වශයෙන් අප වැඩිපුරම අයත් වූයේ මසාල සංස්කෘතියටය. එහෙත් මේ මසාල තුළ වැඩිපුරම විද්‍යාමාන වූයේ ඉංග්‍රීසි රිද්මය හා හඬ හා සියමන්ය, ඉංග්‍රීසි චරියාව හා චතාවකය.එදවස මා විඳි එක් අපූරු ආනන්දජනක අත්දැකීමක් මෙම සම්භාෂණයේ ප්‍රවේශය ලෙස යොදා ගැනීමට මා කැමතිය. ඇත්තෙනම මා පාසැල ඇරී ගෙදර ආ විට අපේ වත්තේ තිබූ සයිප්‍රස් ගස් රූප්පාව යටට වී කැරට් අල හෝ පෙයාර් ගෙඩි හෝ කමින් රඩියාඩ් කිප්ලින්ගේ හෝ ආර්. එම්. බැලන්ටයින් ගේ හෝ ඩැනියෙල් ඩිෆෝගේ හෝ වසඟයට මා නතු වූ ආකාරය විසින් පසුකාලයකදී පශ්චාත් යටත්විජිත සම්භාෂණයක් වෙත මා කැඳවාගෙන යනු ඇතැයි මම සිහිනෙන් නොසිතුවෙමි. කිප්ලින්ගේ ජන්ගල් බුක් සමග හාද වී සිටි මම වී විලි වින්කිට උපුරු කරමින් කිම් ට අත වැනුවෙමි. බැලන්ටයින් ගේ මැචස්කර් රිපීණ ට හාදුවක් දුන් මම පසුව කොරල් දූපතට ගොඩ බැස්සෙමි. එහිදී මට අතවැසිකම් කළේ ඩැනියෙල් ඩෙෆෝ ගේ ෆ්‍රයිඩේය! කොරල් දූපතේ ජැක්, රැල්ෆ් හා පීටර්කින් මගේම යහළුවන් බවට පත්වූයේ මවුන් ත්‍රිදෙක් සන්ත්‍රාසකාමයේ ගැළුණු යව්වනයින් වූ නිසාදැයි, නැත්නම් අවට දූපත්වල විසූ මිනිමස් කන පොලු හරඹ කරන හැඩිදැඩි කල්ලන් අබිබවා සිය බලපරාක්‍රමය පිහිටුවාලූ නිසාදැයි, හෝරාබේරා ගැනීම පිණිස මගේ පිතුවිලි පරපුරේ වංශ කතාව විදාරණය කරන්නට අද මම මහන්සි ගනිමි. මගේ වයසේ හෝ ඊට වඩා මදකවැඩි වයස් පරතරවල පසුවූ මේ කොලුවන් කලකුනා මිනිසුනට නායකත්වය දීම එද මගේ සිත්ගත් කාරණයක් විය. එපමණක් නොව මිනිමස් කන කොවිල් නටන හැඩි දැඩි හෙජ්වැලි ජවදේශික කාපිරියන් කෙරෙහි මසිනේ වැඩෙමින් පැවතුනේ පිළිකුල මිශ්‍ර ඇල්මැරුණු ආකල්පයක් බවත් අද මට සිහියට නගා ගත හැකිය. යටත් විජිත හා පශ්චාත් යටත් විජිත පාඨන විධික්‍රමය ඔස්සේ එම සාහිත්‍යය ගවේෂණය කරද්දී බැලන්ටයින්ගේ කෘතිය අධිරාජ්‍යවාදය හා වර්ගවාදය මූර්තිමත් කැරෙන අර්ථසම්පාදනයක යෙදෙන බැව් මොනවට අද මට පසක් වෙයි. කොරල් දූපත්වල වාසය කරන හැඩි දැඩි කාපිරියන්ගේ මානසිකත්වයට මහ පෙන්වීමක් අවශ්‍යය - එබැවින් යුරෝපීය යව්වනයින් කිදෙනෙකුට වුවත් ඔවුනට නායකත්වය දිය හැකිය. බැලන්ටයින්ට අනුව 'කාපිරියා පිළිබඳ හොඳ විමර්ශණයක් මිනැය, එමෙන්ම හොඳ පුහුණුවක් ද උනුට අවශ්‍යය. මන්ද සිව්හොත් කායික බලය හා කපටිකම හැරෙන්නට උනු නැම අතින්ම අඳුරුවෙකු නිසාය. ශිෂ්ඨසම්පන්න පුද්ගලයන් සමග එක හා සමානකොට කාපිරියාට සැලකීම කලු තිරි කොල්ලන්ට සර්වජන ඡන්ද බලය දීම හා සමානය' යව්වන අවදියෙහි

මා ඇසුරු කළ බැලන්ටයින් වර්ගවාදියෙකැයි අද මා නිගමනය කරන්නේ ඔහුගේම කියමන් හේතුකොටගෙනය. "මිලේච්ඡයන් ගෙවන පහත් පෙළේ දිවිය ගැන නොකවාරයක් මම කියවා අසා ඇත්තෙමි. මේ ජීවන ලක්ෂණයන් උතුරු ඇමෙරිකාවේ වෙසෙන 'රත්තන්' අතරත් තිබෙනවා දැක ඇත්තෙමි.නමුත් මේ මිනිස් ගොරිල්ලන් අතරේ දකින්නට ලැබුණු අන්දමේ වනචරකම් නම් මගේ උපන්දෙකට දැකලා නැත.... පිරිමි එව්වෝ කිසිම තේරුමක් නැතිව කාලය කා දමන්නේ තොවිල් නටන්නේ අඹු හෙළුවැල්ලෙන්මය. ගෑණුන්ද හරිහමන් ඇඳුමකින් හෙළුව වසා ගන්නේ නැත." මෙයාකාරයෙන් කළුතම, හෙළුව, වඳුරු පෙනුම, කලකුතා හොඳු මනස යනාදිය හවිසත් බොක්ක, ගොරිල්ලා දඩයක්කාරයෝ නම් කෑනින් තුලින් බැලන්ටයින් සිය විෂය කර ගනී.

නව යව්වනයෙන් මිදීගත පසුකාලයකදී වූව භාෂාවෙන් හා තාක්ෂණයෙන් පරිපාකයට පත් එකකැයි සලකා මා කියැවූ කථාවෙක තකතිරු වනචර කල්ලන්ගේ රඟ නැටුමක් මනාව නිරූපනය වී තිබිණි. 'මට එය දිරවාගත නොහැකි වූයේ අධ්‍යාපනික විභාගයකට නියමිත පාඨ ග්‍රන්ථයක් වශයෙනුත් එය ඉගිදින්නට මට සිද්ධ වී තිබුණු නිසාය. ජෝසෆ් කොන්රඩ් නම් සුප්‍රකට ඉංග්‍රීසි ලේඛකයා ලියූ Heart Of Darkness නම් නව කතාවයි ඒ. අප්‍රිකානු මහාද්වීපයේ වෙසෙන ස්වදේශිය ජනතාව ප්‍රථමවරට දකින හමුවන කුර්ට්ස් නම් යුරෝපීය මහත්මයා සිය කතාන්දරය මෙසේ කියාපායි.

"අපි ප්‍රාග් ඓතිහාසික පොළවක් මත, අඳෙන ග්‍රහලෝකයක පැතිකඩක් හා සමාන පෙනුමැති පොළවක් මත, පැරිසරන යාත්‍රිකයන් පිරිසක් බවට පත්වී සිටියෙමු. අපි එනාහි මෙවන් අවාසනාවන්ත උරුමයන් පළමුවරට සොයා දැනගත් මිනිසුන් වෙමුයි සිතා ප්‍රීති වෙමින් මෙසෙස් අත්විඳිමින් සිටි ඒ දැඩි තලංගුවන් අතිශය ආයාසයක් හීන කරගැනීමට අපට පිළිවන්කමක් තිබිණි. නමුත් වංගුවක් පසුකොට ඉදිරියටම ඇදෙන්නට වෙහෙස ගන්නා විට අප හොත ගැටුනෝ ගනසැරට වැඩුණු මද සෙලවීමකින් පවා තොර ගස්වැල් පඳුරු රැප්පාවක් යට, වියලි පත් පැලැල්ලෙහි තැනූ බිත්තිය, සිරස මුදුන් කොට තනා තණ පිදුරු සෙවිලි කළ වහලවල්ය, යටිගිරියෙන් කෑගසන

> "මේ හැම දෙයකටම වඩා අප සංත්‍රාසයට පත් කළේ ඔවුන්ද අප වැනිම මිනිසුන්ය යන කාරණය විසිනි. මේ චණ්ඩ ත්‍රාසකාමී කලබැගෑනිය සමඟ අප පාතා දුරස්ථ බන්ධුතාවය පිළිබඳ කාරණය විසිනි"

හඬවල්ය, කළුම කළු අතපය නැටවිල්ලක්ය, මහ හඬ නංවමින් තැලෙන අත්පුඩිය, හඬ නංවමින් තැබෙන බර අඩිය, පැද්දෙන පෙරළෙන ඇහ පතවල්ය, අහෝරක් නැතිව බමන ඇස්ගෙඩිය ඉසබින්තෙත් අපගේ දුම් බෝට්ටුව හෙමිහිට ඉදිරියට ඇදී ගොස් අප ඉදිරියේ මැවී තිබෙනා මේ කාලවර්ණ අචින්තනීය උන්මාදයේ කෙලවර නැවතුණේය.

'ප්‍රාග් ඓතිහාසික මිනිසා දැන් අපට සාප කරන සෙයකි. අප වෙනුවෙන් යාඥකරන සෙයකි. අපට ආයුබෝවන් කියන සෙයකි. ඇත්තෙන්ම ඔවුන් මේ කියන්නේ කරන්නේ මොනවාදැයි කාට කිවහැකිද? භෞතික පරිසරය සමඟ කිසිදු සම්බන්ධකමක් ගොඩනගන්නට බැරිවන ලෙසින් අප සැණෙකින් වටකරනු ලැබූ සෙයක් දැනිනි. විස්මයට පත්වෙමින් බියෙන් ඇළලෙමින් සිටි අප, පිස්සන් කොටුවකින් එළියට පැනගෙන හිස් ලුහු අත දුවමින් සිටින මේ පිස්සන් රැළ වෙනින් ඉවත්ව, ළඟි ළඟියේ දියමත ඉදිරියටම ලෙස්සා ගියේ අවසාර පරිද්දෙනි. අපට මේ කිසිදෙයක් නොතේරුනේ අප ඔවුනට දුරින් සිටි නිසාය. අපට මේ කිසිවක් මතක නැත්තේ අප මහා කාල රාත්‍රියෙහි ගමන් කරමින් සිටි නිසාය. ඒ යුගය දැන් අප පසුකර ගොස් හමාරය. ඒ මහා කාල රාත්‍රිය දැන් ඒ පිළිබඳව කිසිදු සංඥවක් කිසිදු මතකයක් අප වෙනුවෙන් ශේෂ කොට නොතබා ගෙවී ගොසින්ය.

"අප පා තබමින් සිටි ඒ පොළොව වනාහි මෙලොවට නොව එලොවට අයත් එකකැයි අපට සිතුණි. මේතුවක් අප දකින්නට පුරුදුව සිටින්නේ අපගේ වසඟයට නතුකරගත් අපට වාල්කම් කරන යක්ෂයාගේ බියකරු ස්වරූපයයි. නමුත් අප එදා එතැන හැමතැනම දුටුවේ නිදහසේ සරන යක්ෂාරූඪ දේවල්ය. ඒවා මෙලොවට අයත් දේවල් නොවේ. එහෙත් ඒ මිනිසුන් මෙලොවට අයත් අය නොවේ යැයි කියන්නේ කෙසේද? නැත, එසේ කියනු බැරිය. ඔවුන් මෙලොවට අයත් නැති අමනුෂ්‍යයන් නොවේය. ඉඳින් ඔබ දන්නවා නොවැ, ඔවුන් වනාහි

අමනුෂ්‍යයන්ය කියන මේ සැකය ඉතාමත් හානිකර එකක් බව. කොහොම වුනත් එවන් සැකයක් ඇතිවීමද වලක්වනු බැරිය. ඔවුහු උඩුබුරුලෑහ, කැතින් කැතට පැන්නාහ. ඉද්ද ගැසුවාක් මෙන් සිට ගත්හ. විපුළ මුහුණු පැවාහ. කෙසේ වෙත් මේ හැමදෙයකටම වඩා අප සන්ත්‍රාසයට පත් කළේ ඔවුන් ද අප වැනිම මිනිසුන්ය යන කාරණය විසිනි. මේ චණ්ඩ ත්‍රාසකාමී කලබැගෑනිය සමඟ අප පාතා දුරස්ථ බන්ධුතාවය පිළිබඳ කාරණය විසිනි. කැතයි, ඔව් ඉතාමත් කැතයි. කෙසේ වෙතත් ඔබ තුල මිනිසත් බවක ජේසාවක් හෝ තිබේනම් එද අපට ඇසුණු ඒ ගොරබිරම් හඬට, කිසිසේත් ඔබට නොතේරෙන ඒ කෑකෝගැසීමට, කිසියම් ප්‍රතිචාරයක් ඔබ දක්වන බව නො අනුමානය".

දැනට සයිරේ නමින් හැඳින්වෙන, පෙර බෙල්ජියම් කොංගෝවේ, ස්වදේශික අප්‍රිකානු ගෝත්‍රික ජනතාව සහා කරවීමේ අභිලාෂයෙන් ඔවුන් අතරට ගිය මාලොව් සොයා යන කුර්ට්ස් හට ස්වදේශිකයන් මුණගැසුණු විට ඔහු පාඨනය කරන්නේ ඉහත සඳහන් අන්දමේ අර්ථමාලාවකි. ලෝකයේ ධනවාදය සහළ වී අධිරාජ්‍යවාදය කෙස් එය වැඩුනායින් පසුව සුදු පැහැති බටහිර දිගුවාසීන් බොහෝ දෙනා කරපැහැති පෙරදිගු වාසීන් ගැන කල්පනා කළේ නොදියුණු නූගත් කල්ලන් රැළක් හැටියටය. එම කල්පනාවට අනුව ඒ මිනිසුන් මානවත්වයට කිට්ටු වන්නේ ඉතා මඳ වශයෙනි, ඒ මිනිසුන් වනාහි ගුහාත්වයේ ප්‍රභවයයි, ඔවුනට හැකියාව ඇත්තේ පාඨනය කළ නොහෙන අර්ථයන් රැසක් සම්පාදනය කිරීමට පමණි. ඔවුන්ගේ ගොරබිරම් කල්කිරියාව සමකළ හැක්කේ උන්මාදයට පමණි. "පිස්සන් කොටුවකින් එළියට පැනගෙන හිස් ලුහු අත දුවමින් සිටින මේ පිස්සන් රැළ" මේ උන්මාදය සුව කිරීමට ඇත්තේ එකම එක මගක් පමණි. දියුණු උගත් ලෝකයෙන් පැමිණෙන බාහිර කාරකයෙකු මේ ජනත්වය තේරුම්ගෙන එය පාලනය කළ යුතුය. මේ වනාහි ශිෂ්ට සහා සංස්කෘත "අපි" අශිෂ්ට අසහා අසංස්කෘත "උන්" වෙත හෙළනා බැල්මයි. සැබැවින්ම මේ

ඒකපාර්ශ්වීය බැල්ම ධවල යුරෝපය කේන්ද්‍රීය කොටගත් ඉතිහාසයක් සම්පාදනය කොට තිබීම නිසා ඇති වන්නකි. එයින් තොර නිදහස් බාහිර ලෝකයක් ඇත්තේ නැතැයි කල්පනා කිරීම නිසා ඇතිවන්නකි. සමහර බටහිර විද්වතුන් හා ලේඛකයින් බටහිර සාහිත්‍ය නමැති සම්ප්‍රදාය තුල පෙරදිග මිනිසා කිනම් ලෙස සංකල්ප රූපනය කොට තිබේද? ඔවුනට අනුව පෙරදිග මිනිසා කම්මැලියෙකි. වංචා කාරයෙකි, කකතිරුවෙකි. මේ සම්බන්ධයෙන් එඩ්වඩ් සෙයිද් කියා ඇති අදහස් වලින් ස්වල්පයක් පමණක් මෙහිදී ගෙනහැර දක්වන්නෙමු.

'මේ මොහොත වන විට ලෝකය මුහුණ දෙමින් සිටින බරපතලතම ප්‍රශ්න - එනම් න්‍යෂ්ටික විනාශය, අතිදරුණු සම්පත් හිඟය, සමානාත්මතාවය, යුක්තිය හා ආර්ථික සමතාවය උදෙසා දිනෙන් දිනම කැරෙන බලවත් ඉල්ලීම් වැනි බරපතල ප්‍රශ්න මෙන්ම පෙරදිග සම්බන්ධයෙන් පහළ වී තිබෙන ජනප්‍රිය විකාර මතද දේශපාලනඥයෝ මනාව පාවිච්චි කරමින් ඇත්තාහ. සත්තකින්ම මෙවන් මත දේශපාලනඥයන්ට සපයා දෙන්නේ ඒ ඒ කාරණා සම්බන්ධයෙන් අර්ධ ඇඟැලුම් කරන තාක්ෂණ නිලධාරීන් පමණක් නොවේ. පෙරදිග පිළිබඳව ප්‍රවීර දැනුමක් ඇතැයි සිතාගෙන සිටින ප්‍රවීර - පෙරදිග වාදියා ද එසේ කරයි. අමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව තුල කින්න බැහැගෙන සිටින අරාබි කටයුතු පිළිබඳ විශේෂඥයන් හැමවිටම පවසන්නේ මුළුමහත් ලෝකයම වසඟයට ගැනීම සඳහා සැකසෙන අරාබි සැලසුමක් ගැනය. එහෙම නැත්නම් 'අපේ' ගොදුරු බැහැගන්නට කරන උකුස්සන් වැනි වංචනික චීනුන්, අර්ධ - නග්න ඉන්දියානුවන්, නිෂ්ක්‍රීය මුසල්මානුවන් ගැනය. එක්කෝ කිසියම් කාලෙකදී මේ උකුස්සෝ කොමියුනිස්ට්වාදයට ගොදුරුවී අපෙන් ඈත් වෙති. නැත්නම් ඔවුන්ගේම වඳ ආගාවන් තුල ගැලී නිරපරාදේ කාලකන්නි වෙති.

'සැබැවින්ම අද්‍යතන ප්‍රවෘත්ති හා මහජන චින්තනය පෙරදිග සම්බන්ධයෙන් සමකාලීනව බලපවත්නා ප්‍රස්තුත ආකල්ප වලින් පිරී ඉතිරී දෙගොඩ තලා ගොසින්ය. උදාහරණයක් වශයෙන් දක්වතොත් මේ ආකල්ප වලට අනුව අරාබින් ගැන සිතිය යුත්තේ ඔටුවන් පිට ගමන් ගන්නා ත්‍රස්තවාදයේ ගැලෙන හිරා කොටවල් බඳු නාසා ඇති, ලේ උරා බොන කුඩැල්ලන් වැනි පුතුලන් සමූහයක් හැටියටය. මොවුන්ගේ අත්වල අද එකරාශි වී තිබෙන, එහෙත් කිසියේත් එසේ නොවිය යුතු, ඔහේ වස්තු සම්භාරය නිසා සැබෑ ශිෂ්ටාචාරයට ගොඩ නැගෙන්නට අද ඉඩක් නැත. සංඛ්‍යාව අතින් බටහිර පාරිභෝගිකයා සුළුතර වුවත් ලෝකයේ තිබෙන වස්තු සම්පත් වලින් වැඩිකොටස එක්කෝ අයිති කර ගැනීමට, නැත්නම් පාවිච්චි කිරීමට, එහෙම නැත්නම් ඒ දෙකම කිරීමට එම පාරිභෝගිකයාට පිළිවන. ඒ මන්ද? එම පාරිභෝගිකයා පෙරදිග වාසියා මෙන් නොව සැබෑ මිනිසෙකු නිසාය. 'සුළුතර කොටස් අත්පත් කර ගැනීම සඳහා ප්‍රමුඛත්වය ගැනීම' නම් අන්වර් අබ්දෙල් මලෙක් ගේ කියමන අදට මනාව ගැලපෙනවා පමණක් නොව අද ක්‍රියාත්මක වන්නේ යුරෝපා කේන්ද්‍රීයවාදය සමග අත්වැල් බැඳගත් මානව කේන්ද්‍රීය වාදයකි යන කාරණය ද එමඟින් මනාව පසක් කැරෙයි. සුදු පැහැති මධ්‍යම පන්තික බටහිරදිග වාසියා සුදු නොවන ලෝකය පරිපාලනය කිරීමේ පමණක් නොව ඊට හිමිකම් කීමේ මානුෂික වරප්‍රසාදය පවා තමන් සතු බව විශ්වාස කරයි.ඊට හේතුව වශයෙන් එම වැසියා දක්වන්නේ 'එම ලෝකය' හුදෙක් 'අපගේ ලෝකය' මෙන් මානුෂික නොවන බවය. නිර්-මානුෂික චින්තනය සම්බන්ධයෙන් ඉදුරා ඉදිරිපත් කළ හැකි මීට වඩා හොඳ උදාහරණයක් තවත් නැත!

'එක්තරා අර්ථයකින් ගත්කල, මා මීට පෙරාතුවද දක්වා ඇති පරිදි, ප්‍රස්තුත පෙරදිගවාදයේ සීමාවන් වූ කලී තමනට වඩා වෙනස් වූ සංස්කෘතියකට, ජනතාවකට, භූගෝලීය පෙදෙසකට උරුමකම් කියන මානුෂිකත්වයක් නොසලකා හරින්නා වූ නිරුවත් කරන්නාවූ සීමාවන්ය.'

යටත්විජිත වකවානුවේදී සිදුවූ සාහිත්‍යික සම්පාදනය එබඳු ලක්ෂණවලින් සමන්විත වූයේ මන්ද? ඊට හේතුව මම මෙසේ දකිමි. ආසියානු කලාපයේ ඉන්දීය අර්ධද්වීපයේ පිහිටා ඇති රටක ජීවත්වන මා අද වන විට ගෙවමින් සිටින්නේ අවුරුදු පනස්සයක් තරම් වයස ඇති යටත්විජිත හා පශ්චාත් යටත්විජිත සමයකි.(සමාජ - ආර්ථික - දේශපාලන - සංස්කෘතික) මේ රටේ යටත් විජිතය ගොඩනැගුණේ මහා බ්‍රිතාන්‍ය බැවින් මෙහි ව්‍යුහයන් තුල ප්‍රමුඛ වූයේ ඉංග්‍රීසියයි. එහෙත් මොන තරම් ප්‍රමුඛ වුවත් යටත්විජිතකරණයේ ප්‍රතිවිරෝධතා වලින්ම එය ගහණ වී තිබිණි. ඉංග්‍රීසි භාෂාව වනාහි බ්‍රිතාන්‍යයේ මව්බස වන අතර ආරම්භයේ සිටම එක්සත් ජනපදයේ භාවිතා වූ ජාතික භාෂාව විය. එහෙත් ඉන්දීය අර්ධද්වීපය තුල නම් ඉංග්‍රීසි භාෂාව හිතාමතා කෘත්‍රිම ලෙස අධිරාජ්‍යවාදය හා යටත්විජිතවාදය විසින් ස්ථාපනය කරන ලද උත්තරාරෝපිතයකි. විශේෂයෙන්ම 17 වන සියවසේ සිට දහනම වන සියවසේ මුල්භාගය දක්වා ඉංග්‍රීසි භාෂාව හඳුන්වාදීම සිද්ධ කැරුණේ මිෂනාරී කටයුතුත් සමගය. නමුත් බටහිර විද්‍යා ඥානය හැදෑරීම සඳහා ඉන්දියානු අර්ධද්වීප වාසීන් සාම්ප්‍රදායික සංස්කෘතයෙහි සහ අරාබි බසෙහි බලපෑම අඩුකොට ඉංග්‍රීසිය උපදේශ මාධ්‍යයක් ලෙස යොදාගත යුතුය යන මතය පසුකාලීනව බලවත් වූ බවත් අමතක නොකළ යුතුය. ඉංග්‍රීසීන් විසින් ඉන්දීය අර්ධද්වීපය තුල නිර්මාණය කළ 'බ්‍රිතානි රාජ්‍යය' ලෝකයේ අන් කුමන කලාපයක ගොඩනැගී තිබුණු ඉංග්‍රීසි යටත්විජිත වලට වඩා සුවිශේෂ විය. ලංකාවද ඇතුලුව මුළුමහත් ඉන්දීය අර්ධද්වීපය වසා පැතුරුණු බ්‍රිතානි රාජ්‍යයේ පරිපාලනය පිණිස නිලධාරීන් බඳවා ගැනීමේදී ඉංග්‍රීසි භාෂාව වහරන උදවියට ප්‍රමුඛත්වය දිය යුතුය යන ප්‍රතිපත්තිය හැඩිංජර් සාමිවරයා 1844 දී භාවිතාවට අවතීර්ණ කරවූයේ 1835 දී ඉංග්‍රීසි රචනා සම්පාදකයෙකු, ඉතිහාසඥයෙකු හා යටත්විජිත පාලකයෙකු වූ තෝමස් මැකෝලේ සාමිවරයා ගේ චිර ප්‍රසිද්ධ 'අධ්‍යාපනය පිළිබඳ වාර්තා සටහනක්' නම් ලියවිල්ල මත පදනම් වෙමිනි. අනතුරුව 1854 වනවිට ඉංග්‍රීසි භාෂාව ඵලදායී සන්නිවේදන උපකරණයක් හැටියටත් 'ශිෂ්ටසම්පන්න' සංස්කෘතික අගැයුම්වල ප්‍රභව හැටියටත් මුළුමහත් බ්‍රිතානි රාජ්‍යයටම බලපාන පරිද්දෙන් ධවල පත්‍රිකාවක් මඟින් උසස් අධ්‍යාපනය තුල ස්ථාපනය කෙරිණි. නමුත් මේ පියවරෙහි ආනිශංසය වූයේ ඉංග්‍රීසි සාහිත්‍යය නොව ඉංග්‍රීසි භාෂාව ඉන්දීය අර්ධද්වීපයේ අධ්‍යාපනය තුල පැලපදියම් වීමය. යටත් විජිත සමයේදී ඉන්දීය අර්ධද්වීපය තුළ ඉංග්‍රීසි සාහිත්‍යය හෝ සාහිත්‍ය අධ්‍යයනය ප්‍රමාණවත් අයුරකින් සිද්ධ කැරුණේ නැත. ඊට හේතු මැකෝලේ සාමිගේ වචනවලින්ම කියනවා නම්, 'නිර්මාණය කළ යුතුව ඇත්තේ උසස්

> "නිර්මාණය කළ යුතුව ඇත්තේ උසස් පංතියට අයත් මිනිසෙකි. ඒ මිනිසාගේ සිරුරේ දුවන ලේය හා සමේ වර්ණය ඉන්දීය විය යුතුය. නමුත් ඔහුගේ චින්දනය, වමත් කාරය, සදාචාරය හා බුද්ධිය තනිකරම ඉංග්‍රීසි විය යුතුය"
>
> — මැකෝලේ —

පංතියට අයත් මිනිසෙකි. ඒ මිනිසාගේ සිරුරේ දුවන ලෙය හා සමේ වර්ණය ඉන්දීය විය යුතුය. නමුත් ඔහුගේ වින්දනය, චමත්කාරය, සදාචාරය හා බුද්ධිය කහිසරම ඉංග්‍රීසි විය යුතුය". එසේකින් නොනැවතුණු ඔහු වැඩිදුරටත් මෙසේද කියයි. "හොඳ යුරෝපීය පොත් අල්මාරියක් ඉන්දියාවේදී හා අරාබියේදී දක්නට ලැබෙන සමස්ත දේශීය සාහිත්‍යයේ වටිනාකමට සමානය." මේ අනුව බ්‍රිතාන්‍ය රාජ්‍යයේ විසූ ඉංග්‍රීසි උගත් දේශීය බුද්ධිමතුන් ක්‍රියාත්මක වූයේ අතරමැදියන් රැළක් හැටියටය. ඔවුනට සිදුවූයේ තමන්ගේ ඒවාට වඩා උත්තර යැයි සැලකුණු සංස්කෘතික රටාවනට යටත් විජිත වැස්සන් නතු කරවීමේ ප්‍රකට කරවීමේ කාර්යයෙහි නියැලෙන්නටය. ඒ නයින් ඔවුන්ගේ අතින් ඉංග්‍රීසි සාහිත්‍ය පාඨවල අන්තර්ගත ක්‍රිස්තියානි සංකල්ප හඳුන්වාදීමත් අතියම් ආකාරයෙන් සිද්ධ විය.

කෙසේ වෙතත් විසිවන සියවසේ මුල්භාගයේදී බොහොමයක් රටවල් යටත්විජිත පාලනයෙන් මිදී ජාතික රාජ්‍යයන් වශයෙන් ස්ථාපිත වූ විට ඒ රටවල සිද්ධ කැරුණු සාහිත්‍යික සම්පාදනය වූ කලී දේශීය ජන සාහිත්‍යය සහ එකී රාජ්‍යයන් එතෙක් වසහයට ගෙන සිටි යටත්විජිත ස්වාමීන්ගේ සාහිත්‍යය අතර අඩුවැඩි වශයෙන් ඇතිවූ සම්මිශ්‍රණයක් විය. මෙවන් විසරණයක් කෙසේවත් වලකනු බැරිවූ එකකි. ඉන්දීය, අරාබි හා චීන වැනි පුරාතන සභ්‍යත්වයන් විසින් නිර්මාණය වූ ජන සාහිත්‍යය, බ්‍රිතාන්‍ය රාජ්‍ය වැජඹුණු සමයේදී ඉංග්‍රීසි භාෂාවට වේගයෙන් පරිවර්තනය වීම නිසා පශ්චාත් යටත් විජිත සම්භාවනීය සාහිත්‍යික සම්පාදනයක්ද පසු කලෙක ඇතිවිය. ඉන්දීය අර්ධද්වීපය තුළ ගොඩනැගුණු බ්‍රිතාන්‍ය රාජ්‍යයේ තුළ මේ තත්ත්වය වැඩි වශයෙන් දක්නට ලැබිණි. එහෙත් නැගෙනහිර අප්‍රිකාවේ කෙනියාව වැනි රටවල තත්ත්වය මීට වඩා හාත්පසින්ම වෙනස් විය. ඊට ප්‍රධානතම හේතුව වූයේ ප්‍රබල ලෙස වර්ධනය වූ ලිඛිත දේශීය ජන සාහිත්‍යයක් එහි නොතිබීමය. කෙනියාව 1961 තරම් මෑත කාලයේදී බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයෙන් මිදුණු රටකි. එහෙත් එහි නවසිය හැත්තෑගණන්වල අගභාගය වනතුරුම පාසැල් සාහිත්‍ය විෂයමාලාව මුලුමනින්ම අත්පත් කරගෙන සිටියේ බ්‍රිතාන්‍ය ඉංග්‍රීසි සාහිත්‍යයයි. පාඨ ග්‍රන්ථාවලියෙහි කිසියම් වෙනසක් ඇතිවූවානම් එසේ වූයේ ඉතාමත් මෑතකදී බැව් පැහැදිලිය.

මෙවන් වාතාවරණයක් තුළ හැදුණු වැඩුණු කෙනියානු පාඨකයා සාහිත්‍ය පාඨනයේ යෙදෙමින් වින්දනය ලබන්නේ ඔහුගේ / ඇගේ රුචීන් අනුව සකස් වී තිබෙන පාඨාවලින් අනුව යමින් නොවේ. ඔවුන් පාඨනය කරන පඨිතයන් ඔවුනට බොහෝසෙයින් දුරස්ථ ඒවා බව සිතා ගැනීමට ඔබට එතරම් අපහසු නැත. ඒවායෙහි මේ තත්ත්වය එක සංස්කෘතියක ආශ්‍රය ලැබූ පාඨකයකු තවත් සංස්කෘතියකට අයත් පාඨයක් පාඨනය කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතා සමග සටලවා ගත යුතුද නොවේ. හරස් - සංස්කෘතික පාඨනය තුළ ආධිපත්‍යධාරීත්වය පිළිබඳ ගැටලුව ඇත්තේ නැත. එහි ඇත්තේ පදවල අර්ථ සම්පාදනය ග්‍රහණය කර ගැනීම පිළිබඳ ගැටලුවයි. එහෙත් පශ්චාත් - යටත් විජිත පාඨනයට බද්ධව තිබෙන ගැටළුව එතරම් පහසුකර එකක් නොවේ. එය වූකලී මේ පිළිබඳව කැරෙන දීර්ඝ සම්භාෂණයක් තුළින් මතු කරගත යුත්තකි.

> **භාෂාව යනු සංස්කෘතියේ එකම එක වාහකයා නොවේ. එක වාහකයෙකු පමණි. අව්‍යාප්ත භාෂාවකට සීමාවී සිටීම යනු සංකල්පනය හා පරිකල්පනය ගබ්සා කරගැනීමකි.**

මා වයසින් මුහුකුරායාත්ම සාහිත්‍යය, සන්නිවේදනය, ජනමාධ්‍යය, සංස්කෘතිය ඈ, සියලු පරිමණ්ඩල තුළින් මිනිසා ලබන වින්දනය බෙහෙවින් පුළුල් වී තිබෙන බව මට පසක් වන්නට විය. විසිවන සියවසේ අගභාගය එළැඹෙද්දී පෙර අපර දෙදිග සාහිත්‍යික සම්පාදනය හා විචාරණ සිද්ධාන්ත වැඩිදියුණු වී භරතමුනිගේ රසවාදයෙන් හා ඇරිස්ටෝටල්ගේ භාව විරේචනයෙන් ඔබ්බට ගමන් කිරීම ඇරඹී තිබිණි. වින්දනය උදෙසා අර්ථ සම්පාදනය කිරීමේ හා පාඨනය කිරීමේ නව කාර්යයන් වෙත සාහිත්‍යය යොමුවන විට මගේ සාහිත්‍ය වින්දනයේ ඉතිහාස කථාව භාර අවුස්සා බැලීමටත් මා නිතැතින්ම පෙළැඹිණි. ඒ පෙළැඹවීම මා තුළ ජනනය වූයේ පශ්චාත් - යටත්විජිත සාහිත්‍යය පාඨනය නම් නාමණ විධියේ ආශ්‍රයට මා පත්වූ සමයේ පටන්ය. එද මා තුළ රජුල අංකුර සාහිත්‍යික වින්දනය අද වර්ධනය වී ඇත්තේ පෙර නොවූ විරූ අයුරකිනි. අද සාහිත්‍යය, සන්නිවේදනය, ජනමාධ්‍ය හා සංස්කෘතිය ඈ විෂයන් පිළිබඳව ඕනෑම පතපොතක් මා කියවන්නේ පෙළ හෙවත් පාඨයන් හැටියට සලකාගෙනය. ඒ පාඨයන්හි පද්ධතිගතව තිබෙන හා නොතිබෙන අර්ථයන් පසුපස හඹායෑම ඊළඟ කාර්යයයි. පාඨනය හෙවත් කියැවීම ඉලක්ක කරන්නේ වින්දනයයි. වින්දනය විස්තීර්ණ කිරීමෙන් පැතුල කිරීමෙන් පාඨකයා සමාජ සාරධර්ම ග්‍රහණය කරගනිමින් ප්‍රඥාව වැඩි කොටසක් ඉටුකිරීමට උත්සුක වෙයි. අර්ථපාඨනය, වින්දනය, සාරධර්ම ග්‍රහණය ආදී එල්ලයන් පෙරදැරිකොට ගන්නා අද්‍යතන සාහිත්‍යික ව්‍යාපාරය යනු එහෙම පිටින්ම සංස්කෘතිය අධ්‍යයනය කිරීමකි. ඒ වනාහි ඔබේත් මගේත් සංස්කෘතිය අධ්‍යයනය කිරීමයි.

කිසියම් පෙළක් කියැවීමේදී එකී පෙළ විසින් ඉදිරිපත් කරන සංකල්ප රූප ගැලපෙන්නේ කුමන සමාජ සම්බන්ධතාවයට ද කුමන අත්දැකීමට ද, යන ප්‍රශ්නය නිතැතින්ම පැන නගී. අපේ සමාජය බහුවිධ බහු අර්ථ බහු කාර්ය බැවින් ඔබේත් මගේත් සමාජ සහභාගීත්වය නිර්ණය කැරෙන්නේ පිරිමියෙකු ද ගැහැණියක ද, සමේ වර්ණය කෙබඳු ද, අයත්වන වයස් කාණ්ඩය කුමක්ද, අංගවිකලයෙකු ද නැද්ද, සමලිංගික ද ඉතරලිංගික ද, අයත්වන සමාජ පංතිය කවරේද යනාදී කාරකයන් විසින්ය. නව යව්වනයේදී මා ලැබූ අධ්‍යාපනය විසින්, මා ලැබූ සාහිත්‍යික වින්දනය විසින්, මගේ පරිසරය විසින් පශ්චාත් යටත්විජිත සාහිත්‍යික පාඨනයෙහි යෙදෙන්නට මට වඩාත් සුදුසුකම් ලබා දී තිබෙන හැටියකි. නව යව්වනයේදී මතුල වැජඹුණු මගේ සාරධර්ම, මගේ වින්දනයන්, මගේ ඉතිහාස - කථාව, යටත්විජිතවාදී සංස්කෘතික ව්‍යාපාරයේ නිර්මිතයන් ලෙස අද මම පසක් කරමි. හොඳයි, මේ බව පසක් කරන මා කළ යුතු අගැයුම් විනිශ්චයක් තිබේද ? මා විසින් කළ යුත්තේ "ජාතික චින්තනය" නමින් ඉදිරිපත්ව තිබෙන අදහස් නොනුව අර්ථසම්පන්න චින්තන ශිලි විශ්වාදමයක් යැයි පිළිගෙන ඒ අනුව යමින් යටත් විජිත මෙන්ම පශ්චාත් - යටත්විජිත සාහිත්‍යික ව්‍යාපාරය හා සංස්කෘතිය කළු / සුදු, ජාතික / යුදෙව්, දේශීය / විදේශීය, උන්ගේ / අපේ, යුරෝපා-කේන්ද්‍රීය / ආසියානු - කේන්ද්‍රීය යනාදී නිර්ණායකයනට අනුව බෙදා වෙන්කොට හෙළා දැකීමද ? සමකත් චින්තනයකැයි බොහෝදෙනා පිළිගන්නා ජාතික චින්තනය නම් මට කෙසේවත් ගෝචර නොවේ. ජාතික චින්තනයේ පරණ යන බොහෝ උපාසක උපාසිකාවන් යෝනිසෝ මනසිකාරයෙන් තොරවූවන් යැයි මම සිතමි. කෙසේවෙතත් මට නම් ජාතික චින්තනය යනු නාසාපුට පුම්බා තුල්මන් ළෙමින් උරන සිලි සිලියේ හමායන පිච්චමල් සුවඳක් නොව නාසාපුට හකුළුවන, හිස බමවන, ඔක්කාරය ඇති කරවන, මහ ගු ගඳක්ය.

ජාතික චින්තනවාදීන් ස්වකීය ප්‍රබල යැයි සැලකෙන සම්භාෂණයන් බොහොමයක් අරඹන්නේ පශ්චාත් - යටත්විජිත වාදයේ සංකල්පිත රාමුවෙනි. එහෙත් ඔවුන්ගේ පාඨනයන් මගේ වැනි

පාඨනයනට වඩා සාත්පසින්ම වෙනස්ය. ඔවුන්ගේ පාඨනයන්ට අනුව අධිරාජ්‍යවාදය හා යටත් විජිතවාදය මූලික වශයෙන් සුදුය, යුදෙව්ය, විදේශියය, යුරෝපා - කේන්ද්‍රිකය, උත්ගේය. මේ නිසාම ඔවුන්ගේ අධිරාජ්‍ය - විරෝධය හා යටත්විජිත - විරෝධය අනිවාර්යයෙන්ම කළු හා කලෙළය, ජාතිකය, දේශියය, ආසියා - කේන්ද්‍රියය, අජේය. පශ්චාත් - යටත්විජිත සාහිත්‍යික සම්භාෂණය තුළ ජාතික චින්තනය තවය පිටුවහල් කරගන්නා සමහර අර්ථයන් අතිවාක්ෂ බැව් මා නොදකිනවා නොවේ. එමෙන්ම යම් යම් ලෙසින් සමපාත වන බැව් ද දකිමි. එයින් කියැවෙන්නේ කුමක්ද?. සම්භාෂණය නව නවත් නොයෙක් අර්ථ පාඨන කාෂණයන්ගෙන් සම්පන්න කළ යුතු බවයි. එනයින් අපරිපූර්ණයන් හඳුනාගනිමින් අර්ථ - පෝෂණයෙහි යෙදිය යුතු බවයි. පශ්චාත්-යටත්විජිත සාහිත්‍යික සම්භාෂණය තුල යෝධයෙකු පරිද්දෙන් නැඟී සිටින කීර්තිමත් කිනියානු ලේඛක එන්ගුගි වාතියොන්ගෝ ගේ සමහර තර්කයක් අපේ රටේ ජාතික චින්තනවාදීන්ගේ තිහියම් තර්කයට බද්ධ වෙයි. එහිලා අදපසකුයම් බැහැර කළ යුතු බවට මම යෝජනා කරමි. මනස යටත්විජිතහරණයට ඔහුන් කිරීම නම් ස්වකීය සංග්‍රහයෙහි යටත්විජිතවාදයේ ගැටළු ගැන සාකච්ඡා කරමින් එන්ගුගි වාතියොන්ගෝ පවසන්නේ බ්‍රිතාන්‍ය නොවන ලේඛකයින් සම්මත ඉංග්‍රීසි බසින් ලියනවිට සමාජ - ආර්ථික - දේශපාලන ඇ මූහුණුවරයන් යුතු යටත්විජිතවාදයක් ද ඉදිරිපත් කරන බවයි. වැඩකිරීම සඳහා එක්තරා භාෂාවක් තෝරාගැනීම යනු එක්තරා ලෝකයක් තෝරා ගැනීම බව පවසන එන්ගුගි අප්‍රිකානු කෘති ගැන ඉංග්‍රීසි බසින් ලිවීම යනු ස්වදේශී භාෂාව විසින් උසුලා දරා සිටින ජාතික සංස්කෘතික සම්ප්‍රදායන් නොතකා හැරීමක් දේශිය පාඨකයා නොතකා හැරීමක් බව පවසයි. ඒ වෙනුවට ඔහු කියා සිටින්නේ එක්සෝ බහුතර අප්‍රිකානු භාෂාව වන ස්වාහිලි බසින් ලිවිය යුතු බවයි. තමා සම්බන්ධයෙන් ඔහු කියා සිටින්නේ ගිකියු බසින් ලිවිය යුතු බවයි. ගිකියු යනු කිනියාවේ සුළු ප්‍රදේශයක පමණක් භාවිතා කැරෙන උපභාෂාවක් පමණි. ඉංග්‍රීසි යනු ලෝක ජනගහනයෙන් වැඩිපුරම ප්‍රමාණයක් (සියයට 37 ක් දෙනා) භාවිතා කරන භාෂාවකි. එන්ගුගි වාතියොන්ගෝ ලොව පුරා කීර්තිය ජනනය කළේ ගිකියු බසින් ලියා නොව ඉංග්‍රීසි බසින් ලියාය. භාෂාව යනු සංස්කෘතියේ එකම එක වාහකයා නොවේ, එක වාහකයෙකු පමණි. අවශ්‍යාපේක්ෂ භාෂාවකට සීමාවී සිටීම යනු සංකල්පනය හා පරිකල්පනය කමිසා කරගැනීමකි. මගේ අදහස හැටියට නම් වර්තමාන ලෝකයේදී ගිකියු බසින් පමණක් ලිවීම යනු සිංහල බසින් පමණක් කටයුතු කිරීම හා සමානය. සිංහල භාෂාව අපේ වැනි දූපතකට පමණක් සීමාවීම නිසා සිංහල සම්භාෂණය තුල පවතින දරිද්‍රතාවය කියා නිම කිරීමට බැරි තරම්ය. එය අනෙකුත් භාෂාවන්ගෙන් සංකල්පනයන්ගෙන් සංස්කෘතීන්ගෙන් පෝෂණය ලැබිය යුතු යැයි පැවසීම නිරූපාවිකය. එබැවින් පශ්චාත් - යටත්විජිතවාදී සාහිත්‍යික පාඨනයෙහිලා මුල්පෙළේ මෙහෙවරයක් ඉටුකළද එන්ගුගිගේ මේ සීමිතය විවරණයට භාජනය කළ යුතුය. භාෂාවේදීන්ගේ වාග්වේදීන්ගේ සංස්කෘතික - මානවවේදීන්ගේ නවතම සිද්ධාන්ත ආශ්‍රයෙන් මේ සීමිතය විවරණ කළ යුතුය. පශ්චාත් යටත්විජිත සාහිත්‍යික සම්භාෂණය තුල කළු / සුදු ද්විකයට අදාලව පැවැත්වෙන පාඨනය ද වැඩිදුර ගවේෂණයට භාජනය කළ යුතුය. ජාතික

> **මම මෙහිදී භාෂාව සංස්කෘතික නිර්මිතයක් වශයෙන් නොව ශබ්දාර්ථ විභාගයක් ලෙසින් උපයුක්ත කර ගැනීමට මහන්සි ගන්නෙමි.**

චින්තන කුලකයේ ඇත්තන් හා වෙනත් නී නොකී ජාතිකවාදීන් විසින් වැවහාරයේ යොදන යුරෝපා - කේන්ද්‍රියවාදයේ අනිවාර්යමක් හැටියට කළු / සුදු ද්විකය පැලකේ. ජගත් මතවාදයේ හා ජගත් සංවර්ධනයේ සමහර පෙදෙස් යුරෝපා කේන්ද්‍රිකවාදය විසින් අඩාල වෙනම් ඊට රුකුණිව ආසියා කේන්ද්‍රීවාදයක් හෝ අප්‍රිකා - කේන්ද්‍රිකවාදයක්, ලතින් අමෙරිකා - කේන්ද්‍රිකවාදයක් ව්‍යුහනය කළ යුතු නැත. අප විසින් කළ යුත්තේ යුරෝපා කේන්ද්‍රිකවාදය බාදනයට භාජනය කිරීමයි. කළු / සුදු යුග්මය පනත පෙනෙන පරිදි වෙනයම් අර්ථපාඨනයකට භාජනය කරනවිට බොහෝ සංකල්ප ප්‍රතිව්‍යුහනය කිරීමට සිදුවේදෝයි මට විචිකිච්ඡා සහගත වන බැව් නම් නිරනුමානය. කළු / සුදු ද්විකයේ නිරුක්තියක් සොයා යන මම මෙහිදී භාෂාව සංස්කෘතික නිර්මිතයක් වශයෙන් නොව ශබ්දාර්ථ විභාගයක් ලෙසින් උපයුක්ත කර ගැනීමට මහන්සි ගන්නෙමි. අපි "කළු" යනුවෙන් භාවිතා කරන්නේ අදාතන ඉංග්‍රීසි භාෂාවේ පදයක් වන Black යන්නටය. මේ පදය ව්‍යවහාරය තුල වාර්ගික අර්ථයෙන් පාර්ශ්වික දේශපාලන අර්ථයෙන් භාවිතා වන බව සිත්න ඇත්තකි. එහෙත් Black යන පදයේ මූලාරම්භය ඉතා ඈතට දිවගොස් ප්‍රාග් ඉන්දු - යුරෝපීය නම් පැරණිතම භාෂාවක් වෙත යෝන්දු වෙයි. එහිදී වර්තමාන Black යන පදය වෙනුවට භාවිතය වී ඇත්තේ Bhelg කියාය. Bhelg නම් පදයේ පදගතාර්ථය සුදු පැහැ යන්නයි. රුසියානු Belo යන පදයේ සම්භවයද මෙකී Bhelg යන පදයෙන් ඇරඹෙන්නකි. රුසියානු බසින් Belo කියන්නේ සුදු හෙවත් ධවල යන්නයි. ඒ හැරෙන්නට Bhelg යන පදය මූලාශ්‍ර කොට ගෙන හැකී ඇති තවත් ඉංග්‍රීසි පද දෙකක් වන Bald හා Bleach යන පද දෙකෙහි අර්ථයන්ද සුදු යන්නට පර්යාය වන්නකි. Bald යනු කළු හිසකෙස් යන්නට විරුද්ධාර්ථයෙහි ගැනෙන සුදු පැහැ තට්ටය ද Bleach යනු යමක් සුදු පැහැ කිරීමද වේ. මේ අනුව ගත්කල දැනට අප අතර භාවිතා වන පදවල මුල් අර්ථය මත අප දැඩිව පිහිටා සිටියත් ඒ කොතෙකුත් මූලාර්ථයන් දැඩිසේ ප්‍රශ්නවාචක විය හැකිය. මෙහිදී කෙලිදරවී වූයේ කළු යන පදයේ මුල් අර්ථය සුදු කියා නොවේද ?! කළු යන්න සුදු යන තේරුම ගෙන දෙනවා පමණක් නොව පෙරලා සුදු යන පදයේ මුල් අර්ථය ද කළුවේ. තැවතත් භාෂා පුරාණයට අනුව ඒ මෙසේය. Bhelg යන ප්‍රාග් - ඉන්දු යුරෝපීය පදයට පර්යාය පදය ලෙස ජර්මානු බසෙහි සැලකෙන්නේ Blaka ය. එහි සිංහල තේරුම නම් ලෙලවෙන දීප්තිමත් දැල්ල යනුයි. ලෙලෙන දීප්තිමත් දැල්ලක් අප වර්ණ වශයෙන් දක්වන්නේත් ඒ ගැන සිතන්නේත් සුදුපාට ලෙසය. යමක් සුදු පාටව දැවී ඉකිරි වන විට ඇතිවන්නේ කළුපාටය. සුදුට ආසන්න පැහැයක් දරන දරකොට දැවී කළුම කළු අඟුරු ගේෂවීම ඊට උදාහරණය. මේ අනුව ගත්කල කළු පාටෙහි ආරම්භය සුදුය. මෙම පද දෙකේ ආරම්භය වර්තමාන අර්ථයන් විපරීත කරවන සංකීර්ණයක් බව දැන් ඔබට පෙනෙනවා ඇති.ඉදින් පැරණි යටත්විජිතවාදී මතවාදයට සංග්‍රහකම් කියන ලේඛකයින්ගේ සහ පශ්චාත් යටත්විජිතවාදී මතවාදයට සංග්‍රහකම් කියන ජාතික චින්තනධාරීන්ගේ මේ කියන සුදු / කළු වර්ණ භේදවාදය නම් තමන්ගේ නිපුණතාවයන් මත පදනම් කර ගන්නට බැරි බව දැන් පෙනෙනවා ඇත.

ඉහතින් දැක්වූයේ ජාතික චින්තන නාමධාරීන් සහ පශ්චාත් යටත්විජිතවාදී සාහිත්‍යික සම්භාෂණයේ යෙදෙන සමහර විදේශ ලේඛකයින් පුළුල්ව භාවිතා කරන සංඝටක දෙකක් වන ඉංග්‍රීසි භාෂාව සහ කළු / සුදු ද්විකය ගැන විකල්ප වශයෙන් ලබාගත හැකි පාඨනයන් දෙකකි. ඔවුන්ගේ තර්කණයෙහි ඒකරූපතාවය සහ ඒකාග්‍රතාවය බිඳ දැමීම සඳහා නව නවත් පාඨනයන් සිද්ධ කළ යුතුබව මගේ දැනුමයි. ජාතික චින්තන නාමධාරීන් මෙන්ම මාද කලින් කීවාක් මෙන් ආරම්භක ලක්ෂය වශයෙන් යොදු ගන්නේ පශ්චාත් - යටත්විජිතවාදී සංස්කෘතිය වුවද ඔවුන් ගමන් කරන්නේ

මට භාෂාපතිත්ම වෙනස්වූ දිශාවක්වය. කුඩා විරෝධාත්මක මූලධර්මවාදී චින්තන කුලයක් වෙනය. ඒ චින්තන කුලය ප්‍රධාන වශයෙන් අර්ථ දෙකකින් සමන්විත වෙයි. ඕනෑම දෙයක් එක්කෝ නිෂේධ කිරීම නැත්නම් හරණය කිරීම ඒ අර්ථ දෙකය. මගේ අවබෝධය පරිදි නම් ජාතික චින්තන කුලැත්තන් මේ අර්ථයන් දෙකෙහි සරණ යන්නේ උන් තුළම රජයන අපරියාප්තය නිසාය. කෙසේ වෙතත් ඉන්දීය අර්ධද්වීපික දූපතක් වන ශ්‍රී ලංකාවේ ගතවූ සියවස් පහ පමණ කාලය පුරා සංස්කෘතික ව්‍යූහය තුළ ආධිපත්‍යධාරී වී සිටියේ යුරෝපීය යටත්විජිත හා පශ්චාත් - යටත්විජිත ප්‍රවාහයන් බව මා ප්‍රජානනය කරන විට, උගන්නා විට, ඊවා නිෂේධ කිරීමකට හෝ හරණය කිරීමකට හෝ භාජනය කරන්නට මා නම් ලැහැස්ති වන්නේ නැත. මගේ වචන කෝෂයේ නිෂේධය හා හරණය යන පද වෙනුවට ඇත්තේ විමුක්තිය ලැබීම හෙවත් අත්මිදීමයි. විමුක්තිය ලැබීම හෙවත් අත්මිදීම යනු නිෂේධය / හරණය වැනි අස්ථිලමටයක්ද 'ඉකිලා පිළිගැනීම' වැනි කාමසුඛල්ලිකානුවක්ද නොවේ. ඒ වනාහි බුද්ධි උත්පාදනය නම් මධ්‍යම ප්‍රතිපදාවයි. යථාර්ථය විපරිනාමය කරනු පිණිස යථාර්ථය බුද්ධිගෝචර කර ගැනීමයි.

ස්වභාවධර්මයේ ද්වීශරතය පිළිබඳ දර්ශනය ප්‍රත්‍යුස්ථාපනය කරමින් ෆෙඩ්රික් එංගල්ස් 19 වන සියවසේදී ඉදිරිපත් කළ නිෂේධයේ නිෂේධය නම් පශ්චාත් - හෙගල්වාදී නියාමය ස්වකීය මතය සනාථ කිරීම සඳහා අනු අනුවේ ඒකපාර්ශ්වීය ලෙස මෙම නිෂේධකයන් හා හාරකයන් විසින් ඉදිරිපත් කරන ලෙසක් මම දකිමි. කලාව හා සාහිත්‍යය පිළිබඳව යෙනෑන් මණ්ඩපයේදී මා - ඕ - සේතුං විසින් ඉදිරිපත් කරන ලද 'විනාශ කිරීමෙන් තොර ගොඩනැගීමක් නැත' යන්න සන්දර්භයෙන් පිටතට ගෙන අතිසරලකරණයකට ලක් කරන ලද තුළ උක්තියක් වශයෙන් සලකා එහි පිටුබලය මෙම හාරක / හාරක සමාගමය ලබා ගන්නා බවක් මම දකිමි. විමුක්තිය ලැබීම හෙවත් අත්මිදීම යනු කිසිවකුත් කුළුගෙඩි පහරවල් දී සුණුවිසුණු කිරීමේ ක්‍රියාදාමයක් නොවන බව මම විශ්වාස කරමි. ඒ වනාහි තුල් ඇතෙනා කොරහැඩි ගල් ගෙඩියක් දිය ඇල්ලකට අසුවෙමින් කාලයාගේ ඇවෑමෙන් මැදී පට්ටම් වී මල් පෙත්තකටත් වඩා මාගමකගේ දෙතොලකටත් වඩා සුසිනිඳුවීමේ ක්‍රියාදාමයක් බඳුය. මේ සඳහා ගතවෙන කාලයේ අඩුවැඩිවීමක් දක්නට පිලිවන් බව සැබැවකි.

එහෙයින් අධිරාජ්‍යවාදය හා යටත්විජිතවාදය ආධිපත්‍යධාරී වෙමින් ව්‍යූහනය වී සිටෙන මගේ අතීතය හෙලා දකින්නට මම රුචි නොවෙමි. මන්ද කියනවා නම් මගේ අතීතයේ බොහෝ පාර්ශ්වයයන් මගේ වර්තමානයේ තර්කානුකූල විස්තීරණයන්ද වැවිනි. අධිරාජ්‍ය විරෝධය හා යටත්විජිත විරෝධය යන සංකල්ප මා සලකන්නේ මගේ ඇතුලාන්තයේත් බාහිර පරිසරයේත් රජයන සංස්කෘතික නිර්මිතයන් බුද්ධිගෝචර කරවීමත් නුබ නමා කරවීමත් හැටියට මිස මූලෝත්පාටනයක් ලෙස නොවේ. මේ වනාහි මතුල නිරන්තරයෙන් සිදුවන ආදීනත හා අදාතන අතර ගැටුම මිස ඊට වැඩිමනත් දෙයක් නොවේ. මගේ ප්‍රජානනය බලවත් වෙතම මා යොමුවන්නේ මගේ සංස්කෘතික අනුභූතිය තවතවත් පුළුල් කරන්නටය. දැනටමත් මගේ අනුභූතිය තුල තැන්වී පවත්නා අධිරාජ්‍යවාදයේ සහ යටත්විජිත වාදයේ සහ පශ්චාත් - යටත්විජිතවාදයේ සංස්කෘතික ව්‍යූහයන් ඔබ්බෙහි ගොස් නව සංස්කෘතික ව්‍යූහයන්ට පරිකල්පනීය ලෙසින් හෝ ඇතුළුවන්නටය. ඒකල සංස්කෘතික නොවී බහු සංස්කෘතික මිනිසෙකු ලෙසින් නිර්මාණය වන්නටය. ඇත්තෙන්ම මට අවශ්‍ය වන්නේ මගේ බුද්ධියත් වින්දනයත් මගේ කාලයට වඩා ඉදිරියෙන් පිහිටුවා ගන්නටයි. එසේ බැරිනම්, යටත් පිරිසෙයින් 2000 වැනි අවුරුද්ද සඳහාවත් සූදානම් කරන්නටයි.

## පසු ලිපිය

මෙතුවක් වෙලේ පශ්චාත් - යටත්විජිතවාදී සාහිත්‍යික පාඨනය පිළිබඳව සම්භාෂණයක් ඇගෙන් මා සංග්‍රහ කරන ලද්දේ නව යව්වනයෙකුත් ඊට පසු කාලයේදීත් මා සියලු ඉංග්‍රීසි සාහිත්‍යය ගැන නොවේදැයි විශේෂ ඔබට සිතෙනු ඇත. එසේ සිතුනොත් එය වැරදි නොවේ. මේ සමයේදී මා සියලු පශ්චාත් - යටත්විජිතවාදී සාහිත්‍යයට අදාල සිංහල පාඨ පිළිබඳ සම්භාෂණයක් ඔබ හා පවත්වන්නට මම ඉදිරි දිනෙකදී බලාපොරොත්තුවෙමි. සිංහල සාහිත්‍යික පාඨනයට මා අවතීර්ණවන්නට බලාපොරොත්තු වන්නේ මා සියලු මුල්ම සිංහල කාල්පනික ප්‍රබන්ධය වන පියදාස සිරිසේනගේ කෘතියක් පඨනය වශයෙන් යොදා ගෙනය. මුල් කියැවීමෙන් අනතුරුව මම මීනා, සිරිබරී, ලීලා, සෝමා ආදී පම්දේවන් අලලා සංග්‍රහ කැරුණු ආඛ්‍යාන රැසක් කියවමින් සිංහල තුළ කාන්තාව ගැන සංකල්ප රූප මවන්නට පටන් ගනිමි. යටත්විජිතවාදී බලපෑම සිංහල සංස්කෘතිය පෝෂ් ගාතා අත්දම ගැන මේ කෘතීන් මගින් කියාදෙන්නට මහත්සි ගන්නා ලදැයි අද මම සිතමි. තාපෂණය අතින් දුප්පත් වූවත් මේවා 'සිංහලකම' පොහොසත් කරන බව මම එද සිතුවෙමි. එහෙත් මේ කතන්දර අද නැවත කියවද්දී මා ලබන්නේ වෙනයම් වින්දනයකි. ඒ වින්දනය කෙසේවත් පිනමාස්කෝපී හා ටෙක්නිකලර් රූපරාමු නිසා ඇතිවෙන වින්දනය වැන්නක් නම් නොවේ.

1960 ගණන්වලදී 'යටත්විජිත හා පශ්චාත් - යටත්විජිත සාහිත්‍යික පාඨනය' මතුවූයේ ඉංග්‍රීසි අධිරාජ්‍යවාදයේ සහ යටත්විජිතවාදයේ උත්පාදකයා වූ මහා බ්‍රිතාන්‍යයේමය. එහෙත් එය අදහසන පාඨන භාෂණයක් වශයෙන් වඩා සංවිධිත වූයේ 1970 ගණන්වලදීය. පෙර බ්‍රිතාන්‍ය යටත්විජිතයන්ව පැවති රටවල හෝ බ්‍රිතාන්‍යයේම හෝ වසන බ්‍රිතාන්‍ය ජාතික නොවන ලේඛක පිරිසක් අතින් ප්‍රබල සාහිත්‍ය ව්‍යාපාරයක් බිහිවීමේ ආරම්භයත් සමගමය. ක්‍රමයෙන් මේ සාහිත්‍යික පාඨන විධිය විශ්ව විද්‍යාල ගණනාවක් පුරා ජනප්‍රිය වූයෙන් ඒ වෙනුවෙන් අයත්වන ලේඛක පිරිසද ක්‍රමයෙන් වැඩිවිය. ඉංග්‍රීසි බසින් කැරෙන මෙම පශ්චාත් යටත්විජිත සාහිත්‍යික සම්පාදනය වනාහි ඉංග්‍රීසි යටත්විජිත වාදය පිළිබඳවම කැරෙන විශකීම් සහගත විවරණය අර්ථ පාඨනයක් බව ඉක්මනින්ම පිළිගැණිනි. දැනට විශ්ව විද්‍යාල කිපයකම පශ්චාත් යටත්විජිත සාහිත්‍යය යටතේ අර්ථපාඨනය සඳහා භාවිතා කැරෙන ප්‍රබන්ධ ගණයට අයත් මූලික කෘතීන් සමහරකගේ හා ඒවා කළ ලේඛකයින්ගේ නාම ලේඛනයකි පහතින් පළවන්නේ.

චිනුවා අචිබෙ
Things Fall Apart, Arrow of God

ඊ. ආර්. බ්‍රේත්වේට්
Right of passage

ඊ. එම්. ෆෝස්ටර්
' Passage to India

එල්. කේ. ජොන්සන්
England is a Bitch

වී. එස්. නයිපෝල්
The Mimic Men

ආර්. කේ. නාරායන්
Bachelor of Arts

එන්ගුගි වාතියොන්ගෝ

ජෝජ් ඕවල්

ජේ ඊවී සහ ඩී. වේක්

සල්මන් රුෂ්ඩි

හනිෆ් කුරේෂි

ෆාරූක් දොන්දි

ඒ හැරෙන්නට මතවාදය ගැන සාකච්ඡා පහත සඳහන් ලේඛකයින්ගේ කෘතීන් කීපයක්ද මේ අතරට එක්වෙති.

එඩ්වඩ් සයිද්

එන්ගුගි වාතියොන්ගෝ

මාටින් ග්‍රීන්

සල්මන් රුෂ්ඩි

ජේ. මෙයර්ස්

රොබට් ග්වින්ස්

# ලංකාවේ කලාව අදහන අය වෙතට

(දීප්ත කුමාර ගුණරත්න 'ආප්ප' ත්‍රෛමාසිකයේ සංස්කාරකවරයාය. තවද සැමුවෙල් බෙකට් ගේ 'ගොඩෝට් රහසං' නාට්‍ය ඔහු අතින් නිෂ්පාදනය විය.)

දීප්ත කුමාර ගුණරත්නයෙන්

මේ දැන් මේ මොහොතේ තත්වය, අපගේ 'දේවල්' පිළිබඳ විග්‍රහයන්ට වඩා සංකීර්ණ යැයි මම විශ්වාස කරමි. මෙම අදහස් විසින් ප්‍රකාශ කරන සත්‍යය මේ දැන් 'මේ මොහොත' මිස ඊයේ හෝ හෙට හෝ ගැන නොවේ. තව ටිකකින් ගැන සිතීමට අපට පොළඹවාලන න්‍යායන් සහ විශ්ලේෂකයන් ඇති තරම් අපිට ඇති මුත් 'මේ මොහොත' ගැන අපි නො සිතන්නෝ වෙමු. ඒ නයින් මේ සටහන ලංකාවේ මේ මොහොතේ කලාව ගැන මානසික විශ්ලේෂණයකි.

දවසක් මට යාළුවෙක් කිව්ව 'ගොඩෝ' රහසං' කොපි කරල හදපු නාට්‍යයක් තියෙනවා 'රහහල' කියලා කොහොමහරි බලන්න කියල. පස්සේ දවසක ගොඩෝ කොපි කරපු ඒ නාට්‍යය මං නැරඹුවා. නැබැයි මට ප්‍රශ්නයක් ඇති වුණා. ඒ තමයි අර මගේ මිත්‍රයාගේ ප්‍රකාශය - ගොඩෝ කොපි කරල හදපු නාට්‍යය.

'රහහල' කියන නාට්‍යයේ නිෂ්පාදක 'රොයිස්ටන් ජූඩ්' කියන 'කළු පාට' කොල්ලෙක්. එම නාට්‍ය නිෂ්පාදනය මට ගොඩෝ තරම්ම සංකීර්ණයි. එහි රඟපෑම් පවා බොහෝම සංකීර්ණයි. රොයිස්ටන් ගොඩෝ නරඹලාවත් තිබුණේ නැහැ. අනික ඔහු ඉංග්‍රීසියෙන් ගොඩෝ කියවලා තිබුණෙත් නැහැ. හොඳයි එහෙමනං අර මිත්‍රයාගේ ප්‍රකාශයේ අර්ථය කුමක්ද? මං හිතන්නේ එම තත්වය 'රහහල' කියන නාට්‍යය තුළින් පමණක් තේරුම් ගන්න පුළුවන් දෙයක් නෙවි.

පස්සේ දවසක මං ආචාර්ය සුනන්ද මහේන්ද්‍රගේ 'සොක්‍රටීස්' නාට්‍යය බැලුවා. ඊටත් පස්සේ දවසක පුවත්පතක දැක්ක රාජ්‍ය නාට්‍ය උළෙලේ දෙවන වටයේ තරඟ ප්‍රතිඵල. එම ලේඛනයට 'රහහල' ඇතුළත් වී නොතිබුණ අතර 'සොක්‍රටීස්' ඇතුළත් වී තිබුණි.

මගේ මිත්‍රයාගේ ප්‍රකාශය - ගොඩෝ කොපි කරපු නාට්‍යය - සහ සොක්‍රටීස් දෙවන වටයට තේරීම අතර සමාජ සම්බන්ධතා පිළිබඳ රචනයක් ලිවිය යුතු යැයි මට හිතුණා.

මුළු රචනාවේ ම හරය මට තනි වැකියකින් මෙසේ ලිවිය හැක.

'ලංකාවේ සිවිල් බල සම්බන්ධතා තුළ ආධිපත්‍යයක් නැති රොයිස්ටන් ජූඩ් ගේ නාට්‍යය දුර්වල වන අතර ලංකාවේ සිවිල් බල සම්බන්ධතා තුළ ආධිපත්‍යයක් සහිත ආචාර්ය සුනන්දගේ අර්ථකතන වැරදි නොවක් සහිත නාට්‍ය කෘතිය 'මාර' කෘතියක් වේ'.

ඉහත වාක්‍යයේ විෂයමූලික කොටස ප්‍රසාරණය කිරීමට දැන් උත්සාහ කරමි. නමුත් ඊට පළමුව මෙම රචනාව කියවන්නෙක් ඔබ මේ 'සිවිල්' කියන වචනයෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඇසුවොත් මම මෙසේ පැහැදිලි කරමි.

මාක්ස්වාදී සමාජ විද්‍යාව තුළ 'සමාජය' යැයි අප වටහා ගන්නා සංකල්පය තුළ සිවිල් සමාජය සහ මිලිටරි සමාජය යනුවෙන් සංකල්පීය කෙදිවක් පවතී. අර්බුද රහිත විටෙකදී සිවිල් සමාජය ප්‍රාථමික කලයේ මෙහෙයවනු ලබන්නේ දේශපාලන සමාජ විද්‍යාව මගින් ය. ද්විතියික කලයක දී සිවිල් සමාජය මෙහෙයවනු ලබන්නේ සිවිල් පරිපාලන නිලධාරීන්ය. මේ තලය මැක්ස් වෙබර් නිලබල රටා ලෙස හඳුනාගන්නාව. තෘතියික තලයක දී තත්වය වඩාත් සංකීර්ණ වේ. මෙම තලයේ දී මිනිසුන් මෙහෙයවනු ලබන්නේ 'බලය' (මෙම සංකල්පය මිචෙල් ෆූකෝ විසින් හඳුනා ගන්නා ලදී.) විසින් යැයි සිත්ද කළ හැක. එක මිනිහෙක්ගෙ 'බලය' තව මිනිහෙක් මතට වැටුණාම එක මිනිහෙක් සමාජය තුළ ආරෝහණය වෙනම අනෙකා අවරෝහණය වෙනවා. යම්කිසි පුද්ගලයෙක්, එක්කෙනෙක් ට උඩ අරින අනික් කෙනාව පහත දාන මේ බලය කියන මැජික් පොල්ලේ සංරචකයන් හෙව්වොත් බලය කියන සංකල්පයේ දේශපාලන සීමාවන් ටික අවබෝධ වෙනවා. ඉතිං යම්කිසි කෙනෙක් තව කෙනෙක් තුළ පවතින 'බලය' සංරචක වලට කැඩුවොත් බලය නිර්මාණය වෙලා තියෙන සමාජ ගොඩනැංවීම සොයා ගන්න පුළුවන්. මේ 'බලය' ගැන මාන සෙවීම 'සිවිල්' කියල සංකල්පයක් ඇසුරෙන් පැහැදිලි කරන්න පුළුවන්. මං මේ සටහනේ දී සිවිල් කියල අදහස් කරන්නේ ඔන්න ඔය සංකල්පයට. මේ සිවිල් කියන සංකල්පය පාවිච්චි කරල අපිට පුළුවන් සමාජයේ මිනිස්සු අතර සම්බන්ධතා වඩාත් දේශපාලනිකව වටහා ගන්න. යම්කිසි කෙනෙක් මෙම සිවිල් කියන සංකල්පයේ මාන සෙව්වොත් ඔහුට හෝ ඇයට හැකි වෙනවා 'ලිංගිකත්වය' කොහොමද සමාජය නිර්මාණය කරන්න පාදක වෙලා තියෙන්නේ කියා. මෙය භාෂාව ඇසුරෙන් ගොඩනගන්න පුළුවන් අවසාන සංකල්ප තලය (දැනට) කියල මම විශ්වාස කරනවා. (මං දන්න තරමින් සිවිල් සංකල්පය ප්‍රසාරණය ශ්‍රී ලාංකීය නිර්මාණයක්.)

දැන් අපි සිවිල් සංකල්පය මෙම රචනාවේ සංකල්ප පැහැදිලි කිරීමට යොදා ගමු.

'සොක්‍රටීස්' යනු තවත් නාට්‍යයකි. එය රොයිස්ටන් ජූඩ් ගේ 'රහහල' නාට්‍යයට වඩා සාපේක්ෂව හොඳයි. සොක්‍රටීස් නාට්‍යයේ ජනප්‍රිය නළු නිළියන් (මනෝරත්න, චාන්දනී) රඟපාන අතර 'රහහල' නාට්‍යයේ කවුරු ~~රඟපෑවෙ~~ වාදැයි අපි නොදනිමු. සොක්‍රටීස් බුද්ධිමය නාට්‍යයකි. රහහල කොහොම නාට්‍යක් දැයි සිතීමට අපිව පොළඹවාලන්නේ නැත. සොක්‍රටීස් නැරඹිය යුතු නාට්‍යකි. ඒ නිසා ඒ බව ජනතාවට ප්‍රකාශ කළ යුතුය.

# ක්වොන්ටම් භෞතික විද්‍යාවේදී වස්තූන් පිළිබඳ විග්‍රහය සම්භාව්‍ය භෞතික විද්‍යාවේ වස්තූන් පිළිබඳ විග්‍රහයට වඩා වෙනස්ය.

සොකුටීස් යනු ප්‍රවීණ සුනන්දගේ තවත් ප්‍රවීණ නාට්‍යයකි. හොඳයි අපි මෙහෙම ප්‍රශ්නයක් අහමු.

ඇයි බියගොල්ලෝ සුනන්ද දිහා බලන තරම් ප්‍රජාතාන්ත්‍රික ව රොයිස්ටන් ජුඩ් දිහා නො බලන්නේ?

මං හිතන්නේ ඉහත ප්‍රශ්නය බුද්ධිමතුන් තුනදෙනෙක් සුළු කොට තකන ක්ෂුද්‍ර සෝන්ද්‍රිය දේශපාලන ප්‍රශ්නයක්. වෙන ආකාරයකට කිව්වොත් ලංකාවේ අද දවසේ කලාව තුළ පංති අරගලය හඳුනා ගැනීමට වෙර දැරීමක්. ආර්ථික ආකාරයකට කිව්වොත් මැද පන්තියේ ආධිපත්‍යය ජීවමාන ගුම්බ මතට වැටිලා තිබීම පිළිබඳ ප්‍රශ්න කිරීමක්. බලය ආකාරයකට කිව්වොත් සුනන්දගේ බලය ප්‍රශ්න කිරීමක්. 'දේශපාලන බලය' ආකාරයකට කිව්වොත් අධිපති කලාවේ බලය ගැන ප්‍රශ්න කිරීමක්.

රොයිස්ටන් ජුඩ් ගේ අංශක බිංදුවයි දශම බිංදුවයි එකක වැරැද්ද පවා දකින ඇස්වලට සුනන්දගේ අංශක එකයි දශම එකක වැරැද්ද පවා නොපෙනෙන්නේ ඇයි? මේ දේවල් දැනට ලංකාවේ භාවිතා වන ජනප්‍රිය විචාර පෝරිසම් තුළින් තාර්කිකව තේරුම් ගන්නට නොහැකි වන්නේ ඇයි?

දැනට ලංකාවේ විචාර විශ්වයේ ප්‍රධාන න්‍යායික පද්ධතිය කලාව තුළ මානුෂික සම්බන්ධතා මහේක්ෂ දේශපාලන විශ්වයේ න්‍යායික පද්ධතීන් විග්‍රහ කිරීමයි. (උදා: සුනිල් විජේසිරිවර්ධන, ජයදේව උයන්ගොඩ) මෙම නව ප්‍රජාතාන්ත්‍රික විචාර විශ්වය කලින් පැවති දාස-අනම්‍ය භෞතිකවාදී විචාරයේ නිම්තයන් පුරුල් කරන මුත් මිනිස් සම්බන්ධතා පිළිබඳ ප්‍රශ්නය ගැන එතරම් සැලකිල්ලක් දැක්වූයේ නැති බව මගේ පුද්ගලික හැඟීමයි. මම මේ රචනාව මඟින් උත්සාහ කරන්නේ කලාව තුළ මානුෂික සම්බන්ධතා ක්ෂුද්‍ර දේශපාලනය (Micro Politics) ඇසුරු කොට විග්‍රහ කිරීමයි. ක්ෂුද්‍ර දේශපාලනය විශ්වය භෞතික විද්‍යා භාෂාවකින් කියනවනම් හරියට ක්වොන්ටම් භෞතික විද්‍යාව වගේය. ක්වොන්ටම් විද්‍යාව තුළ දී වස්තූන් යනු සම්භාව්‍ය භෞතික විද්‍යාව තුළ වස්තු පිළිබඳ විග්‍රහයට හාත්පසින්ම වෙනස්ය. ක්වොන්ටම් භෞතික විද්‍යාවේ සංකල්ප වලට අනුව වස්තූන් යනු අපගේ සංකල්ප වල ප්‍රතිඵලයකි. (උදා: හයිසන්බර්ග් ගේ අනිශ්චිත මූලධර්මය - වස්තුවක පිහිටීම සහ ගම්‍යතාවය එකවර මැනිය නොහැක.) එමෙන්ම යම්කිසි වස්තුවක ජ්‍යාමිතික හැඩතල (හතරැස්, රවුම්, ත්‍රිකෝණාකාර) අපගේ අත්දැකීම් ක්ෂේත්‍රය තුළ නිරපේක්ෂ ය. නමුත් මෙම නිරපේක්ෂතාවය තීන්දු කරනුයේ අපගේ ඉන්ද්‍රියන්ට දැනෙන මානවල (ත්‍රිමානය) ප්‍රතිඵලයක් ලෙස ය. මාන ප්‍රමාණය වැඩි වන විට අප නිරපේක්ෂ යයි සිතන ,වස්තු වල ජ්‍යාමිතිය විපර්යාස වෙයි. චතුර්මානය තුළ මේ සඳහා උදාහරණ දෙකක් දැක්වීමට මම කැමතියි. පැවැත්ම කියන සංකල්පයට කාලය කියන නව මානය එකතු කරලා කාලයේ පැවැත්මක් විදිහට පැවැත්ම විද්‍යාවක් බවට පත් කළ හෛඩිගර් ගේ දාර්ශනික ස්ථාවරය. මේ ස්ථාවරය ඩෙරිඩා සහ ගදමර් වැනි චින්තකයන්ට බලපෑව. අනික තමයි කාලය සහ අවකාශය කියන දෙවිධ සංකල්පය වෙනුවට අයින්ස්ටයින් අවකාශ-කාලය සංකල්පය හඳුන්වා දීම. මේ ස්ථාවරය පෝලි, ෂ්‍රෝඩිංගර්, හයිසන්බර්ග්, බෝර් වැනි චින්තකයන්ට බලපෑව.

සාම්ප්‍රදායික සමාජ විද්‍යාව තුළ අවට ඇති මිනිස් චරිත හඳුනා ගැනීමේ දී අපවිසින් බොහෝ විට පාවිච්චි කරනු ලබන්නේ නිරපේක්ෂ සංකල්පයන් ය. උදාහරණයක් වශයෙන් අපේ ලඟින් ඇසුරු කරන්නෙකුට අප එකවර මිතුරෙකු සහ සතුරෙකු විය නොහැක. නමුත් දැන් පවතින සමාජ සංකීර්ණත්වය විසින් මිනිස් චරිතවලට ඉතිහාසයේ අපි දී තිබූ නිරපේක්ෂ හැඩ අද දවස වන විට විපර්යාස වී ඇත. අද දවසේ මිනිස් චරිතවල ජ්‍යාමිතික හැඩ තම තමන්ගේ සමාජ භාවිතාවේ ගැඹුර විසින් තීන්දු කරන බව සමාජය ගැන සංවේදිතාවයක් දක්වන්නාට දැනේ. (කියවන්න කුන්ඩේරා, කොෆ්ට්ස්, විචඩ් රයිට්, පැවෙසි - බලන්න පීටර් ග්‍රීන්වේ ගේ චිත්‍රපටි.)

පසුගිය මෑත ඉතිහාසය තුළ යම් යම් අවස්ථාවල මම සමාජයේ විවිධ හැඩතලවලට ක්ෂුද්‍ර දේශපාලන උපක්‍රම මඟින් පිළිතුරු දුන්නා. ඒ බොහොමයක් උපක්‍රම අවසාන වූයේ මම තරමක් සිටින්නේ මනෝ මූලික විකාරයක් යැයි ලේබලයක් මා මතට එල්ල කිරීමෙනි. එක් අතකින් මෙම රචනාව මගේ මනෝ-මූලික විකාරයේ විෂය මූලික ප්‍රකාශනය විය හැක.

දැන් අපි ක්ෂුද්‍ර දේශපාලනය පාවිච්චි කරල රොයිස්ටන් ජුඩ් සහ සුනන්ද මහේන්ද්‍රගේ සමාජ ජීවිතය සංශ්ලේෂණය කරමු.

සුනන්ද කියන්නේ විශ්ව විද්‍යාලයක මහාචාර්යවරයෙක්. ඒක නිසා එයාට ඉන්න ගොඩාක් යාලුවෝ සාපේක්ෂ වශයෙන් විසිරිලා ඉන්නේ මේ රටේ බුද්ධිමය ආධිපත්‍යයක් සහිත සමාජ ස්ථරයක් තුළ. ලංකාව තුළ සුනන්ද සාහිත්‍යකරුවෙක්, පරිවර්තකයෙක් හැටියටත් ප්‍රසිද්ධයි. අනික ලංකාවේ කලා කෘති විනිශ්චය කරන බොහෝ බුද්ධිමතුන් සුනන්දව හඳුනනවා. සුනන්ද ඉංග්‍රීසියෙන් ගොඩාක් පොත් කියවපු කෙනෙක්. සුනන්දගේ ගෝලයෝ කලාවට සම්බන්ධ ආයතන සහ පුවත්පත්වල රැකියාව කරනවා. ඔන්න සුනන්දගේ සමාජ - විද්‍යාත්මක හඳුනන.

දැන් අපි බලමු රොයිස්ටන් ගැන.

රොයිස්ටන් කලුයි. මිනිහව කලා ක්ෂේත්‍රයේ ගොඩ දෙනෙක් අඳුනන්නේ නැහැ. මිනිහා කලාව ගැන පොත පත කියවල තියෙනවද නැද්ද කියල අපි දන්නේ නැහැ. මිනිහගේ නම මීට ඉස්සෙල්ල කවදාවත් අහලත් නැහැ. අඩුම ගානේ වෙන කලා කෘතියක හරි පෙනී හිටපු බවක් අප අහල නැහැ.

දැන් මේ හඳුනන් දෙක ලංකාවේ සමාජය තුළ ගන්න වලනය (PLAY) කොහොමද කියල බලමු.

ඔන්න රොයිස්ටන් ව අඳුනන්නේ නැහැ. අඳුනනව කියන මතවාදය නැතිව කලාව විග්‍රහ කිරීමට සංජානනයක් (COGNITIVE FACTOR) සිංහල සමාජය තුළ නැහැ. නමුත් රොයිස්ටන් අපිට නාට්‍යයක් පෙන්නල තමාරයි. එයා අහනව අපෙන් කොහොමද මගේ නාට්‍යය කියල. අපි එයාගෙන් හඳුනන ඉල්ලනවා. ගුණයන්ගේ (ලෝක සමාජ විද්‍යාවේ බල රටාවන්ට අනුව) පිහිටීම අපි කියනව මෙහෙම. නාට්‍යය තරමක් හොඳයි. ගන්න කියල එච්චර දෙයක් නැහැ. බෙකට් ගේ ආභාෂය හුඟක් දකින්න පුළුවන්. ඊලඟ සැරේ බෙකට් වගේම වෙන්න.

දැන් අපි මෙහෙම හිතමු. ලෝකේ බෙකට් කියල කෙනෙක් හිටියේ නැහැ කියල මොහොතකට හිතමු. එතකොට අපි ව රොයිස්ටන්ගේ නාට්‍යය තේරුම් ගන්න විද්‍යාවක් නැති නිසා අපි ඒකට කියනව තනිකරම විකාරයක් කියල. ඒත් ජාත්‍යන්තර සිවිල් බල රටා තුළ අපි හිතන විශ්වය තුළට බෙකට් කියල සංකේතයක් ඇතුල් වෙලා. ඒ නිසා අපි රොයිස්ටන්ට කියනව ඔයා බෙකට් වගේ කියල හැබැයි අපි බෙකට් කියන වචනය ප්‍රථමයෙන් මුලින්ම හඳුනා ගත්තේ 'අසම්මත' කියල වචනයකින්. හැබැයි ඉතිං මේ ඔක්කොම මොහොතකට විකාරයක් කියල

32 වෙනි පිටුවට

# භාෂාවේ මතවාදය ගැන....

## ආචාර්ය අර්ජුන පරාක්‍රමගෙන්

**පසුගිය ප්‍රවාද කලාපයේ පළවූ මහාචාර්ය ගමිලත්ගේ සිගිරි ගී පිළිබඳ ලිපියට පිළිතුරකි.**

මහාචාර්ය සුචරිත ගමිලත්ගේ ප්‍රයෝජනවත් ලිපිය ගැන මා ලියන්නට අදහස් කළේ එහි අඩංගු ප්‍රධාන උපකල්පනයක් පිළිබඳව ගැටළුවක් මතු කිරීමටයි. එතුමාගේ ලිපියේ මූලික දුර්වල කම වූයේ ස්ත්‍රී රූප වාර්ණනාවේ ගැබ් වූ ලිංගවාදී ආධිපත්‍ය මතවාදය විමසුමට ලක් නොකිරීම බව නිසැකයි. ඒත් භාෂාව හා භාෂාවේ සමාජවිද්‍යාව පිළිබඳව එතුමාගේ මතවාදී ස්ථාවරයට විකල්ප මතවාදයක් ඉදිරිපත් කරන්නට මා මෙහිදී උත්සාහ කරන්නේ මෙම ප්‍රශ්නය පොදුවේ පවතින එකක් යැයි මට පෙනෙන නිසයි. එමෙන්ම එය තුළින් වර්ගවාදී, තව යටත් විජිතවාදී හා විද්වත්වාදී කිරණවලට ද අප ගොදුරු වේ යයි මගේ මතයයි.

නිශ්පාදන රචනාවේ කථනය (narrative) තුළින් කතිකාවත් (discourse) වල ද්‍රව්‍යමය පදනම පෙන්නුම් කිරීමේදී අතිසරල කිරීමක් මහාචාර්ය ගමිලත් විසින් සිදු කොට ඇත. 4 වන හා 5 වන සියවසේ සිටිවුණු සුවිශේෂ 'වැඩ නොකරන' පංතිය ගැන ලියද්දී එතුමා පවසන්නේ,

'කමුත් ඔවුන්ට මේ ජීවිත සෞන්දර්යය ප්‍රකාශ කිරීමට බසක් තිබුණේ නැහැ. 4 වන ශත වර්ෂයට පෙර සිංහල භාෂාවේ මනුෂ්‍ය ශරීරයේ සෞන්දර්යය වර්ණනා කරන බසක් තිබුනේ නැ' යන්නයි.

මගේ ප්‍රථම ප්‍රශ්නය වන්නේ මෙවැනි නිගමනයකට එළඹීමට අප යොදා ගන්නා සාක්ෂි මොනාවාද කියා විමසීමයි. අපි මේ ගැන විකක් හිතුවා නම්, සාක්ෂි හැටියට සැළකිය හැකි වන්නේ දැනට අපට හසුවන ලිඛිතව පවතින දේ පමණක් බව පැහැදිලියි. මෙයයි මේ භාෂා මතවාදය තුළ පවතින ප්‍රධාන දෝෂය. ලිඛිත භාෂාව හා භාෂාව අතර අංගසම බවක් තිබේ යන මතය. මෙයටම ගැබ් වූ උප ප්‍රමේයයක් වන්නේ විද්වත්, ප්‍රභූ (elite) භාෂාවත් පොදු භාෂාවත් එකමයි යන අදහස. ඒත් හැබැහම, විද්වත් භාෂාවේ උප අංගයක් සාමාන්‍ය එදිනෙද භාෂාව වීම. මේ මත රැස පැහැදිලිවත් එළිපිටත් නොකිව්වත් ඒවායේ පදනම වී පමණයි අපට භාෂාවේ නැති දේ ගැන මෙලෙස කථා කළ හැක්කේ. මගේ මතය නම් මෙයට වෙනස්ය.

දැනට පවතින ද්විවිධ බස (diglossia) වැන්නක් හෝ ඊට වඩා සංකීර්ණ බහු විධ බස් ස්වභාවයක් (polyglossia) පැරණියේ ද සිංහලේ පැවතුනා නොවිය හැකි ද?. කථා කරන හා ලියන යන ද්විවිධ ආකාරයත්, විධිමත් හා වැහැර යන ද්විවිධයත් පැවතීම තුළ භාෂාවේ එක්තරා අන්දමක ශ්‍රම විභජනයක් සිදුවන්නේ විද්වත් කොටස්වලට වාසිදායක වන ආකාරයටයි. එය එදත් සිදුවුනා, අදත් සිදුවෙනවා. මේ ද්විවිධ ආකාරයෙන් හා අනෙකුත් 'සම්මත' ප්‍රමිතීන් තුළින් භාෂාව තුළ පංති, 'ජාති', ලිංග, වයස්, ප්‍රාදේශීය, අධ්‍යාපන ආදී අරගල සිදුවෙනවා, මැකෙනවා, ආධිපත්‍යය තහවුරු වෙනවා.

මේ බසේ ද්විවිධ බහු විධ ආකාරය නොසලකා හැරීම තුළින් හා ප්‍රමිතීන් වල ආධිපත්‍යභාවය අමතක වීමෙන් අප යථාර්ථය පිළිබඳව නොමඟ යැවෙනවා. මහාචාර්ය ගමිලත්ගේ තර්කයේදී, පවතින සාක්ෂි තුලින් අපට කිව හැක්කේ ප්‍රමිතිගත කළ ලිඛිත භාෂාව තුළ මෙවැනි ශරීර සෞන්දර්යය විස්තරයක් දක්නට නොමැති බව පමණයි. මේ සාක්ෂි වලින් අපට එදිනෙද ව්‍යවහාරයේ හෝ උපභාෂාවල හෝ ප්‍රාදේශීය මට්ටමේ හෝ වියත් නොවන බසෙහි (Slang ඇයි මෙයට අප 'ග්‍රාම්‍ය' කියන්නේ ? මෙහිද නොපැහැදිලි ආධිපත්‍යයක ලකුණ තිබේ.) ඇති / නැති දේ ගැන නිගමන වලට බසින්න බැහැ. මෙවැනි නිගමන වල ප්‍රතිඵල අප තවම විඳිනවා. බටහිර ආධිපත්‍ය පරිණාම වාදී දෘෂ්ටියෙන් පසුගිය සියවස් දෙක තුළ අපේ සමාජ දිහා බලා ඇත්තේ 'අතිපැරණි', (Primitive) 'ප්‍රතිගාමී' හා 'වෙනස් නොවන' (ස්ථිතික) යන ලේබල තුලිනි.

1335 දී මැකෝලේ ඉන්දියාව පිළිබඳව ලියූ ඒ සුප්‍රසිද්ධ 'සටහන' හා මහාචාර්ය ගමිලත්ගේ මේ කියමන අතර එතරම් වෙනසක් තියෙනවාද?. ඇත්තෙන්ම, 'මනුෂ්‍ය ශරීරයේ සෞන්දර්යය' හෝ 'ජීවිත සෞන්දර්යය' ප්‍රකාශ කිරීමට බසක් නොතිබුන හෝ නොතියෙන සමාජයක් මොන විධියේ එකක්ද කියාවත් මට හිතා ගන්න බැ. අප දැන් ඒ සෞන්දර්යය විස්තර කරන ආකාරයට අනුකූල ලෙස එම සෞන්දර්යය විස්තර නොකළා විය හැකි යි. ඒත් ඒ පමණින් ම එවැනි සංකල්ප හා ව්‍යවහාර නොතිබුනා කියා කීම, බටහිර සාහිත්‍යයට අනුකූල සාහිත්‍යයක් නොතිබුනා කියා ඉන්දිය සාහිත්‍යයේ කිසිදු වටිනාකමක් නැ කියා කීමට හාත්පසින් වෙනස්ද? මං සමකාලීන උදාහරණයක් ගෙන මේ තර්කය පෙන්නුම් කරන්නම්. 'මහාචාර්ය ගමිලත්ගේ නිගමනයට 'සමාන' එකක් අපි නියම කරමු. 35 වන සියවසේ, එනම් වර්තමානයෙන් අවුරුදු 1500 කට පසු, ලිඛිත සාක්ෂි පරීක්ෂා කිරීමෙන් අපි නිගමනය කරන්නේ cunnilingus හා Felatio යන ලිංගික ක්‍රියා වලට වචන ('බසක්') අප ශබ්ද කෝෂවල ද, පොත්පත් සඟරාවල ද, ලියුම් ආදියේ ද, දක්නට නොමැති නිසා ඒ ක්‍රියාවලින් 'ප්‍රකාශ කිරීමට බසක් 1992 දී ලංකාවේ 'තිබුණේ නැ' කියලයි. ඒ කියන්නේ එවැනි දේ අපේ අය කළේත් නැ කියා අපට උපකල්පනය කරන්න සිදුවෙයි. මෙවැනි නිගමනයක් හා ගැටෙන්නට අපට 'අශිෂ්ට', වියත් නොවූ, කථා කරන බසේ 'කටට ගැනීම / දීම' 'සූප්පුව', 'මැමල ලෙවකෑම', 'දිව දැමීම' ආදිය සාක්ෂි හැටියට ඉදිරිපත් කළ යුතුයි. ඒත් මේ යෙදුම් මේ බස, අවුරුදු 1500 කට පසුව සොයාගැනක සලකුණු වී තියෙයිද?. ඒවායේ 'ලකුණු' නොමැති පලියට එම ව්‍යවහාර නොතිබුනා යයි අපි දන්නේ කොහේ ද?. අපට කිව හැක්කේ මෙයයි. සැම මිනිස් බසක්ම එය තුළින් ජීවත් වන මිනිසුන්ගේ ජීවිත වලට 'ප්‍රමාණවත්' බවයි. (ශරීර) සෞන්දර්යයත්, සංසර්ගයත් මිනිස් සමාජ වල අනිවාර්ය අංග නිසා ඒවා සඳහා බසක් ද අනිවාර්යයෙන් තිබිය යුතුමයි. මේ බස විටින් විට විද්වත් 'පොලිසිය' මඟින් පාලනය වන නිසා එහි සාක්ෂි හැම විටම දක්නට නොමැත. එමෙන්ම, 'පොදු' බසද මතවාදී වේ. එයට ද වෙනම 'පොලිසියක්' තියෙනවා.

අප කළ යුත්තේ හැකි පමණ පුළුල් ලෙස ක්‍රියා කිරීමත් හැකි පමණ ප්‍රමිතීන් කඩා, හැකි පමණ භාෂාව තුලින් වන පංති, 'ජාති', ලිංග ආදී අසාධාරණයට එරෙහි වීමයි. මේ ක්‍රියාවලියත් දත් මදිනවා වගේ නැමදම කළ යුතුයි. එමෙන්ම එහි ඉවරයකුත් නැහැ. ඒත් එය විද්වත් අපට දත් මැදීම වැනි පහසු හා පුරුදු දෙයක් වෙන්නේ නැ. අපට තුරුස්සන 'අස්වාභාවික' ක්‍රියාවලියක අපට නිරතුරුව යෙදෙන්නට වෙනවා මෙන්ම, මෙය තුලින් අපේ කෙටිකාලීන 'කාර්යක්ෂම බවට' අප අප අතර 'සහෝදර - සහෝදරීත්වයටත්' එයින් බාධාවක් වේ යැයි පෙනේ. ඒත් එය දිගුකාලීන ප්‍රතිඵල තුළින් නිවැරදි දේශපාලනයක අත්‍යවශ්‍ය අංගයකි.

**ග්‍රන්ථ විවේචන**

# ලංකාවේ වමේ ව්‍යාපාරය: විශ්ලේෂණාත්මක ප්‍රවේශයක්

**කර්තෘ: වසන්ත දිසානායක**

**ප්‍රකාශනය : ජනතා ක්‍රියාකාරීත්වය සඳහා වූ අධ්‍යයන හා පර්යේෂණ ආයතනය**

දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ සමාජවාදී සමාජ පරිවර්තනයක් පිළිබඳ වූ ඉදිරි දර්ශනයකින් විවිධ මට්ටම්වලින් දේශපාලන කටයුතු වල නියැලී ඇති වසන්ත දිසානායක සහෝදරයා මෙරට සමාජවාදී ව්‍යාපාරයේ අර්බුදය හා එය වර්තමානයේ අත්විඳින ඓතිහාසික පරාජයට හේතු පිළිබඳවත් මෙරට සමාජවාදී ව්‍යාපාරය ඉදිරියේදී ගතයුතු මඟ පිළිබඳවත් ගවේෂණයක යෙදීමට උත්සාහ දරා ඇත. ඉහත නම් සඳහන් කර ඇති කෘතිය එහි ප්‍රතිඵලයයි. ඔහු විසින් ම මෙම කෘතිය හඳුන්වා දෙනු ලැබ ඇත්තේ පරිපූර්ණ විග්‍රහයක් ලෙස නොව එවැන්නක් සඳහා වන ප්‍රවේශයක් ලෙසයි.

මෙම කෘතිය තුළ අඩංගු කාරණා කාරණා කවරේදැයි සොයා බැලීමට ප්‍රථම, එම කාරණා කාරණාවල හේතු යුක්ත භාවය පිරික්සා බැලීමට ප්‍රථම මෙවැනි කටයුත්තකට එළඹීමේ ඇති වැදගත්කම සොයා බැලීම වටනේ ය.

70 දශකයේ අග භාගය වනවිට මෙරට වාමාංශික ව්‍යාපාරයේ නැත්නම් සමාජවාදී ව්‍යාපාරයේ අප ගමනය පැහැදිලි ලෙස ම දෘශ්‍යමාන වන්නට විය. කලක් මෙරට සමාජයේ ප්‍රධාන හා කේන්ද්‍රීය දේශපාලන ප්‍රවාහයක් වූ සමාජවාදී ව්‍යාපාරය ක්‍රම ක්‍රමයෙන් නොවැදගත් අතුරු ප්‍රවාහයක් බවට පත්වන්නට විය. මෙම ඓතිහාසික ඇද වැටීමත් සමඟ මුලදී වමට ඇතුළුව පෑ බොහෝ බුද්ධිමය ස්ථර ද වමෙන් ඈත්වූවා පමණක් නොව වමේ ජම්මාන්තර වෛරක්කාරයන් බවට ද පත් විය. එම තත්වය තුළ සමාජයේ දක්නට ලැබුණු ආධිපත්‍යයික බුද්ධිමය විවාදයන්හි වාමාංශික සමාජවාදී ව්‍යාපාරය ස්ථානගත වූයේ නොවැදගත් හා නිශේධාත්මක එකක් ලෙසටයි. සමාජවාදී ව්‍යාපාරයේ පරාජය පිළිබඳව ඒ තුළ සිටම කෙරුණු ජනතාත්මක විග්‍රහයන් අල්ප වූවා මෙන්ම ඒවායේ බලපෑම ද නොවැදගත් විය.

අනෙක් අතට වාමාංශික සමාජවාදී ව්‍යාපාරය තුළම දක්නට ලැබුණු බරපතල දුර්වලතාවයක් වූයේ ඒ තුළ ශක්තිමත් බුද්ධිමය සම්ප්‍රදායක් තහවුරු වී නොතිබීමයි. අන්තෝනියෝ ග්‍රාම්ස්චිගේ යෙදුමක් භාවිතා කරන්නේ නම් මෙරට සමාජවාදී ව්‍යාපාරයට අඛණ්ඩ ලෙස 'ඓන්ද්‍රිය බුද්ධිමතුන්' පරපුරක් නඩත්තු කරගැනීමට හැකි වූයේ නැත. ලංකාවේ සමාජවාදී ව්‍යාපාරයේ පුරෝගාමීන් ශාස්ත්‍රෝද්ග්‍රහණය සඳහා යුරෝපයට ගොස් සිටියදී තම බුද්ධිමය පරිශ්‍රමයන් මගින් මාක්ස්වාදී අදහස් උදහස් අවශෝෂණය කරගනු ලැබූ පුරෝගාමී බුද්ධිමතුන් පරපුරක් වූ නමුදු එම පරපුරේ උරුමය සමාජවාදී ව්‍යාපාරයේ දෙවෙනි තුන්වෙනි පරම්පරාවල ඒ ලෙසින්ම දක්නට ලැබුණේ නැත. මේ තත්ත්වය තුළ මෙරට සමාජවාදී ව්‍යාපාරය තුළ බුද්ධිමය රික්තයක් දක්නට ලැබෙන අතර, එහි අපගමනය පිළිබඳ ව ඒ තුළින් ම ප්‍රමාණවත් සාකච්ඡාවක් ඇරඹෙන්නේ නැත්තේ එබැවිනි.

වසන්ත දිසානායක සහෝදරයාගේ කෘතිය ස්ථානගත වන්නේ මෙවැනි පසුබිමක් තුළය. අන් සියළුම කාරණා අමතක කර දැමුවද එහි වැදගත්කම වන්නේ සමාජවාදී ව්‍යාපාරය තුළ හිඳිමින් ම ඒ පිළිබඳ ව ජනතාත්මක දෘෂ්ටි කෝණයකින් බැලීමට ඔහු උත්සාහයක් ගෙන තිබෙන නිසා ය.

දැන් මේ පූර්විකාව සමඟ අපට වසන්තගේ කෘතියට පිවිසීමට හැකිය. වසන්ත සිය කර්තව්‍යයට එළඹෙන්නේ එක්තරා පූර්ව නිගමනයක් මත හිඳිමිනි. එනම් වම සමස්තයක් ලෙස අසාර්ථක වී බිඳවැටී ඇත යන නිගමනයයි. මෙහිදී වමේ නැත්නම් සමාජවාදී ව්‍යාපාරයේ අසාර්ථකත්වය යනුවෙන් අර්ථ ගැන්වෙන්නේ කුමක් ද? සරල ලෙස දක්වනවා නම් වම තම අරමුණු ජය ගැනීමට හෝ එම අරමුණු කරා සාපේක්ෂ වශයෙන් ජයග්‍රාහී මට්ටමකින් ඉදිරියට යාමට සමත් වී නොමැත යන්නයි. මෙරට වමේ ව්‍යාපාරය ආරම්භයේදී ම තම අවසාන අරමුණ ලෙස ඉදිරිපත් කළේ මෙරට සමාජය සමාජවාදී පරිවර්තනයකට භාජනය කිරීමයි. නිෂ්පාදනය බෙද හැරීම හා හුවමාරු මාධ්‍යයන් සමාජ සන්තක කිරීම යනුවෙන් ඔවුන් අදහස් කළේ සමාජවාදී සමාජයක් බිහිකිරීම යන්නයි. මෙරට සමාජවාදී ව්‍යාපාරයේ අසාර්ථකත්වයට, ඓතිහාසික පරාජයට බලපෑ රෝග නිදානය කුමක් ද? වසන්ත සහෝදරයා එය හඳුනාගත්තේ මේ ආකාරයටයි.

'වමේ ව්‍යාපාරයේ කිසිම පක්ෂයකට, සංවිධානයකට නිවැරදි ඉදිරි දැක්මක් නොතිබුනි. සමාජවාදය පිළිගත්තද සමාජවාදයට යාමේදී අනුගමනය කළ යුතු මාවත් සම්බන්ධයෙන් එයට නිරවුල් අවබෝධයක් දැක්මක් තිබුනේ නැත.' (පිටුව 103) වමේ ආරම්භය ගැන කතා කරමින් ඔහු එය තව දුරටත් පැහැදිලි කරයි.

'.........එහෙත් අවසාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍යයෙන්ම ඉටුකළ යුතු පූර්ව කොන්දේසිය එනම් රාජ්‍ය බලය අත්පත් කර ගැනීම මුහුන් පමුණුවා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව වැඩ පිළිවෙළෙහි විස්තර කර නොතිබුණි.' (පිටුව 13)

**නිර්මාල් රංජිත් දේවසිරි විසිනි**

දැන් අපට වසන්ත ප්‍රකාශ කරන දේ හොඳින් පැහැදිලිය. ඔහු පවසන්නේ සමාජවාදී අරමුණු සාක්ෂාත් කර ගැනීමට අත්‍යාවශ්‍යක පූර්ව කොන්දේසියක් යයි ඔහු විශ්වාස කරන රාජ්‍ය බලය ලබා ගැනීම පිළිබඳ ගැටළුවට මෙරට සමාජවාදී ව්‍යාපාරය සාර්ථක අයුරින් මුහුණ දුන්නේ නොමැති බවයි. වසන්ත සහෝදරයා වාමාංශික ව්‍යාපාරය ගැන කථා කිරීමේදී 'විප්ලවීය වමක්' හා 'විප්ලවීය නොවන වමක්' යනුවෙන් වම බෙදා වෙන්කර කථා කිරීමට දැඩි උනන්දුවක් දක්වයි. 'විප්ලවීය බලවේග', 'විප්ලවීය අදහස් දැරූ කොටස්' වැනි යෙදුම් ඔහු නිතර නිතර භාවිතා කිරීමට කැමැත්තක් දක්වයි. මෙහිදී ඉතා පැහැදිලිව ම පෙනී යන කාරණය නම් 'විප්ලවීය වම' හා 'විප්ලවීය නොවන වම' යන විභේදනය කිරීමේදී ඔහු මූලික ම නිර්ණායකය බවට පත්කර ගන්නේ රාජ්‍ය බලය අල්ලා ගැනීම පිළිබඳ ගැටළුව බවයි.

මාක්ස්වාදී සම්ප්‍රදාය තුළ විප්ලවය යන්න යෙදෙන්නේ කුමන අරුතක් දීම පිණිස ද? පදගත අර්ථයෙන් ගතහොත් එමගින් සමූලික පරිවර්තනයක් (Radical Trans-formation) අර්ථ ගැන්වේ. සමාජ සංවර්ධන ක්‍රියාදාමයේදී එයින් සිදුවන්නේ එක් නිෂ්පාදන මාදිලියක් අහෝසි වී නව නිෂ්පාදන මාදිලියක් ස්ථාපිත වීමයි. එනම් නිෂ්පාදන සම්බන්ධතාවයන්ගේ සමූලික පරිවර්තනයකි. නිශ්චිත අරුතකින් සලකා බලනවා නම් එය පංති අරගලයේ තීව්‍ර අවස්ථාවක් ලෙස නම් කළ හැක.

මාක්ස්ට අනුව පංති අරගලය යනු මිනිස් වර්ගයාගේ සංවර්ධනය තීන්දු කළාවූ ප්‍රධාන ප්‍රපංචයකි. ඓතිහාසික භෞතිකවාදය තුළ සමාජ සංවර්ධනයේ විවිධ අවධීන් නිර්ණය කිරීමේලා ප්‍රධාන මිනුම් දණ්ඩ කරගෙන තිබෙන්නේ පංති අරගලයයි. ඒ වහල් යුගය, වැඩවසම් යුගය, ධනවාදී යුගය, යනාදී වශයෙනි. මෙහිදී මෙම යුග බෙදීම පිළිබඳව වසන්ත සහෝදරයා එළඹෙන අතිශය සාවද්‍ය නිගමනයක් පිළිබඳව අපගේ අවධානය යොමු කිරීම ද යෝග්‍ය වේ. ඔහුට අනුව මෙම පංති අරගලයට අනුරූප වන පරිද්දෙන් ඓතිහාසික යුග බෙදීම නොකොට ගල් යුගය, යකඩ යුගය, වාෂ්ප යුගය යනාදී වශයෙන් යුග බෙදීම ධනේශ්වර ඉතිහාසඥයිනගේ හා ඔවුන් අනුව යන්නන්ගේ විධි ක්‍රමයයි. (පිටුව 132)

නමුත් වසන්තගේ එම නිගමනය නිරවද්‍ය නොවේ. අපට ඉතිහාසය දෙස බැලිය හැක්කේ එක් මානයකින් පමණක් නොවේ, එය සැබැවින් ම බහු මානීය වේ. වසන්ත ද නිතර නිතර සඳහන් කරන අපෝහක භෞතිකවාදී විධි ක්‍රමයට අනුව ද එම බහුමානීය තේරුම් ගැනීම පටහැනි වන්නේ නැත. වහල් යුගය, වැඩවසම් යුගය, ධනවාදී යුගය ආදී බෙදීම් අප කරන්නේ ඒ ඒ යුගයන්හි දක්නට ලැබුණු නිෂ්පාදන මාදිලින් හා එම නිෂ්පාදන මාදිලිනට අනුරූප පංති ප්‍රතිවිරෝධතාවයක් සැලකිල්ලට ගනිමිනි. ඉතිහාසය දෙස ඒ ආකාරයට බැලීම මාක්ස්වාදී සම්ප්‍රදායේ වැදගත් උරුමයක් ද වේ. එසේ සැලකීම තුළ, ගල් යුගය, යකඩ යුගය, වාෂ්ප යුගය යනාදී බෙදීම් ධනේශ්වර ඉතිහාසඥයින් පමණක් පරිහරණය කරන හා ඔවුන්ටම පමණක් ප්‍රයෝජනවත් වන යුග බෙදීමක් වන්නේ ද? කිසිසේත් නැත. එහිදී සැලකිල්ලට ගන්නේ මානව සංහතිය අත්පත් කරගත් තාක්ෂණික ජයග්‍රහණයන්ගේ ස්වරූපයට අනුව කරන යුග බෙදීමකි. එබැවින් එම බෙදීම ඉතා ප්‍රයෝජනවත් දෙයකි. 'කාර්මික විප්ලවය' වැනි යෙදුම් වලදී අර්ථ ගැන්වෙන්නේ සමාජ පංතීන් අතර සිදුවූවාවූ සට්ටනයක් නොව මිනිසා පොදුවේ තාක්ෂණික වශයෙන් තබන ලද විශාල ඉදිරි පිම්මකි. 'සමහර ධනේශ්වර ඉතිහාසඥයින් 'කාර්මික විප්ලවය' යන යෙදුම ප්‍රතික්ෂේප කළ ද මාක්ස්වාදී ඉතිහාසඥයින් එය ප්‍රතික්ෂේප කරන්නේ නැත.

දැන් විප්ලවය පිළිබඳ ගැටළුවට නැවත එමු.

සමාජ පරිවර්තනය, පංති අරගලයේ තීව්‍ර අවස්ථාවක් කරා එළඹීම, වැනි පළල් අර්ථ ගෙන දෙන විප්ලවය යන්න වසන්ත සහෝදරයා විසින් හුදු රාජ්‍ය බලය අල්ලා ගැනීම පිළිබඳ ගැටළුවක් දක්වා ලඝු කරනු ලැබ ඇත. ඇත්ත වශයෙන්ම සමාජ පරිවර්තන ක්‍රියාදාමයේ එක් නිශ්චිත අවස්ථාවක රාජ්‍ය බලය අල්ලා ගැනීම පිළිබඳව ගැටළුව කේන්ද්‍රීය ස්ථානයකට පැමිණෙන බව කිව යුතුය. නමුත් රාජ්‍ය බලය පිළිබඳ ප්‍රශ්නය ඔහු වන්නේ 'නිර්ධන පංති පක්ෂයක් අතට සන්නද්ධ 'විප්ලවවාදීන්' පිරිසක් අතට හෝ වෙනත් කණ්ඩායමක් අතට රාජ්‍ය බලය ලබා ගැනීමක් ලෙස නොව අවම වශයෙන් කම්කරු පංතිය ප්‍රමුඛ පොදු පීඩිත සමාජ පංතීන් අතට ධනපති පංතියේ සිට බලය මාරුවීමක් ලෙසයි. වසන්ත සහෝදරයාගේ ඉදිරි දර්ශනයේ පවත්නා උනතාවය නම් ඔහු සමාජ පරිවර්තනය පිළිබඳ සමස්ත ගැටළුව රාජ්‍ය බලය අල්ලා ගැනීම පිළිබඳ කාරණයට උනතාය කිරීමත්, එම රාජ්‍ය බලය අල්ලා ගැනීම පවා ඉතාම සුළුතරයකගේ ව්‍යායාමක් බවට පත් කරලීමත් ය.

මෙහිදී වසන්ත සහෝදරයාගේ අවධානය යොමු නොවන පැත්තක් පිළිබඳව ද සලකා බැලීම වටී. මගේ අදහසේ හැටියට නම් සමාජවාදය ගොඩනැඟීම හා රාජ්‍ය බලය පිළිබඳ ප්‍රශ්නයේදී වසන්ත කථා කරන ඊනියා 'ප්‍රතිසංස්කරණවාදී වමත්' 'විප්ලවීය වමත්' අතර හරයාත්මක

**සමාජ පරිවර්තනය, පංති අරගලය තීව්‍ර අවස්ථාවක් කරා එළඹීම, වැනි පළල් අර්ථ ගෙන දෙන විප්ලවය යන්න වසන්ත සහෝදරයා විසින් හුදු රාජ්‍ය බලය අල්ලා ගැනීම පිළිබඳ ගැටළුවක් දක්වා ලඝු කරනු ලැබ ඇත.**

වශයෙන් එතරම් වෙනසක් නොතිබුණි. 'විප්ලවවාද කණ්ඩායම්' මෙන්ම 'ප්‍රතිසංස්කරණවාදී වමද' (අවම වශයෙන් 50 දශකයේ මැද භාගයේ සිට) සමාජවාදී පරිවර්තනයක් උදෙසා රාජ්‍ය බලය අල්ලා ගැනීම පිළිබඳ, ගැටළුව සමග ගණුදෙනුවට එළඹිණ. 'විප්ලවීය' වමත් 'ප්‍රතිසංස්කරණවාදී' වමත් අතර ඇත්ත වෙනස්කම පැවැතියේ සමාජවාදී පරිවර්තනය සඳහා රාජ්‍ය බලය අල්ලා ගත යුතුද? නැද්ද? යන ගැටළුව මත නොව, බලය අල්ලා ගන්නේ කෙසේද? යන ගැටළුව සම්බන්ධයෙනි. ප්‍රතිසංස්කරණවාදී වම තෝරා ගත්තේ ව්‍යවස්ථානුකූල මාවතකි. මුලදී ඔවුහු තනිව ම පාර්ලිමේන්තුවේ බලය අල්ලා ගැනීමට උත්සාහ කළහ. 1960 ජුනි මැතිවරණයට ලංකා සමසමාජ පක්ෂය ඉදිරිපත් වූයේ ආණ්ඩුවක් පිහිටුවීමේ බලාපොරොත්තුවෙනි. එම උත්සාහය අසාර්ථක වූ තැන ඔවුහු ධනපති දේශපාලන පක්ෂ සමග සභාග ආණ්ඩු සැදීමේ දේශපාලන ක්‍රියා මාර්ගයට පිළිපන්හ. 'විප්ලවීය' වම කල්පනා කළේ ව්‍යවස්ථානුකූල නොවන ප්‍රචණ්ඩ ක්‍රියා මාර්ග වලින් බලය අල්ලා ගතයුතු බවයි. මෙම ධාරාවන් දෙකේම අවසාන නිගමනය වූයේ මෙබඳු එකකි. උත්සාහවන්ත අරමුණු වලින් හෙබි පිරිසක් රාජ්‍ය බලය අල්ලා ගත් ඉක්බිති ?ව සමාජය තුළ සමාජවාදී පරිවර්තනයක් කිරීමට හැකිවන බවයි. 'ප්‍රතිසංස්කරණවාදී' වම මෙහිදී මදක් වෙනස්ව ද කල්පනා කළේය. සමස්ත ආණ්ඩු බලයම නැතත් ධනපති ආණ්ඩුවක ඇමති පදවි කීපයක් හෝ ලැබුණහොත් සමාජවාදී දිශාවකට පියවර තැබීම ආරම්භ කළ හැකි වෙතැයි ඔවුහු සිතූහ. කෙසේ වුවද සමස්තයක් ලෙස 'ප්‍රතිසංස්කරණවාදී' වමේත්, 'විප්ලවීය' වමේත් ඉදිරි දර්ශනය එක සමානම විය. එය අපට ගැටළුවකින් තොරව රාජ්‍ය කේන්ද්‍රීය ඉදිරි දර්ශනයක් ලෙස නම් කිරීමට පුළුවන.

මෙම රාජ්‍ය කේන්ද්‍රීය ඉදිරි දර්ශනයට

ප්‍රතිපක්ෂව ප්‍රවේශයන් දෙකකින් කරුණු ඉදිරිපත් කළ හැකිය. පළමුව එය සමාජවාදී සමාජ පරිවර්තනය පිළිබඳ සම්භාව්‍ය මාක්ස්වාදී ප්‍රස්තුතගත කිරීම්වලට පටහැනිය. දෙවනුව මෙවැනි රාජ්‍ය කේන්ද්‍රිය ඉදිරි දර්ශනයක පවතින අසාර්ථකත්වය හා විනාශකාරී බව පසුගිය දශක ගණනාවේ සමාජවාදී සමාජ පරිවර්තනය පිළිබඳ අත්දැකීම් වලින් ඉතා කදිමට තහවුරු වී ඇත.

යථෝක්ත ඉදිරි දර්ශනය න්‍යායික වශයෙන් සම්භාව්‍ය මාක්ස්වාදී ප්‍රස්තුත ගත කිරීම් වලට පටහැනි වන්නේ ඇයි? මාක්ස්, තමන්ට පෙර සිටි සමාජවාදීන්ගෙන් විශේෂයෙන්ම මනෝරාජික සමාජවාදීන්ගෙන් වෙනස් වන්නේ කුමන ආකාරයෙන්දැයි තේරුම් ගැනීම තුළ මෙම ගැටළුවට යම් ආකාර විසඳුම් සපයා ගත හැක. මනෝරාජික සමාජවාදීන් ද, වත්මන් රාජ්‍ය කේන්ද්‍රිය 'සමාජවාදීන්' මෙන්ම, සමාජවාදය යන්න දුටුවේ උත්කෘෂ්ට අරමුණක් සහිත අධිෂ්ඨානශීලී පුද්ගලයින් පිරිසක් විසින් උත්සාහයෙන් මස්තකප්‍රාප්ත කරගත යුතු පරමාදර්ශයක් ලෙසිනි. පූර්ව - මාක්ස්වාදී මනෝරාජික සමාජවාදීන් මෙන් ම රුසියාවේ නාරෝද්නික්වාදීන් ද පළල් අරුතින් මෙම වර්ගීකරණයට ඇතුලත් කර ගත හැක. නමුත් පූර්ව මාක්ස්වාදී මනෝරාජික සමාජවාදීන්ට සාධාරණය ඉටුකරනු පිණිස සඳහන් කළ යුතු කරුණක් වන්නේ ඔවුන්ගේ ව්‍යායාම කිසි සේත් ම වත්මන් 'විප්ලවවාදීන්ගේ' උත්සාහයන් මෙන් ප්‍රචණ්ඩ හා හානිකර ඒවා නොවූ බවයි.

කෙසේ වුවද මූලික වශයෙන් මාක්ස් මෙම ප්‍රවේශයට එකඟ වූයේ නැත. මාක්ස් පෙන්වා දුන්නේ සමාජවාදය සඳහා අවශ්‍ය කරන විභවයන් සමාජය තුලම තිබෙන බවයි. ධනේශ්වර ක්‍රමයේ මෝරා යාමත් සමග ඒ මගින් ම සමාජවාදය සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි නිර්මාණය වන බව මාක්ස් පැවසිය. 'ධනේශ්වර ක්‍රමයේ ගර්භාෂය තුළ වැඩෙන සමාජවාදී කලල බීජය' පිළිබඳ ව මාක්ස් කතා කළේ එබැවිනි. සමාජවාදය සඳහා පවතින විභවය වනාහි මෙම කලල බීජයයි. මෙම කලල බීජය අනෙකක් නොව ධනේශ්වර යුගයේදී පෙර නොවූ විරූ අයුරින් නිෂ්පාදන බලවේග සමාජයීයකරණය වී තිබීමයි. නමුත් නිෂ්පාදන බලවේගවල එම සමාජමය ස්වරූපයට ප්‍රතිපක්ෂව ඒවායේ අයිතිය පුද්ගලිකමය වී තිබීම ධනපති ක්‍රමයට ආවේණික හා එය බිඳ දැමීමට ඉහවල් වන මූලික ප්‍රතිවිරෝධය බව මාක්ස් පෙන්වා දුනි. මේ අර්ථයෙන් ගත් කල සමාජවාදය යන්න තවදුරටත්, මනෝරාජික සමාජවාදීන්, රුසියානු නාරෝද්නික් වාදීන්, අපේ වත්මන් රාජ්‍ය කේන්ද්‍රිය සමාජවාදීන් ආදීන් විශ්වාස කරන අන්දමට ආයාසයෙන් පමණක් මස්තකප්‍රාප්ත කරගත යුතු පරමාදර්ශයක් නොව ඓතිහාසික සංවර්ධනයේ තර්කනය මගින්ම නිර්ණය කරනු ලැබූ 'යථාර්ථයක්' වේ.

මෙහිදී 'ආයාසය' යන්න වදන් පැහැදිලි කළ යුතුය. ආයාසය නැතිනම් ලෙනින්ගේ වචන වලින් කියනවා නම් ස්වතෝබුද්ධ සාධකය වැදගත් නොවන බවක් මින් අදහස් නො කෙරේ. නමුත් ඇත්ත වශයෙන් ම මෙම ආයාසය එනම් සමාජ පරිවර්තනය සඳහා ගනු ලබන දැනුවත් ප්‍රයත්නය වනාහි කිසිසේත්ම සුළුතරයකගේ ආයාසයක් නොව මාක්ස්වාදී සම්ප්‍රදාය තුළ එය භාවිතා වන්නේ අවම වශයෙන් කම්කරු පංතියේ පාංතිමය ආයාසයක් ලෙසටයි.

සමාජවාදී සමාජ පරිවර්තනයක් පිළිබඳ අපේ සමාජයේ කෙරෙන බොහොමයක් සාකච්ඡාවන් තුළ මෙන්ම, අපගේ මෙම සාකච්ඡාවට ප්‍රස්තුත වන වසන්ත දිසානායක සහෝදරයාගේ කෘතිය තුළද දක්නට ලැබෙන සම්භාව්‍ය මාක්ස්වාදී ආස්ථානයට පටහැනි නිගමනයක් නම් සමාජ විපර්යාසය නැත්නම් සමාජවාදය ගොඩ නැගීම සමාජයට පිටතින් නැත් නම් සමාජයට ඉහළින් සිට කළ යුත්තක් බවයි. බොහෝ විට මෙහිදී සමාජය පිළිබඳව එළඹෙන නිගමනය වනාහි එය කිසිදු විභවයකින්, ශක්‍යතාවයකින් තොර ඒකකය යන්නයි. වසන්තගේ කෘතිය පුරා ම ද මෙම අදහස දිව යයි. එනම් සමාජය වෙනස් කළ යුත්තේ විප්ලවවාදීන් විසිනි. විප්ලවවාදීන් නායකත්වය දෙන 'නිර්ධන පංතික ආඥාදායකත්වය' නම් වූ රාජ්‍යයේ මෙහෙය වීමෙනි. එපමණක් නොව මෙම යෝජිත 'නිර්ධන පංතික ආඥාදායකත්වයේ' ක්‍රියාකාරීත්වය මගින් සමාජයේ ප්‍රගතිය හා මානව සංවර්ධනය සඳහා වූ සකලවිධ විභවතාවයන් විනාශ කර දැමීමට ද නොයෙක් ආකාරයෙන් සාධාරණීකරණය කෙරේ. (මෙම තත්වය පසුවට සාකච්ඡා වේ.)

මාක්ස්ට අනුව සමාජවාදය උදෙසා වූ විභවයන් පරිපූර්ණ වී නොමැති රටක, එනම් සමාජවාදය උදෙසා වූ පූර්ව කොන්දේසි නොමැති රටක "සමාජවාදය ජය ගත නොහැක. නමුත් වසන්ත මෙහිදී අපූරු න්‍යායික ප්‍රස්තුතගත කිරීමක් කරයි.

"එහෙත් ඒකාධිකාරී යුගය / අධිරාජ්‍යවාදයේ යුගය එළඹී විට රටවල් කීපයක නොව තනි රටක පවා සමාජවාදය ජය ගත හැකි තත්ත්වක් පැණ නැගිණ. (පිටුව 128)

වසන්ත මෙය ඉදිරිපත් කරන්නේ ලෙනින්ගේ නිගමනයක් පරිද්දෙනි. නමුත් ලෙනින්ගේ ඇතැම් කියුම් වියුක්ත ලෙස සන්දර්භයෙන් පිටතට ගෙන උපුටා දැක්වීමට දැඩි උනන්දුවක් දක්වන වසන්ත සහෝදරයා මේ අවස්ථාවේදී ලෙනින් උපුටා දක්වමින් තම නිගමනය තහවුරු කිරීමට උත්සාහ කළා නම් එය පාඨක අපට ඉමහත් ලෙස ප්‍රයෝජනවත් වීමට ඉඩ තිබුණි. මගේ දැනුමේ මට්ටමට නම් මාක්ස්ගේ මූලික ඉගැන්වීම් තුලින් හෝ ලෙනින්ගේ අදහස් තුලින් හෝ එවැනි නිගමනයකට එළඹීමට ඉඩකඩක් නැත. ස්ටාලින්ගේ හෝ මාඕගේ පිහිටෙන් නම් එවැනි නිගමන වලට එමට හැකියාව ලැබේ. නමුත් සමාජවාදී පරිවර්තනයේ ඓතිහාසික සාධාරණත්වය පිළිබඳ මාක්ස්වාදී ප්‍රස්තුතයන්ට එම නිගමනය අතිශයින් ම පටහැනිය.

ඇත්ත වශයෙන් ම ලෙනින්ගේ අදහස් වලින් එළඹිය හැකි එක් නිගමනයක් වන්නේ ඒකාධිකාරී ධනවාදී යුගය තුළ තනි තනි රටවල් වල සමාජවාදය ගොඩනැගිය හැකිය යන නිර්-මාක්ස්වාදී නිගමනය නොව වේ, අඩු දියුණු රටවල පවා කම්කරු පංතියට බලය අල්ලා ගැනීම සඳහා සුදුසු තත්ත්වයන් නිර්මාණය වී තිබෙන බවය. තනි රටක සමාජවාදය බිහි කළ හැකි බව ලෙනින් සිහිනෙන්වත් නොසිතූ බව ඔහුගේ ලියවිලි වලින් කදිමට ඔප්පු වේ. රාජ්‍ය බලය මාරුවීම පිළිබඳ ලෙනින්ගේ අදහස් වසන්ත විසින් තමන්ගේ මට්ටමට කපා ගෙන ඇති බවක් පෙනේ.

දෙවනුව දශක ගණනාවක ප්‍රායෝගික අත්දැකීම් මගින් ඔප්පුකරනු ලැබ ඇත්තේ මෙම රාජ්‍ය කේන්ද්‍රිය ඉදිරි දර්ශනයේ පවතින්නා වූ අසාර්ථකත්වයයි. රුසියානු විප්ලවයේ පටන් නිකරගුවානු විප්ලවය දක්වාම භාවිතයට දැමුනේ මෙම රාජ්‍ය කේන්ද්‍රිය ක්‍රියා මාර්ගය ඔස්සේ සමාජය තුළ සමාජවාදී පරිවර්තනයක් ඇති කිරීමට දරනු ලැබූ උත්සාහයයි. මේ සෑම රටක් ම සමාජවාදී විපර්යාසයන් සඳහා අත්‍යාවශ්‍ය වූ අවම කොන්දේසි හෝ සැපිරී නොතිබූ රටවල් විය. වෙනත් වචන වලින් කියනවා නම් එම රටවල සමාජවාදයේ කලල බීජය මෝරා ගොස් නොතිබුණි. මේ රටවල බලය අල්ලා ගත් සමාජවාදීන් උත්සාහ කළේ තමන් විසින් සමාජවාදය යයි වටහා ගනු ලැබූ ආකෘතිය බලහත්කාරයෙන් හෝ සමාජය

**ධනේශ්වර ක්‍රමයේ මෝරායාමත් සමගම ඒ මගින්ම සමාජවාදය සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසි නිර්මාණය වූ බව මාක්ස් පැවසිය. "ධනේශ්වර ක්‍රමයේ ගර්භාෂය තුළ වැඩෙන සමාජවාදී කලල බීජය" පිළිබඳව මාක්ස් කථා කෙළේ එබැවිණි.**

මත පැටවීමයි. පූර්ව - විප්ලවීය යුගයේ එම රටවලවල පැවැති තත්ත්වයට සාපේක්ෂව සමාජ ආර්ථික සංස්කෘතික ක්ෂේත්‍රයේ විශාල ජයග්‍රහණ එම රටවල 'සමාජවාදී' තන්ත්‍රයන් යටතේ අත්පත් කරගනු ලැබූ බව සැබෑවකි. ඊට අමතරව අත්පත් කරගනු ලැබූ සමහර ජයග්‍රහණයන්ගේ මානයන් ධනේශ්වර රටවලට වඩා බෙහෙවින්ම මානුෂීය වූ බවද සැබෑවකි. නමුත් එම ජයග්‍රහණ එක් නිශ්චිත මට්ටමකින් ඔබ්බට ගමන් කළේ නැත. එලෙස ගමන් නොකිරීමට හේතුව ලෙස වසන්ත දකින්නේ එම රටවල් 'සමාජවාදී' මාවතින් පිට පැනීමයි. සංශෝධනවාදීන් කුමන්ත්‍රණකාරයින්, ආදී සකලාකාර සමාජවාදයේ ද්‍රෝහීන් බලය අල්ලා ගැනීමයි. මගේ ප්‍රශ්නය මෙයයි. එම 'ද්‍රෝහී' උත්සාහයන්ට ප්‍රමාණවත් ප්‍රතිරෝධයක් දැක්වීමට හෝ සමත් විභවයන් සමාජය තුළ මෙකී සමාජවාදය යටතේ ගොඩ නොනැගුණේ ඇයි ? වසන්තගේ යථෝක්ත නිගමනය සාවද්‍ය වුවද, එවැනි විභවයන්ට බිහි වීමට හෝ එම රටවල සමාජවාදී පාලන තන්ත්‍රවල ඉඩකඩ තිබුණේ නැත.

ඇත්ත වශයෙන් ම එම තන්ත්‍රයන් බිඳ වැටීමට හේතුවූයේ ඒවා තුළ විසඳ ගැනීම නොහැකි පිට්ටමේ ආර්ථික අර්බුද හා දියුණු ධනේශ්වර රටවල දිනාගෙන ඇති තත්වයන්ට පවා නොදැනෙන ප්‍රමාණයේ ජනවාර්ගික ගැටළු, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටළුව ඉතා බරපතල ලෙස මතුවීම නිසායි. මෙම ගැටළු කාගෙවත් කුමන්ත්‍රණ නොවේ. ඒ සමාජ වල දක්නට ලැබුණු ඇත්ත ගැටළුය. 'සමාජවාදයෙන් පිට පැනීමට පෙර' ස්ටාලින්ගේ, මාඕගේ අවධියේ පවා මේ රටවල පැවැතියේ නිර්ධන පංතික ආඥාදායකත්වයක් නොව නිර්ධනපංතික ආඥාදායකත්වයේ නාමයෙන් වූ පක්ෂයේ නිලධර තන්ත්‍රයකගේ, කල්ලියකගේ හෝ පුද්ගලයන්ගේ ආඥාදායකත්වයකි. ආර්ථිකය පාලනය කිරීමත් සමාජය මෙහෙයවීමෙත් ආඥාදායක ස්වරූපයකට සිදුකෙරුණු අතර පංතීන් 'අහෝසිකිරීම' පවා රාජ්‍යයන්ත්‍රයේ මෙහෙයවීම පිට සිදුකෙරිණි. මේවා කොහේවත් සම්භාව්‍ය මාක්ස්වාදී ඉගැන්වීම් ආශ්‍රයෙන් සාධාරණීකරණය කළ නොහැකිය. අනෙක් අතට එවැනි ක්‍රියා මාර්ග අසාර්ථක වීමෙන් හා එම තන්ත්‍රයන් ඇදවැටීමෙන් අපට පැහැදිලි වන්නේ එම රාජ්‍ය කේන්ද්‍රීය ඉදිරි දර්ශනයේ පවත්නා නිෂ්ඵල භාවයයි.

සැබෑ එසේ වන කළ සමාජ විපර්යාසය පිළිබඳ ගැටළුව, සංවිධානය වූ පිරිසක් රාජ්‍ය බලය අල්ලා ගැනීම යන්නට වඩා බෙහෙවින්ම සංකීර්ණ වූ ක්‍රියාදාමයකි. එය සමාජය තුළම තිබෙන විප්ලවීය විභවයන් මතුකර ගනිමින් සිදුවන, සිදු කෙරෙන ස්වයං - විපර්යාසාත්මක ක්‍රියාවලියක් විනා බාහිරින් හෝ සමාජයට ඉහළින් සිට කෙරෙන ආඥාදායක

**මේ රටවල බලය අල්ලාගත් සමාජවාදීන් උත්සාහ කළේ තමන් විසින් සමාජවාදය යයි වටහා ගනු ලැබූ ආකෘතිය බලහත්කාරයෙන් හෝ සමාජය මත පැටවීමටයි.**

ක්‍රියාවලියක් නොවේ.

ඒ අතර ම වසන්ත සහෝදරයාගේ කෘතියේ මෙවැනි පාඨයක් ද අඩංගු වී තිබෙන බව අමතක කළ නො හැක.

'විප්ලවය යනු අතලොස්සකගේ ක්‍රියාවක් නොව එය ලක්ෂ ගණන්, දශලක්ෂ ගණන් ජනයා විශාල රටක නම් කෝටි ගණන් ජනයා සූරාකන පංතියේ අතලොස්සකට එරෙහිව කරන නැඟී සිටීමකි.' (පිටුව 146)

මෙම ප්‍රකාශය තුළ එක්තරා කාව්‍යාත්මක ස්වභාවයක් ගැබ්ව තිබුණද මින් වසන්ත සහෝදරයා කීමට උත්සාහ කරන්නේ විප්ලව යනු අතිවිශාල ජන සහභාගීත්වයකින් සිදුවන්නක් බවයි. මෙය සත්‍යයකි. අවුගණනේ එය එසේ විය යුතුය. ගැටළුව පවතින්නේ එහි නොව වසන්තගේ කෘතියේ සමස්ත තර්කනය තුළ විප්ලවය පිළිබඳ එවැනි ප්‍රජාතන්ත්‍රීය ඉදිරි දර්ශනයකට ඉඩකඩක් නොතිබීම ය. සමස්ත කෘතිය තුළම අඩංගු වන්නේ ජනයාගේ ප්‍රජාතන්ත්‍රීය විභවයන් ප්‍රතික්ෂේප කරන සහ සමහර විට එම ප්‍රජාතන්ත්‍රීය විභවයන් මරා දමන ඉදිරි දර්ශනයකි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව වසන්තගේ තක්සේරුව බලන විට අපට කිසිදු අපහසුවකින් තොරව එම නිගමනයට පැමිණිය හැක. මාක්ස්වාදී සම්ප්‍රදායේ ඉතාම වැදගත් මූලධර්මයක් වන ජනසහභාගී ප්‍රජාතන්ත්‍රවාදය ඔහු ඉතාම උපහාසාත්මක ලෙස බැහැර කරන්නේ මෙසේය.

'ජන අරගලය වියුක්ත පරමාදර්ශයක් වශයෙන් ඉතා අගනේ වුවද අද බොහෝ දෙනෙක් කථා කරන ජනසහභාගී ප්‍රජාතන්ත්‍රවාදය (අවධාරණය මගේය - ලිපියේ කර්තෘ) සඳහා කදිම නිදසුනක් ලෙස දැක්විය හැක්කක් වුවද, අද සහ තවත් දීර්ඝ කාලයකට එය යථාර්ථ ලෝකයේ මල් පළ දැරිය හැක්කක් නොවේ.' (පිටුව 86)

වසන්ත මේ කියන්නේ කුමක් ද?. ඔහුට අනුව ජනසහභාගී ප්‍රජාතන්ත්‍රවාදය යන්න 'අද බොහෝ දෙනෙක් කථා කරන දෙයක් පමණකි. එයට බොහෝ කලකට ලෝකයේ මල් පළ දැරිය හැකි නොවේ. මෙම නිගමනය අවසානයේ අප කැඳවා ගෙන යන්නේ කිනම් අන්තයකට ද? විප්ලවය සමාජවාදය ගොඩනැඟීම වැනිදෑ වසන්ත සහෝදරයාම පවසන පරිදි ලක්ෂ කෝටි ගණන් ජනයා සහභාගී වන ක්‍රියාවලියක් හරහා නොව අතලොස්සකගේ ආඥාදායකත්වය මගින් පමණක් සිදුකළ හැකි දෙය යන නිගමනයටයි.

පැහැදිලිව ම පෙනී යන කරුණක් නම් ස්ටාලින්වාදී සම්ප්‍රදාය තුළ දේශපාලන පුහුණුව ලබා ඇති වසන්ත දිසානායක සහෝදරයාට ප්‍රජාතන්ත්‍රවාදය නමැති සංකල්පය පිළිබඳ න්‍යායික අවබෝධයක් හෝ එහි ප්‍රායෝගික වටිනාකම පිළිබඳ අවබෝධයක් හෝ නොමැති වීමයි. එම නිසාම ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය අර්ථ විරහිත ලෙස උඩින් පල්ලෙන් පමණක් යොදා ගැනීමට ඔහු පෙළඹීම ස්වභාවික ය. අති ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස්වාදය, සුළු ප්‍රජාතන්ත්‍රවාදය, සුපිරි ප්‍රජාතන්ත්‍රවාදය වැනි යෙදුම් ඔහු නිතර නිතර භාවිතා කරයි. ඔහු ඒවා යොදන්නේ ද එක්තරා උපහාසයක් ගම්‍ය වන පරිදි ය. නමුත් එම යෙදුම් වල වාච්‍යාර්ථය ඉක්මවා පවතින සංකල්පීය වැදගත්කම පිළිබඳ ඔහුට අවබෝධයක් නොමැති බව කෘතිය තුළින් මනාව තහවුරු වේ.

වසන්ත වහල්හිමි ප්‍රජාතන්ත්‍රවාදය, වැඩවසම් යුගයේ රදළ ප්‍රජාතන්ත්‍රවාදය (පිටුව 184) වැනි දේ ගැන කථා කරයි. වහල් හිමි ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් සමහර විට වසන්ත අදහස් කරන්නේ සම්භාව්‍ය ග්‍රීක යුගයේ ඇතැන්ස් නගර රාජ්‍යයේ පැවැති 'ප්‍රජාතන්ත්‍රවාදී' පාලන ක්‍රමය ගැන විය යුතුය. එහිදී වසන්ත අමතක කරන කරුණ නම් එම ක්‍රමය සමස්ත වහල් නිෂ්පාදන මාදිලියට ආවේණික ඒ යුගය පුරා ම දක්නට ලැබුණු දෙයක් නො වන බවයි. එම 'ප්‍රජාතන්ත්‍රවාදය' ක්‍රියාත්මක වූයේ යම් යම් සීමිත ඓතිහාසික කොන්දේසි යටතේ සුළු කාල සීමාවක් තුළදීය. අනෙක් අතට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නූතන අර්ථකථනවලට අනුව එම ඇතැන්ස් 'ප්‍රජාතන්ත්‍රවාදය' මිනිය නොහැක. 'වැඩවසම් යුගයේ රදළ ප්‍රජාතන්ත්‍රවාදය' ගැන කථා කරන විට නම් වසන්ත සහෝදරයා වැටෙන්නේ ලොකු ම මුලාවක ය. එම යුගයේ, ඇතැන්ස් නගර රාජ්‍ය යුගයට සාපේක්ෂව හෝ සලකා බැලිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයක් නොවී ය. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය මෙලෙස සරලව හා අවිධිමත් ලෙස යොදා ගැනෙන්නේ වසන්ත එම සංකල්පය ගැඹුරින් වටහා ගෙන නොමැති නිසා ය. ප්‍රජාතන්ත්‍රවාදය මේ ආකාරයට පටු ලෙස අර්ථ කථනය කිරීමෙන් අවසානයේදී සිදුවන්නේ 'සමාජවාදයේ' නාමයෙන් එය ප්‍රායෝගික ලෙස භාවිතයට යෙදීම

ප්‍රතික්ෂේප වීමයි.

නමුත් වසන්ත දකිනවාට වඩා බොහෝවිටම පළල් වූ අර්ථ සම්භාරයක් ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය තුළ ගැබ් වී ඇත. එමගින් පළල් ලෙස කියැවෙන්නේ සෑම පුද්ගලයෙකුට ම තම සකල විධ ශක්‍යතාවයන් විභවයන් කිසිදු මර්ධනයකට, පීඩනයකට, වාරණයකට ලක් නොකොට එළි දැක්වීමට මුදුන් පමුණුවා ගැනීමට ඇති හැකියාවයි. මෙවැනි තත්ත්වයක් ඇති සමාජයක් අපට පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ලෙස නම් කල හැකිය.

ඇත්ත වශයෙන්ම මේ අර්ථයෙන් ගත්කළ යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිඳියාමට පෙර යුගයේ ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයක් සමාජය තුළ තිබුණේ නැත. මක් නිසාද, යත් ප්‍රජාතන්ත්‍රවාදය භාවිතයට දැමීමට පුද්ගලයා නිදහස් විය යුතු බැවිනි. වැඩවසම් ක්‍රමය තුළත් ඊට පෙර පැවැති නිෂ්පාදන මාදිලීන් තුළත් පුද්ගලයා මුළුමනින්ම බැඳ දමා තිබුණි. පුද්ගලයා නිදහස් වීම ආරම්භ වන්නේ යුරෝපයේ ධනේශ්වර විප්ලව පැතිරීමත් සමඟය.

වසන්ත සහෝදරයා ද අපද බොහෝ විට ප්‍රජාතන්ත්‍රවාදය යන වදනට මුලින් ධනේශ්වර වැනි විශේෂණ පද යොදයි. ඇත්ත වශයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදය යන පදයට මුලින් විශේෂණ පද දැමීමෙන් සිදුවන්නේ ප්‍රජාතන්ත්‍රවාදය යන්න සීමා වීමකි. වසන්ත සහෝදරයාගේ තර්කය වන්නේ පංති සමාජයන්හි තිබිය හැක්කේ පංතිත්ව සීමා වූ ප්‍රජාතන්ත්‍රවාදයක් පමණක් බවයි. එනම් ධනපති ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ඇත්තේ ධනපති පංතියටයි. නිර්ධන පංති යුගයේ නිර්ධන පංතියටයි. සැබැවින්ම එම නිගමනය නිරවද්‍යය නොවේ. ධනේශ්වර යුගයේ ප්‍රජාතන්ත්‍රවාදය භුක්ති විඳිය හැක්කේ ධනපති පංතියට පමණක් යැයි කීම මිථ්‍යාවකි. වසන්ත සහෝදරයාටත් මටත් අපගේ ලියකියවිලි කිරීමටත් යම් දුරකට ධනේශ්වර විරෝධී දේශපාලනයක් කිරීමටත් ඉඩකඩ තිබේ. එංගලන්තය, ප්‍රංශය, නෙදර්ලන්තය වැනි දියුණු ධනපති රටවල්වල නම් අපේ වැනි රටවල්වලට ද වඩා එම හැකියාව ඇත. මෙම හැකියාව මගින් ඔප්පු වන්නේ "අධිරාජ්‍යවාදී ධනපතියන් හොඳ ශිෂ්ට සම්පන්න මහත්වරුන්" බවවත් "ඔවුන් දැන් මානවවාදීන් වී" සිටින බවවත් නොවේ. (මෙම යෙදුම් වසන්ත යොදන්නේ උපහාසාත්මකවයි පිටු 116 - 117) මෙම රටවල් වල මේ අයිතිවාසිකම් පවතින්නේ ධනපති පංතියේ අනුග්‍රහය මත නොව තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා දැනුවත් ලෙස සංවිධානය වී සිටින සිවිල් සමාජයේ ශක්තිය මත ය.

මෙම නිගමනයෙන් අදහස් වන්නේ ධනපති ක්‍රමය තුලම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාව දැමීමට හැකියාව තිබෙනවා ය එසේ නැතහොත් අසමානත්වය ජනිත කරන්නාවූ නිෂ්පාදන සම්බන්ධතා ඊට බාධාකාරී නොවන්නේ ය යන්න ද? කිසිසේත් ම නැත. තත්ත්වය ඊට හාත්පසින් ම ප්‍රතිවිරෝධී ය. නිෂ්පාදන මාදිලියක් ලෙස ගත්කළ ධනේශ්වර ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයට සාකල්‍යයෙන්ම ප්‍රතිවිරුද්ධ වේ. ඒ මගින් ජනිත කෙරෙන ආර්ථික අසමානත්වය පූර්ණ ප්‍රජාතන්ත්‍රීය සමාජයක් බිහිකිරීමේ ලා බෙහෙවින් බාධාකාරී වේ. ධනේශ්වර නිෂ්පාදන මාදිලිය මත පවත්නා ප්‍රජාතන්ත්‍රවාදයේ භාවිතයට අප ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය යයි කියන්නේ එම ප්‍රජාතන්ත්‍රවාදය ධනපතීන්ට සීමාවී තිබෙන නිසා නොව පවත්නා නිෂ්පාදන සම්බන්ධතා ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයට බාධාකාරී ලෙස පිහිටා තිබෙන නිසා ය.

නමුත් වසන්ත උත්සුක වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය ම විප්ලවයට, සමාජවාදය ගොඩනැංවීමට මුළුමනින් ම ප්‍රතිපක්ෂ සංකල්පයක් ලෙස හඳුන්වා දීමටයි. ඔහු මෙසේ කියයි.

"අවසාන විප්ලවීය පක්ෂයක් ප්‍රජාතන්ත්‍රවාදයට පමණක් (අවධාරණය මගේය) සීමා වුවහොත් එය ක්‍රියාකාරීත්වයෙන් තොර සාකච්ඡා මණ්ඩපයක තත්වයට පත්වේ." (පිටුව 110) මින් පෙනෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නොසර්මිකව ම අකාර්යක්ෂමතාවය ජනිත කරවන දෙයක් ලෙස වසන්ත නිගමනය කරන බවයි. පුද්ගල නිදහස පිළිබඳ වසන්තගේ නිගමනය ද මෙබඳු ය.

"නිදහස යනු මෙහිදී පුරාතන අභාලෝප්තකයේ නිදහස සහතික කරන කුදු පුද්ගල නිදහස නොවේ. පුද්ගල නිදහසට ඉහලින් පවතින පොදු නිදහසයි. පුද්ගල නිදහසට ක්‍රියාත්මක විය හැක්කේ පොදු පළ ප්‍රයෝජන වලට යටත්වය. (පිටුව 146)

මෙම "පොදු නිදහස" "පොදු පළ ප්‍රයෝජන" යන දෑ අර්ථ කථනය වන්නේ කෙසේද? අපේ පූර්ව අත්දැකීම් නම් පොදු යහපත ආරක්ෂා කිරීම යන ලේබලය යටතේ පුද්ගල නිදහස කප්පාදු කර දැමූ සෑම අවස්ථාවක ම සිදුවී ඇත්තේ සමාජයට ඉහලින් සිට සමාජය මත ආධිපත්‍යය පතුරුවන අධිකාරී බලයක් විසින් පොදු යහපත යයි තමන් ම අර්ථකථනය කරන බල ව්‍යාපෘතියක් සමාජය මතට පටවනු ලැබීම බව යි. එසේ නොමැතිව සැබෑ ලෙස පොදු යහපත සාක්ෂාත් කිරීමට නම් සෑම පුද්ගලයෙකුට ම පුද්ගලිකවම තම තමන්ගේ අවශ්‍යතාවයන් ප්‍රකාශයට පත්කළ හැකි ප්‍රජාතන්ත්‍රීය පරිසරයක් තිබිය යුතුය. පොදු යහපත යන්න වඩාත් පළල් ලෙස අර්ථකථනය කළ හැකි වන්නේ එවන් තත්ත්වයකදී පමණි. එම නතු යටතේ පුද්ගල නිදහස නැති තැන පොදුයහපත සාක්ෂාත් කිරීම යන්න නිකම් ම ගිකම් හිස් දෙයක් පමණක් වීම වැළැක්විය නො හැක. ඒවැනි තත්ත්වයක් මගින් පාර කැපෙන්නේ අධිකාරවාදී, ආඥාදායක ප්‍රවණතාවයන්ට පමණි.

කෙසේ වුවද වසන්තගේ කෘතිය තුළම ප්‍රජාතන්ත්‍රීය දිශාවක් කරා වර්ධනය කළ හැකි යම් යම් විභවයන් මතුවනු පෙනේ. නමුත් කණගාටුවට කරුණක් නම් සමස්ත කෘතියට ම එසේත් නැතිනම් වසන්තගේ සමස්ත තර්කනයට ම අදාල බරපතල ඌනතාවයන් නිසා එම විභවයන් ඉතා කණගාටුදායක ලෙස මරා දැමීමයි. කෘතිය තුළ මෙවැනි කියුම් දක්නට ලැබේ.

"නිර්ධන පංති පක්ෂයක් සර්ව නිර්දෝෂී නො වේ. එය වැරදි කරනු ඇත. එහෙයින් ඒ තුළ වැරදි නිවැරදි කර ගැනීමේ ක්‍රමයක් ක්‍රියාවට නැංවීම අත්‍යාවශ්‍යය. එබඳු ක්‍රමයක් නොමැත්තේ නම් පක්ෂය එක්තරා නිලධාරීවාදය කරා පිරිහෙනවා ඇත. නැත්තම් ඉක්මණින්ම විනාශ වී යනවා ඇත." (පිටුව 151)

තවත් කියුමක් මෙසේය.

"ජනතාව උදාසීනමත් ලෙස සමාජවාදය ගොඩ නැඟීමේ කර්තව්‍යයට දායක කර ගන්නේ නැත්නම් ප්‍රතිඵලය වන්නේ ධනවාදය ප්‍රතිස්ථාපනය වීමයි. (පිටුව 166 - 167)

මෙම කියුම් තුළ "නිර්ධන පංති පක්ෂය" "සමාජවාදය ගොඩ නැඟීම" වැනි දෑ සමාජයට පිටතින් පවතින ඈය යන නිගමනය ගැබ් වී තිබුණ ද සමාජවාදී ව්‍යාපෘතිය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම පිළිබඳ යම් විභවයක් ඒ තුළ ගැබ්වී තිබේ.

32 වෙනි පිටුවට

**පැහැදිලිව පෙනෙන්නේ ස්ටාලින්වාදී සම්ප්‍රදාය තුළ දේශපාලන පුහුණුව ලබා ඇති වසන්ත සහෝදරයාට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය පිළිබඳව න්‍යායික අවබෝධයක් හෝ එහි ප්‍රායෝගික වටිනාකම පිළිබඳ අවබෝධයක් නොමැති බවයි.**

## 16 වෙනි පිටුවෙන්

ඇතුළුව 4000 ට වඩා වැඩි සෑම ගිණුමක්ම සඳහා 1.2 අනුපාතයක්ද නියම කිරීමයි. ජර්මන් ප්‍රජාතන්ත්‍රික සමූහාණ්ඩුව, 1990 ඔක්තෝබර් මාසයේදී ජර්මන් ෆෙඩරල් ජනරජයත් සමඟ "එක්වීමත්" සමඟ වෙනම ජාතික රාජ්‍යයක් ලෙස එහි පැවැත්මද අවසන් විය.

1991 ජනවාරි 31 සිට අප්‍රේල් 5 වනදා දක්වාත් නැවත වතාවක් ජූලි මාසයේ සති දෙකක කාලය තුළත් මා සංචාරය කළ නැගෙනහිර ජර්මනිය 1988 - 1989 කාලයේ මා දුටු ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට වඩා බෙහෙවින් වෙනස් එකක් විය. නැගෙනහිර ජර්මනිය දිගටම ප්‍රතිවිරෝධතාවයන්ගෙන් හා වේදනාත්මක සිදුවීම් වලින් ගහනව පවතියි. සාධනීය පැත්තෙන් බලන කල නැගෙනහිර ජර්මන් වැසියන්ට තවදුරටත් ඔවුන් පිළිකුල් කළ රාජ්‍ය ආරක්ෂක පොලිසියේ නිරන්තර පරීක්ෂාවට බිය වීමට අවශ්‍ය නැත. ඔවුනට දැන් තමන්ද කොටසක් වන බටහිර ජර්මනියට නිදහසේ ආ ගිය හැකිය. අතේ මුදල් තිබේ නම් ධනවාදය යටතේ ලැබෙන ද්‍රව්‍යමය සම්පත් අත්පත් කරගැනීමේ හැකියාවද ඔවුනට අද ඇත. නිෂේධාත්මක පැත්තෙන් බලන කළ ජර්මනි දෙකේ දේශපාලන ඒකාබද්ධතාවයේ යථාර්ථයන්ට මුහුණ පෑමට සිදුවීම නිසා නැගෙනහිර ජර්මානු වැසියන් මුහුණ දෙන්නේ වැසියන් බරපතළ අනාරක්ෂිත භාවයකටය. පැරණි ජර්මන් ප්‍රජාතන්ත්‍රීය සමූහාණ්ඩුවේ රාජ්‍ය දේපළ පරිපාලනය භාරව සිටින රාජ්‍ය ඒජන්සිය ආර්ථික ව්‍යවසායන් විශාල සංඛ්‍යාවක් වසා දැමූ නිසා බොහෝ නැගෙනහිර ජර්මන් වැසියන්ගේ රැකියා "එක්කෝ" දැනටමත් අහිමි වී ඇත. නැත්නම් අද හෙටම රැකියා අහිමි වීමේ අනතුරට මුහුණ පා සිටිති. ඊටත් අමතරව රැකියාවන්හි නියුතු නැගෙනහිර ජර්මන් වැසියන් මුහුණ දෙන ප්‍රශ්නය නම්, ජීවන වියදම, ඔවුන් ලබන වැටුප් වර්ධනයන්ට වඩා වේගයෙන් ඉහළ යාමයි. නොයෙක් පැති වලින් බලන විට පැහැදිලිවම පෙනෙන දෙය නම්, නැගෙනහිර ජර්මනිය බටහිර ජර්මන් ප්‍රාග්ධනයේ අර්ධ විජිතයක් බවට වේගයෙන් පත්වෙමින් තිබෙන බව සහ දශක ගණනාවක් යන තුරුම දිළිඳුතම ජර්මනිය ලෙස පවතින බවය.

## 10 වෙනි පිටුවෙන්

බලවේග යනුවෙන් කොටස් තුනක් හඳුනාගැනීමට පුළුවන් කම තිබුණා. නමුත් දැන් මෙම මැද බලවේග විසිරීමකට ලක් තිබෙන අතර, දකුණ ශක්තිමත් වෙලා නැහැ. ඊට හේතු වී ඇත්තේ ආණ්ඩුවට අයත් එනම් එක්සත් ජාතික පක්ෂයට අයත් නායකත්වය යටතේ ඇති වෘත්තීය සමිති මගින් නායකත්වය යටතට බද්ධ කරගැනීමේ හැකියාව තවමත් ඒ. ජා. පයේ සමිති තුලින් සම්පූර්ණයෙන් ම ක්ෂය වී ගොස් නොතිබීම යි. කෙසේ වුවද මෙම තත්ත්වය මේ අයුරින්ම දිගටම පැවතීමට පුළුවන් කමක් නැත. තමන් නියෝජනය කරන කම්කරු පන්තියට ජාතික සේවක සංගමය මගින් ලබා දී ඇත්තේ මොනවාදැයි සොයා බැලුවහොත් පෙනී යන්නේ එසේ කිසිවක් ලබා දී නොමැති බවයි. මේ නිසා කම්කරු පන්තිය තවදුරටත් තමන්ගේ නායකත්වය යටතේ රඳවා තබා ගැනීමට ජාතික සේවක සංගමය අසමත් වනු ඇත. මෙවන් නායකත්වයක් යටතේ වාමාංශික පක්ෂ වලට අයත් වෘත්තීය සමිති කරා කම්කරු පන්තිය ඇදීයාම වැලැක්වීම නො හැකියි.

මේ අතර ලංකාවේ වමේ පක්ෂ වලට සිදුවී ඇති තවත් ඇබැද්දියක් නම් සිය අරගලය ඉදිරියට ගෙන යාම සඳහා තරුණ නායක පරපුරක් තමන්ට අහිමි වී තිබීමයි. වික්‍රමසිංහ, ඇන්. ඇම්., පිලිප් යන අය පළමුවැනි පරම්පරාවේ අය ලෙස සැලකුවහොත් එමෙන් ම පීටර්, ඔස්මන් ජයරත්න, වැනි අය දෙවන පරම්පරාවේ අය ලෙස සැලකුවහොත් ඒ ආකාරයේ තුන්වන පරම්පරාවක් ගැන කතා කිරීමට නො හැකියි. සතර වැනි පරම්පරාවක් සිටින මුත් දෙවන හා සතරවන පරම්පරාවේ එකමුතුවක් මගින් මෙම කාර්‍ය කිරීමට අපහසුයි.

තෙවන පරම්පරාවේ නායකත්වය පැරණි වාමාංශික පක්ෂ වලින් ගිලිහුනේ 1960 ගණන් වලදී ඇති වූ න්‍යායික භේදයන් හේතු වෙනුයි චීන සෝවියට් මත භේදය මෙන්ම සභාග දේශපාලනය ද මෙම න්‍යායික මතභේදයන් ඇති වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වුනා. 1980 පමණ වන විට නායකත්වය ගැනීමට සිටි තෙවන පරම්පරාවේ පිරිස් මේ නිසා ප්‍රධාන පක්ෂ තුලින් එලියට විසි වුනා. 1980 පමණ වන විට මෙම පිරිස්වලට වසර 15 ක පමණ දේශපාලන පරිචයක් උරුම වන අතර මොවුන් ඉතාම ලාබාල නොවුන ද තරුණ නායකත්වයකි. එම නිසා නවීන හා වර්තමාන තත්ත්වයන්ට ගැලපෙන ආකාරයේ ක්‍රියා කිරීමේ හැකියාව ද මොවුන් සතුව පවතිනවා.

මෙම තත්වයන් යටතේ ඉදිරි කාලය තුල දකුණ වශයෙන් ධනේශ්වර පක්ෂ වඩ වඩා පැහැදිලි වන්නේ යැයි බලාපොරොත්තු විය හැක. නමුත් ධනේශ්වර පංති මත ඔවුන්ගේ ආධිපත්‍ය ගිලිහී යන්නේ යැයි මින් අදහස් කිරීමක් නොකැරේ. එමෙන්ම වාමාංශික පක්ෂ වලට ද ශක්තිමත්ව ගොනු වීමට ඇති ඉඩකඩ විශාලය. එනමුත් ජනවාර්ගික ප්‍රශ්නය විසින් ඇති කරනු ලැබ ඇති ප්‍රතිඵලයන් වමේ වර්ධනයට නියත ලෙසම බලපාන බව කිව යුතුය. වාමාංශික පක්ෂ සැමදා ම උත්සාහ කරන්නේ පංති වශයෙන් කතා කිරීමටයි. නමුත් ජනවාර්ගික ගැටුම ඉහල මට්ටමකට වර්ධනය වී ඇති මෙවන් සමයක ස්වභාවිකව ම පංති විඥාණය අඩු වීමක් සිදුවෙයි. එසේ පංති විඥාණය අඩු වී ගොස් ජනවාර්ගික විඥාණය පෙරට ඒම නිසා පංතීන් පිළිබඳව කථා කරන වාමාංශික පක්ෂ කරදරයකට පත් වෙනවා. තතු මෙසේ හෙයින් ජනවාර්ගික ප්‍රශ්ණයට සාමකාමී ප්‍රජාතාන්ත්‍රීය විසඳුමක් ලැබීම වම දකුණු වශයෙන් පිල් බෙදීම සඳහා වඩාත් පහසු වාතාවරණයක් ඇති කරවයි.

## 5 වෙනි පිටුවෙන්

බාධකයක් වන්නේ යථෝක්ත ජාතික කේන්ද්‍රීය ඉදිරි දර්ශනයයි. එම ජාතික කේන්ද්‍රීය ඉදිරි දර්ශනය සකල සංස්කෘතික උරුමයන් පටු ජාතික රාමුවක් තුළ සිරකර තැබීමට වෑයම් කරයි. නිශ්චිතව කථා කළ විට මෙම ජාතික කේන්ද්‍රීය ඉදිරි දර්ශන. අපගේ සාහිත්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට ඉතා බරපතල ලෙස බාධාකාරී වී තිබේ.

ස්වාධීන සාහිත්‍ය උළෙල මෙම පටු ජාතික කේන්ද්‍රීය වාදය ප්‍රතික්ෂේප කිරීමට සමත් ඉදිරි දැක්මකින් යුක්ත වීම ගැන අපි සතුටු වෙමු. ලබනවර එහි ධජය මත "රාජ්‍යකේන්ද්‍රීය සාහිත්‍ය උළෙල වලට විකල්පව "ස්වාධීන සාහිත්‍ය උළෙලක්" යනුවෙන් පමණක් නොව සාහිත්‍ය ජාතිකවාදී කොටු පවුරු තුළ සිර කිරීමට එරෙහි ජාත්‍යන්තරවාදී මානවවාදී උළෙලක් යනුවෙන්ද ලියැවෙනු ඇතැයි ද අපි ප්‍රාර්ථනා කරමු.

24 වෙනි පිටුවෙන්

හිතුවොත් අපි ජීවත් වෙන 'මේ මොහොත' අර විකාරය එක්ක කොච්චර විටිමත් විදිහට සම්බන්ධ වෙලා ද කියල අපිට පිනේවි.

ඔන්න අපි යනවා සොක්‍රටීස් බලන්න. බලන්නු. යන්න ඉස්සර වෙලා අපි සොක්‍රටීස් බලල ඉවරයි. මොකද සොක්‍රටීස් බලන්න ඉස්සෙල්ලා අපිට සංජානනයක් දීල ඉවරයි. සොක්‍රටීස් හඳුනු සුනන්ද ව අපි අඳුනනව. එයා වෙන කවුරුවත් වගේ නෙවි එයා වගේමයි. රොයිස්ටන්ගේ නාට්‍යයේ පුටුවක් පෙරළනත් එය නාට්‍යීය වරදක් ලෙසද දකින අපි සුනන්දගේ නාට්‍යයේ නළුවෙක් දෙබස් වැරැද්දුවොත් ඒක . ' නළුවන්ගේ වැරැද්ද මිස සුනන්දගේ වැරැද්ද නෙවි කියල අපට පේනව. මෙන්න මේ පෙනීමට මං කියනවා මිනිස් සම්බන්ධතා සිවිල් බලරටාවන්ට අනුව හිතන්න පුරුදු වෙච්චි හිතක පුරුද්ද කියල. ඒ කියන්නේ අපේ සිවිල් චින්තනය අපේ ජීවිත තුළ සුනන්දව විශාල කරනව රොයිස්ටන් ව කුඩා කරනව. සුනන්දව වටහා ගන්න චින්තනය අපි තුළ මානුෂිකයි: සමාජයීය වශයෙන් සිවිල් කේන්ද්‍රීයයි. එයින් අදහස් වෙන්නේ සුනන්ද ගැන වුණත් සමාජයීය සිතුවිල්ල සිවිල් මිසක් මානුෂික නැහැ. මෙතැන දී සුනන්දත් ගොදුරක්, අපිත් ගොදුරු.

දැන් රොයිස්ටන් ගැන හිතමු. නාට්‍යය ඉවර වුණාම ඔහුට පේනවා තමං අවට සමාජය තමන්ට සලකන්නේ හරිම අමානුෂික විදිහට කියල. මේ සමාජයේ ජීවත්වීම තුලින් තමං ලබා ගත් සමාජ දැනුම අනිත් අය සමඟ බෙදා හදා ගන්න ඔහු නිපදවන ආකෘතිය තමයි 'රණහල' කියන නාට්‍යය. මෙන්න ඒ නාට්‍යය බලල ඔහු උසස් කියල මේ සමාජයේ හිතපු මිනිස්සු කියනව ඔබකට්ට කොපි කරල කියල. මෙතන දී රොයිස්ටන් විසඹින්න වෙනවා. හොකළ වරදක් ඔහුට බාරගන්න කියල සමාජය බල කර සිටිනව. මේ ගැටුමේ අවසාන ප්‍රතිඵලය හැටියට රොයිස්ටන් පිළිගන්නව තමන්ගේ නාට්‍යය කොරුවෙ බෙකට් කියල. සිවිල් චින්තනය විසින් අලුත් සංවේදනා මරා දාන සංවේදී දේශපාලනය ඔන්න ඕකයි.

හැබැයි මෙහෙම වේවි. රොයිස්ටන් වටපිට බලලා තරක දෙයක් ඉගෙන ගනීවි. ඒ තමයි අනේ මමත් කවදාහරි සුනන්ද වුණොත්. ඒ හින්ද ලංකාවේ දී කලාව කියන විශ්වය තුළ සිද්ධ වෙන්නේ 'තියෙන දෙය' නැවත විවිධ ආකාරයෙන් 'තියෙන දෙය' බවට පරිවර්තනය වීමයි. ඒ හින්ද අද ලංකාවේ පවතින කලාවට මං විරුද්ධයි. මගේ ස්ථාවරය කලා විරෝධය. මෙම කලා විරෝධය පෙන්වීමට කලා කෘති නිෂ්පාදනය කරනවනම් අන්න ඒ කලාවට එකඟයි. ඒ මොකද 'ඒ කලාව' අද 'මේ මොහොත' ගැන කියන සහ වෙනස් කරන නිසා.

30 වෙනි පිටුවෙන්

නමුත් එම විකල්පයන්ට ප්‍රදර්ශිත වීමේ අවකාශ වසන්තගේ සමස්ත ව්‍යාපෘතිය තුළ ඇත්තේ නැත. 'නිර්ධන පංතික පක්ෂ' වල 'වැරදි නිවැරදි කිරීමට' නම් ඒවා අභ්‍යන්තරයෙන් ම ප්‍රජාතන්ත්‍රීකරණය කළ යුතුය. අප දැක ඇති පරිදි 'නිර්ධන පංතික පක්ෂ' වල සිදුවී ඇති බොහෝ 'වැරදි' සිදුවී ඇත්තේ ඒවා යම් යම් පවු බල කණ්ඩායම්වල අතකොළු බවට පත්වීම නිසා ය. එම තත්වය නැති කිරීමට නම් එම පක්ෂ පවු බල කණ්ඩායම් වල අතකොළු බවට පත්කර ගැනීමට නොහැකි වන පරිදි ශක්තිමත් ප්‍රජාතන්ත්‍රීය සම්ප්‍රදායන් ප්‍රජාතන්ත්‍රීය යාන්ත්‍රණයන් ඒවා තුළ ස්ථාපිත කළ යුතුය. නමුත් සමස්ත කෘතිය පුරා ම වසන්ත සහෝදරයා විරුද්ධ වන්නේ ද එයටමයි.

අනෙක් අතට 'සමාජය ගොඩනැංවීමට ජනතාව දායක කර ගැනීම' යන්නම වැරදි ප්‍රස්තුතගත කිරීමකි. සමාජවාදය ගොඩනැංවීම යනු සමාජය තුලම සිදුවිය යුතු දෙයක් විනා ජනතාව ද දායක කර ගෙන 'කවුරුන් හෝ ගැලවුම් කාරයින් පිරිසක්' විසින් කරනු ලබන මෙහෙවරක් නො වේ. කෙසේ වුවද වසන්ත සහෝදරයා මේ පාඨයෙන් අදහස් කරන්නේ මා අදහස් කරන දෙයම නම් ජන සහභාගී ප්‍රජාතන්ත්‍රවාදය විනා ඊට ඉවහල් වන අන් ක්‍රියාමාර්ගයක් නැත. නමුත් වසන්තට අනුව 'ජන සහභාගී ප්‍රජාතන්ත්‍රවාදය දීර්ඝ කලකට යථාර්ථ ලෝකයේ මල්පළ දැරිය හැකි දෙයක් නොවේ.' (පිටුව 55) කතු එසේ වන කල්හි 'ජනතාව දායක කර ගන්නේ කෙසේද? එය නිකම්ම හිස් වදනක් වනවා නොවේ ද? අනෙක් අතට වසන්ත ම කියන්නේ 'සමාජවාදය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමක් හා මානව හිතවාදී කිරීමක් ගැන කථා කිරීම ජෝක්කාරයක් බවට පත්වූ' (පිටුව 167) කාලයක් තිබූ බවයි. ඇත්ත වශයෙන් 'ම එලෙස කථා කිරීම ජෝක්කාරයක් ද? නැත. එය අද සමාජවාදී ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය අංගයකි.

කණගාටුවට කරුණ නම් එවැනි ව්‍යායාමක් සඳහා වන අවකාශ අධිෂ්ඨානයක් වසන්තගේ කෘතිය තුළ ගැබ් නො වීමයි. ඇත්ත වශයෙන්ම මේ කෘතිය තුළ මෙරට සමාජවාදී ව්‍යාපාරයට නැවත ගොඩ ඒමට ඉවහල් වන්නා වූ ඉදිරි දර්ශනයක අංශුමාත්‍රයක් හෝ ගැබ් වී නොතිබීම කණගාටුවට කරුණකි. මගේ අවසාන නිගමනය නම් මෙම කෘතිය වනාහි ගැටළුවේ ම එක් පැතිකඩක් විදහා පාන්නක් විනා එයට විසඳුමක් යෝජනා කරන්නක් නො වන බවයි. ඒ තුළ මතු වන ගැටළු හෝ ප්‍රමාණවත් ලෙස සාකච්ඡාවට ගැනීමට අපේ රටේ සමාජවාදී ව්‍යාපාරය ඉදිරිපත් වන්නේ නම් වසන්ත සහෝදරයාගේ අවංක වෑයම ඒ අර්ථයෙන් හෝ ප්‍රයෝජනවත් එකක් වනු ඇත.

11 වෙනි පිටුවෙන්

සංවිධානය කළ දේශපාලන පක්ෂ වල පරිහානිය මෙන්ම අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියේ පරිහානියද සංකේතවත් කරයි. එම කන්නලව්ව සහ ශාප කිරීමේ රංගෝපාංගයෙන් පිදුවූයේ එම මව්වරුන් ඉතා පටු සහ තාවකාලික දේශපාලන ක්‍රියා මාර්ගයක උපකරණ බවට පත්කිරීම පමණි. එම මව්වරුන්ගේ බොහෝ දෙනා පුද්ගලිකව සහ තනි තනිවම කන්නලව් සහ ශාප කිරීම් කරනවා විය හැකිය. ඇත්තටම එවැනි අභිචාරයන් අපේ රටේ සංස්කෘතියේ පුද්ගලික තලයේ තවමත් පවතී. එහෙත් දැන් ඒවා දේශපාලන තලයට ගෙන එනු ලැබ ඇත.

දේශපාලන අභිචාරයන් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලියට ප්‍රතිශෝධාත්මකව සේවය කරන දේශපාලන භාවිතාවකි. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය තුළ සාමාන්‍යයෙන් ජනතාව මෙහෙයවනු ලබන්නේ ජනතාව වෙතට බලය ලැබෙන පරිදිය (to empower the people) ජනතාව සහභාගී වන දේශපාලන සංවිධාන ගොඩනැගීමේ අර්ථයක් එයයි. එහෙත් ජනතාවගේ ඇත්ත ප්‍රශ්න වලට විසඳුම් සොයා පිහිය යක්ෂ, භූත, හා දේවාත්මයන්ගේ පිහිට ගැනීමට සංවිධානය කරනු ලැබූ ජන කොටස් මෙහෙයවීම එම ජනතාව තුළ ඇති දේශපාලන විශ්වාසය හා ශක්‍යතාවය නිශේධ කිරීමට හේතු වන්නකි. එය ලංවන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට නොව අවසානයේදී ෆැසිස්ට්වාදී දේශපාලන භාවිතයන්ටය. ප්‍රජාතන්ත්‍රවාදී උපාය මාර්ග තුළ ජනතාව සංවිධානය කර ඔවුන් බලයම්පන්න කෙරේ. ෆැසිස්ට්වාදය තුළ ජනතාව සංවිධානය කර ඔවුන් නිර් - බල කරනු ලැබේ.

දේශපාලන අභිචාරවිධිවල තවත් ගැටළුවක් නම්, ඒවා විසින් දේශපාලන ප්‍රශ්න හා ක්‍රියාදාමයන් අත්‍යන්තයෙන්ම පුද්ගලවාදී කරනු ලැබීමයි. නැතහොත් දේශපාලන ප්‍රශ්න සහ ක්‍රියාදාමයන්ට පුද්ගල - කේන්ද්‍රීයව ප්‍රතිචාර දැක්වීමයි. දේශපාලන ගැටළු පුද්ගලයන් කේන්ද්‍ර කොට ගෙන විග්‍රහ කිරීම ලංකාවේ දේශපාලන විවාදයේ දැනට පවත්නා එක් අව ලක්ෂණයක්ද වෙයි. උදාහරණයක් වශයෙන් ජනාධිපති ප්‍රේමදාස මහතාගේ ප්‍රතිරූපය මේ විවාදය තුළ ඉදිරිපත් වන්නේ එක්කෝ සියලු යහගුණ ධර්ම වල පරම ප්‍රතිමූර්තිය හැටියටය. එසේ නැතිනම් සියලු දුර්ගුණ වල ප්‍රතිමූර්තිය හැටියටය. ඒ සම්බන්ධ දේශපාලන පුවත්පත්වල මෙන්ම, මහජනයා අතරට බහුලව එන කැලෑපත්තරවලද කෙරෙන්නේ දේශපාලනය අර හෝ මේ පුද්ගලයාගේ පුද්ගලික චරිතය, වයස, ස්ත්‍රී - පුරුෂ භාවය, කුලය, ලිංගික චර්යාව ආදිය ආශ්‍රයෙන් විග්‍රහ කිරීමයි. දේශපාලන විවාදයේ ඇති මෙම පරිහානිය දේශපාලනයට අභිචාරවිධීන් ඇද ගැනීම සමග සමාන්තරව දිවෙන්නකි.

මුද්‍රණය: ප්‍රෙස්ලින්ක්, අංක 155, පන්නිපිටිය පාර, තලවතුගොඩ, තලවතුගොඩ.